

# බාලාවතාර සුගණ්ඨිසාරය.



# බාලාවතාර සුගණ්ඨිසාරය.

පුරාතන වෛයාකරණ නෛයායිකාචාය්‍ය්‍යවරයෙක් විසින්
විරචිතයි.

විද්‍යෝදය පිරිවෙණේ උපාචාය්‍ය්‍ය
**කහාවේ රතනසාර සාමින්නාන්සේ**
වි සි න්
ලේඛකාදිදෝෂ සඤ්ජාත අශුද්ධපාඨ ශොධනයෙන්
**සංස්කාරණලදී.**

විද්‍යෝදයපිරිවෙණේ උපප්‍රධානාචාය්‍ය්‍ය
**මහගොඩ ඤාණෙශ්වර ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ**
විසින් අවගාහන ශුද්ධිපත්‍රාවලෝකනයෙන්
**පිළිගන්නාලදී.**

**ඇන්. ජේ. කූරේ සහ ඩබ්ලිව්. එච්. හෙමානිස් යන**
දෙදෙනා විසින්

මැල්ලම්පිටියේ විද්‍යාසාගර යන්ත්‍රාලයේ
මුද්‍රණය කරවනලදී.

**1905**

# Balavatara Suganthisara.

Compiled by
An ancient Grammarian and Phylologist.

Revised by
THE REVD: K. RATANASARA
*An assistant Teacher of the Vidyodaya Collet*

Approved by
**Very Revd: M. JNANESWARA**
Vice Principal of the
*Vidyodaya College, Colombo.*

Printed by
**N. J, Cooray** and **W. H. Themanis.**

PRINTED AT THE
**VIDYASAGARA PRESS**
*Wellampitiya.*

1906.

# සංඥාපනය

බාලාවතාර ශුගණ්ඩසාර නම්වූ මේ ග්‍රන්ථය වනාහි අසවල් කාලයෙහි අසවල් නම් ඇත්තහු විසින් කරණලද්දේයයි පරම්පරා කථාදියකින් හෝ පොතපතින් හෝ අපට අසන්ට දකින්ට නොලැබුනේය, එහෙත් මෙය මාගධව්‍යාකරණාර්ණවාවතරණයෙහි මහෝපකාරීවූ බාලාවතාරාභිධාන ප්‍රශස්ත ව්‍යාකරණයෙහි හා තදසනනන්‍යග්‍රන්ථයන්හිද මහත් පටුත්වයක් ඇති මහෝත්තමයෙක් විසින් කරණලද්දක්බැව්, තත්ප්‍රතිපාදිත පදසිද්ධි වර්ණනාදියෙන්ම මොනවට වැටහේ, මෙහි බොහෝතන්හි සංස්කෘත පොත්වලින් නිදිදිෂට උපදේශද විද්‍යමානවේ, මේවූකලි බාලාවතාරයෙහි විද්‍යමාන බොහෝ ග්‍රන්ථිස්ථාන ලිහිල්කොට අරුත් බිණීමෙන් හා මූලගයෙහි පදවිභාග ක්‍රියාසම්බන්ධ චොදනාපරිහාරාදී නානාවිධ ව්‍යාකරණවිධි දක්වා විස්තරකිරීමෙන්ද, සන්ධියෙහි මුලපටන් කෘදන්තාවශානය දක්වා ආධුනිකයන්ට සුඛාවබොධපරිද්දෙන් වැඩිවිස්තර හැර ඒ ඒ තන්හි ඉතාමත් උවමනා සූත්‍රපමණක් දක්වා පදසිද්ධි කිරීමෙන්ද, නාමඛණ්ඩයෙහි ඒ ඒ ශබ්දවල පදමාලායෙදීමෙන්ද මොනවට සරසා තිබේ. නුමුත් මෙහි කාරකය සම්බන්ධ වර්ණනාදියක් නොමැත්තේය, ඒ පදසිද්ධි පරමාභ්‍යාසයෙන් කරණලද්දක් බැව්යයි හගිමු.

තවද බොහෝ ටිකතැනක සඟවාගෙණ තුබුන මේපොත බාලාවතාරය ඉගෙණගන්නවුන්ට පහසුසේ පදසිද්ධි ග්‍රන්ථිස්ථානාදිය දැනගැණීමට මහෝපකාර බැවින් මුද්‍රණයකරවා ප්‍රසිද්ධකිරීම යොග්‍යයයි කීපදෙනෙකුගේ අයදුමෙන් උක්තානුක්ත හෙදයෙහිද බොහෝ තැන් ආධුනිකයන්ට දූරවබොධබැවින් සුවසේ, දතහැකිපරිද්දෙන් ලුහුඬින් භාවකථාමාත්‍රයක් ලියා ඇතුළත්කොට විද්‍යොදයපරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ ධර්මාන්තෙවාසීවූද, ගණේගම විහාරාධිපති වේරගොඩ සොණුත්තර ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූද, විද්‍යොදයපිරිවෙණෙහි උපාචාර්‍ය්‍ය කහාවේ රතනසාර නමැති මාවිසින් ලෙඛකභ්‍රමාදීන් සජාත දොෂනිරාකරණයෙන් සංශොධනය කරණලදී.

මාගේ ආචාර්‍ය්‍යතතම කෙනෙක්වූ විද්‍යොදය පිරිවෙණේ උපප්‍රධානභූත මහගොඩ ඤාණෙශ්වර ස්ථවිරස්වාමිපාදයන්වහන්සේ විසින් අවශාන සිද්ධිපත්‍රාව ලොකනයෙන් පිළිගන්නාලදී.

තවද මෙහි 1 පිටේ 19 පෙලේ "පාචාථ" යන්න "පමාථ" කියාද, 3 පිටේ 7 පෙලේ "කාදනන" යනු "සමාසානන" කියාදා 5 පිටේ 7 පෙලේ "අකාරව" යනු "ආකාරව" කියාද, 35 පිටේ 21 පෙලේ "එවං" යන්න "චවං" කියාද, 48 පිටේ 1 පෙලේ "රුක්ඛ" යන්න "රූප" කියාද, 72 පිටේ 2 පෙලේ "ප්‍රත්‍යයෝව" යන්න "ප්‍රත්‍යයව" කියාද, 73 පිටේ 16 පෙලේ "මනානුසහිත" යන්න "නානුසහිත" කියාද, 76 පිටේ 16 පෙලේ "තෙසංණොලොපංච" යන්න "තෙසංණොලොපං" කියාද, 79 පිටේ 28 පෙලේ "කර්තෘකරණාදීවූ" යන්න "කර්තෘකර්මාදීවූ" කියාද වියයුතුයි, මෙබඳු තවත් සංදෘෂ්‍යස්ථාන විද්‍යමාන වෙතත් ඉන් ආධුනිකයන්ගේ අවබෝධයට බාධානොවන බැවින් මෙහි ශුද්ධපත්‍රයක් ඇතුළත් කිරීමට අදහස් නොකෙළෙමු, මේ බලන කියන සකල භවතුන්විසින් මෙකී නොකී අනුහුදුන්දෙසින්වූ සදොස් තැන් නිදොස්කොට ප්‍රයොජන ගතයුතුයි.

මිට.

K. Ratanasara.

විද්‍යොදය පිරිවෙණේ උපාචාය්‍ය **කහාවේ රතනසාර** ස්වාමින් වහන්සේලවා ශුද්ධකරවාගෙණ මෙහිපහත නම් සඳහන්කරණ අපදෙදෙනා විසින් මුද්‍රණයකරවණලද මේපොත නැවත මුද්‍රණයකරවිමේ අයිතිවාසිකමද අපදෙදෙනාටම බැවි සියලුදෙනාවිසින් සැලකිය යුතුයි.

N. J. Cooray.
W. H Temanis.

# බාලාවතාර සුගණ්ඨිසාරය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

**බුද්ධං නිරුත්තිරතනාකරපාරයාතං**
**නත්වා පරත්ථහිතවිත්ත විධානචිත්තං**
**බාලාවතාරවිදිතස්ස සුගණ්ඨිසාරං**
**සත්ථන්ති සන්තහිතකාමමහං ලිඛෙය්‍යං.**

ශ්‍රීඝන සකලශාසනසංරක්ෂණයෙහි දක්ෂවිචක්ෂණගුණ නිර්ගිවාගීගානුවර්ත්තික පරාර්ථකාමී මධ්‍යස්ථ ගම්භීරාචාර්‍ය්‍ය ලක්ෂණ ලය ශබ්දශාස්ත්‍රාචාර්‍ය්‍යවූ ආචාර්‍ය්‍යොත්තමයන් විසින්"බාලාවතාර"භිධාන ප්‍රකරණාරම්භයෙහි ප්‍රාරබ්ධප්‍රකරණවිඝ්නපරිසමාප්ති ශ්‍රොත්‍රුජනනමස්කාරපූර්‍වමප්‍රතිපත්තින් අනන්‍යාරොද්ගුහණධාරණ නයාශය සංසිද්ධි හිතාර්ථාන්විත සංශුද්ධබව්‍යවහාර නිරුක්තිශාස්ත්‍රසංග්‍රහකාරප්‍රකාශොක්ත ශාස්ත්‍රාරම්භප්‍රතික්ෂෙප ජනයාගේ මතිනිවෘත්ති ශ්‍රොත්‍රුජනතාදර ශාස්ත්‍රප්‍රවෙශොත්සාහජනනප්‍රකෘතිසජ්ජනාකීර්ණ විශිෂ්ට ඉෂ්ටදෙවතාප්‍රණාමශාස්ත්‍රාභිධානාභිධෙයකර්ණප්‍රකාර ප්‍රයොජනය යන පාචාර්ථප්‍රකාශය පිණිස ෂට්පඤ්චාශදුත්තර විශත්විස්තරප්‍රමාණවෘත්ති යුක්තානුෂ්ටුභයෙහි එක විංශතිත්‍රිනවතිපඤ්චෛකාගිති ප්‍රභූත, චතුස්ථානයෙක්හි සජාත අසමගණ වර්ණමාත්‍රා විශ්‍රාමකවිඝන චතුෂ්කයක් උදුරා ගැණීමෙන් පදසබ්දකොට පථ්‍යාවක්ත්‍රවෘත්තින් කරණලද "බුද්ධං තිධාභිවන්දිත්වා" යනාදී ප්‍රථම ගාථාවෙහි පටන් සමුදවයව සංඛ්‍යාත විප්‍රකාරාර්ථයන් අතුරෙන් බොහෝසේ සමුදායාර්ථය අප්‍රකාශකොට ග්‍රන්ථස්ථාන සංඛ්‍යාත අප්‍රකාශ අවයවාර්ථ මාත්‍රයක් දක්වනුලැබේ.

**"බුද්ධම්බුජවිලොචනං** බුද්ධං **තිධා අභිවන්දිත්වා** බාලානං බුද්ධිවු**ද්ධියා බාලාවතාරං භාසිස්සං**"යි විභත්‍යන්තපදවිභාගවශයෙන් මේ ගාථාතොමෝ අෂ්ටපදිකාවක්වූ. මේ අෂ්ටපදයෙන් "බුද්ධං තිධාභිවන්දිත්වා බුද්ධම්බුජවිලොචනං" යන්නෙන් ඉෂ්ටදෙවතා ප්‍රණාමය සඞ්ගෘහීතයි, "බාලාවතාරං" යන්නෙන් අභිධානාභිධෙය සඞ්ගෘහීතය, "භාසිස්සං" යන්නෙන් කාරප්‍රකාර සඞ්ගෘහීතය, "බාලානං බුද්ධිවුද්ධියා" යන්නෙන් ප්‍රයොජන සඞ්ගෘහීතයි, මෙහි "බුද්ධං" යනු "අභිවන්දිත්වා"

යන පදයෙහි අනභිහිතකර්මයි, "තිධා" යනු "අභිවන්දිත්වා" යන පදයෙහි විශෙෂණයි "අභිවන්දිත්වා" යනු "භාසිස්සං" යන පදයෙහි පූර්වකාල ක්‍රියායි; "බුද්ධම්බුජවිලොචනං" යනු "බුද්ධං" යන පදයෙහි විශෙෂණයි, "බාලාවතාරං" යනු "භාසිස්සං" යන පදයෙහි අනභිහිත නිර්වෘත්ති කර්මයි, "භාසිස්සං" යනු අර්ථවශයෙන් ආධ්‍යාහාරකළ "අහං" යන පදයෙහි කර්තෘවාචී අපර කාලක්‍රියායි. ක්‍රියාව දක්වා කාරකය නොදක්වනු කිමයත්? ක්‍රියොක්තකල්හි කාරකොක්තවේ, කාරකොක්තකල්හි ක්‍රියොක්තවේයයි දක්වන්නාහු.

"වුත්තෙන ච කාරකෙනෙව ක්‍රියාඛ්‍යානතො පරිගතො
ක්‍රියායචාපි වුත්තාය කාරකාඛ්‍යාතිකං මතං"යි කීහු.

"බාලානං"යනු "බුද්ධිවුද්ධියා"යන පදයෙහි සම්බන්ධය "බුද්ධිවුද්ධියා" යනු "භාසිස්සං" යන පදයෙහි තාදර්ථ්‍යසම්ප්‍රදානයි,

භාසිස්සං, කො භාසිස්සති? අහං භාසිස්සං, කිං භාසිස්සසි? බාලාවතාරං භාසිස්සං, කිමත්ථාය භාසිස්සසි? බුද්ධිවුද්ධියා භාසිස්සං, කෙසං බුද්ධිවුද්ධියා භාසිස්සසි? බාලානං බුද්ධිවුද්ධියා භාසිස්සං, කිං කත්වා භාසිස්සසි? අභිවන්දිත්වා භාසිස්සං, කතිප්පකාරෙහි අභිවන්දිත්වා භාසිස්සසි? තිධා අභිවන්දිත්වා භාසිස්සං, කිං තිධා අභිවන්දිත්වා භාසිස්සසි? බුද්ධං තිධා අභිවන්දිත්වා භාසිස්සං, කිං භූතං බුද්ධං තිධා අභිවන්දිත්වා භාසිස්සසි? බුද්ධම්බුජවිලොචනං බුද්ධං තිධා අභිවන්දිත්වා භාසිස්සං,

"බුද්ධං" යනු අකාරාන්ත පුංලිඞ්ග ද්විතීයෛකවචන කෘදන්තනාමික පදයි, "තිධා" යනු නිෂ්පන්න නිපාතපදයි, "අභිවන්දිත්වා" යනුද නිෂ්පන්න නිපාතපදයි, "බුද්ධම්බුජ විලොචනං" යනු අකාරාන්ත පුංලිඞ්ග ද්විතීයෛකවචන සමාසාන්තනාමිකපදයි–සමාසය වනාහි විසිතුරු පදයන්ගේ සංක්ෂෙපවශයෙන් එකවිධවෙයි, අර්ථසමාස පදසමාසවශයෙන් ද්විවිධවෙයි, ලුත්තාලුත්තවශයෙන්ද ද්විවිධවෙයි, ආදි මධ්‍යොත්තරපද ලොපවශයෙන් ත්‍රිවිධවෙයි, පූර්වපරොභයඅන්‍යපදාර්ථ ප්‍රධානවශයෙන් චතුර්විධවේ, අව්‍යයීභාව කර්මධාරය දිගු තත්පුරුෂ බහුව්‍රීහි ද්වන්ද්වයයි ස්වකීය නාමවශයෙන් ෂඩ්විධවේ; ඒ ෂට්සමාසයෙන්, අව්‍යයීභාවසමාසය ද්විවිධවේ, කර්මධාරය සමාසය නවවිධවේ, දිගු සමාසය ද්විවිධවේ, තත්පුරුෂ සමාසය ෂඩ්විධවේ, ද්වන්ද්වසමාසය චතුර්විධවේ, බහුව්‍රීහිසමාසය නවවිධවෙයි, මෙසේ ෂට්සමාසය දෙතිසක් ප්‍රභෙදවේ, *

---

* තාෂ් තප්පුරිසා සත්ත ජබ්බිධො කම්මධාරයො
ජබ්බිධො ච බහුබ්බීහි දිගුරෙව ද්විධා මතො
චන්දො චතුබ්බිධො අබ්‍යයීභාවො ද්විධා මතො"යි
සමහරනන්හි සමාසය ද්වාත්‍රිංශත්ප්‍රභෙදයයි කියනලදී.

මෙයින් "බුඩම්බුජවිලොචනං" යනු නවභිධවූ අන්‍යපදාර්ථප්‍රධානබහුව්‍රීහි සමාසයෙහි තද්ගුණසංවිඥාන උපමානපූර්වපදයි, මේ උපමානපූර්වපදය "උපමාන උපමෙය උපමා උපමාජොතක"යයි චතුර්විධ විශෙෂයෙක්වේ, එයින් "බුඩම්බුජානි"යනු උපමානය. "විලොචනානි" යනු උපමෙයය, උපමාන උපමෙයවූ අම්බුජ විලොචන දෙදෙනාගේ සදෘශභාවය උපමාය "විය"යනු උපමාජොතකයි. "බාලාවතාරං"යනු අකාරාන්ත පුංලිඟ විතීයාඑකවචනකෘදන්තනාමිකපදය. "භාසිස්සං" යනු භවිෂ්‍යත් ආත්මනෙපද උත්තමපුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත පදය. "බාලානං" යනු අකාරාන්තපුංලිඟ ෂෂ්ඨී බහුවචන කෘදන්තනාමිකපදය. "බුඩිවුඩියා" යනු ඉකාරාන්ත ස්ත්‍රීලිඟ චතුර්ථී එකවචන සමාසාන්තනාමික පදය, මෙයින් "බුඩං" යනු නාමාඛ්‍යාතොපසර්ග නිපාතසංඛ්‍යාතචතුර්විධපදයන් අතුරෙන් නාමපදය. මෙහි නාමයද, "නාමනාමය සබ්බනාමය සමාසන්තනාමය තඩිතන්තනාමය කිතකන්තනාම"යයි පංචප්‍රකාරවේ. එකවචනාදිවශයෙන් අටලොස් ප්‍රකාරයෙක්වෙයි, පුල්ලිඟාදිවශයෙන් ත්‍රි ප්‍රකාරවෙයි, කර්මකාරකාදිවශයෙන් ෂට්ප්‍රකාරවේ; එයින් කර්මකාරකය දශවිධවේ, කර්තෘකාරකය පචවිධවේ, කරණකාරකය ද්විවිධවේ, සම්ප්‍රදානකාරකය ත්‍රිවිධවෙයි, අපාදානකාරකය පචවිධවෙයි, ආධාරකාරකය චතුර්විධවෙයි; මෙසේ ෂට්කාරකය භෙදවශයෙන් එකුන්තිස් ප්‍රභෙදයෙක්වෙයි. මේ එකුන්තිස් ප්‍රභෙදවූ කර්මකාරකාදි ෂට්කාරකයන් අතුරෙන් "බුඩං" යනු කර්මකාරකයි; හෙද "නිර්‍ව්‍ාති විකෘති ප්‍රාප්ති ඉච්ඡිත අනිච්ඡිත ඉච්ඡිතානිච්ඡිත කථිත අකථිත අභිහිත අනභිහිත කර්මය"යි දශප්‍රකාරවෙයි. එයින් "බුඩං" යනු ප්‍රාප්තිකර්මයි, ඒ ප්‍රාප්තිකර්මයද දෘෂ්ටප්‍රාප්තිකර්මය අනුමාන ප්‍රාප්තිකර්මයයි ද්විප්‍රකාරවේ, එයින් මෙය අනුමාන ප්‍රාප්තිකර්මයි. හෙද "අභිහිත අනභිහිත කර්මය"යි ද්විප්‍රකාරවෙයි, එයින් මේ අනභිහිතකර්මයි, යලිදු "බුඩං"යනු "ස්වාර්ථය ද්‍රව්‍යය ලිඟය සංඛ්‍යාය කර්මාදිකාරකයයි පචාර්ථයෙක් වේ. "බුඩං"යන පදය ස්වාර්ථ වශයෙන් නාමය, ද්‍රව්‍යවශයෙන් රූපය, ලිඬගවශයෙන් පුරුෂය, සඞ්ඛ්‍යාවශයෙන් එකෙක, කාරකවශයෙන් කර්මය, "බුඩං" යනු ස්වාර්ථය "බුඩ" යනු ද්‍රව්‍යය, "බුඬො" යනු ලිඟයි "බුඬො"යනු සංඛ්‍යාද වේ "බුඩං" යනු කර්මයි-මත්තෙහිදු මෙම නයින් අර්ථවර්ණනාක්‍රමය තත්තත් ශබ්දානුරූපයෙන් මෙලෙසයයි දතයුතු.

## සලිඳු වැකිහු කර ණුලැබෙන්.

සබ්බෙ සඞ්ඛතාසඞ්ඛතධම්මෙ අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සතීති වා බුඬො, තං බුඩං; තීහි විභාගෙහි තිධා "අභිවන්දියවා" යනු පූර්වක්‍රියායි, අබුජ්ඣිංසූති බුඩානි, අම්බුම්හි ජාතානි අම්බුජානි, බුඩානි ච තානි අම්බුජානි චාති=බුඩම්බුජානි; විලොචෙන්ති එතෙහීති විලොචනානි, බුඩ

ම්බුජානි විය විලොචනානි යස්ස සො=බුද්ධම්බුජවිලොචනො, තං බුද්ධම්බුජවිලොචනං; බලන්ති අස්සාසපස්සාසමත්තෙන ජීවන්තීති බාලා, අත්තත්ථපරත්ථසංඛාතෙ වෙ අත්ථෙ ලුණන්ති ඡින්දන්තීතිවා බාලා, අප්පනානත්ථපරානත්ථ සංඛාතෙ වෙ අනත්ථෙ ලාසන්ති ගණ්හන්තීතිවා බාලා; අවතරන්ති සත්ථමනෙනාති අවතාරො, බාලානං අවතාරො= බාලාවතාරො, තං "බාලාවතාරං." "භාසිස්සං" යනු අපරකාලක්‍රියායි. බුජ්ඣිතං බුද්ධි, වඩ්ඪනං වුද්ධි, බුද්ධියා වුද්ධි බුද්ධිවුද්ධි, (තෙසං බාලානං) තදත්ථාය බුද්ධිවුද්ධියා "අනුක්තස්‍යාවශ්‍යමධ්‍යාහරණමධ්‍යාහාරඃ" යනු හෙයින් "අහං" යනු භාෂණක්‍රියාවට කර්තෘපදයක්. එද "සත්ථං" යනුද අධ්‍යාහාරයි, මත්තෙහිදු මෙසේ මැයි.

### මෙතැන් පටන් මේ ගයෙහි පදසිද්ධිය දක්වනුලැබේ.

"සම්බුද්ධ සංඛතාසංඛතධම්මෙ අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්සති" යන වාක්‍යයෙහි "බුධඤාණෙ" යන ධාතු "බුධ"යි සිටී, ඔහට "භුවාදයො ධාතවො"යි ධාතුසංඥාව අනෙකස්වරවූ ධාතුවන්තයට "ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස"යි ලොප්ව "ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා"යි නොයෙක් ප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි වක්තෘවිවක්ෂා වශයෙන් "බුධගමාදිත්ථෙ කත්තරි"යි ත ප්‍රත්‍යයව "ධඪභහෙහි ධඪා ච"යි තකාරයට ධකාරව "හචතුත්ථානමන්තානං දො ධෙ"යි පූර්වධකාරයට දකාරව "පච්චයාදනිට්ඨා නිපාතනා සිජ්ඣන්ති"යි දකාර ධකාරයෙහිසංහිතව කිතකප්‍රත්‍යයාන්තය නමා අලිඞ්ගහෙයින් "තද්ධිත සමාසකිතකා නාමංවාතවෙතූනාදිසු ච"යි නාමයමෙන් කලකල්හි "ජිනවචනයුත්තං හි" යනු වැටෙන්නෙහි "ලිඞ්ගඤ්ච නිපච්චතෙ"යි ජිනවචනානුකූලව ප්‍රකෘතිය බුද්ධ යනුව ලිඞ්ගසංඥාව ඔහු කෙරෙන්පරව විභක්ති සංඥා කාරණලද ස්‍යාදීන්ගේ ප්‍රථමාවිතීයාදීන් අනියමෙන් පත්තෙහි වක්තෘවිවක්ෂාවශයෙන් "කත්තා ච විභත්තියො"යි විතීයා එකවචනසංඥිත අං විභත්ති "කම්මත්ථෙ දුතියා"යි කර්මාර්ථයෙහිව "සරලොපො"දීන් පූර්වස්වරයට ලොප්ව පරස්වරයට අසමානවර්ණපත්තෙහි ප්‍රතිෂෙධව "න ෙස පරංයුත්තෙ"යි පූර්වහල්හුරු එහි පැමිණ විනාත්‍යනාහෙයින් "පර සමඤ්ඤාපයොගෙ"යි පදසංඥාව "බුද්ධං" යනු වේ. "තීහි විභාගෙහි" යන වාක්‍යයෙහි ත්‍රිශබ්දයා කෙරෙන් "විභාගෙ ධා ච"යි ධා ප්‍රත්‍යයව වාක්‍යය අප්‍රයොගව විභක්ති ලොප්ව නාමවත්ව පසුව ඉන්පරව විභක්තිව ඊට "සබ්බාසමාවුසො"යනාදීන් ලොප්ව තිධා යනුවේ. අභියනු පූර්වකොට ඇති "වදි අභිවාදනෙ" යන ධාතු "වන්ද"යි සිටී, ධාතු සංඥාව ලොප්ව ඔහු කෙරෙන් පරව "පුබ්බකාලෙකකත්තුකානං තුනත්වානත්වා වා"යි ත්වා ප්‍රත්‍යයව ත්වාප්‍රත්‍යයා පරකල්හි ධාතුහු කෙරෙන් පරව "යථාගමමිකාරො"යි ඉකාරාගමව පැමිණ "අභිවන්දිත්වා" යනුවේ, "අබුජ්ඣිංසු" යන වාක්‍යයෙහි "බුධවිකසනෙ" යන ධාතු බුධ යි සිටී, ඔහට ධාතු

සංඥව අනන්තය ලොප්ව "බුධගමාදිත්ථෙ, කත්තරි"යි තප්‍රත්‍යයව ධකා
රාන්ත හෙයින් "ධඪභහෙහි ධඪා ච"යි තකාරයට ධකාරව "හචතුත්ථා
නමන්තානං දෙ ඩෙ"යි ධකාරයට දකාරව පෙර කියනලද සූත්‍රයෙන්
සංහිතව යොව "අතො නිච්චං"යි නිව "යොසු කතනිකාරලොපෙසු
දීඝං"යි පූර්වයට දීඝව බුධානි යනුවේ. අම්බුශබ්දයාන්තකරෙන් සම්ංභව
මහිව ජන යන ධාතුහු කෙරෙන් "අතීතෙ තතවන්තුතාවී"යි තප්‍රත්‍ය
යව "ජනාදීනමා තිම්හි ච"යි නකාරයට අකාරව ලොප්ව පැමිණි අලි
ඞ්ගහෙයින් නාම්වත්ව යොහට "අතොනිච්චං"යි නියනාදෙසව "යොසු
කතනිකාරලොපෙසු දීඝං"යි දීඝව සිඩවූ "අම්බුමහි ජාතානි" යන
වාක්‍යයෙහි "අම්බු" යනු උපපදකොට ඇති "ජනජනනෙ" යන
ධාතු ජන සිසිරී, ඔහු කෙරෙන් පරව "ක්විච"යි ක්විප්‍රත්‍යයව ක්විප්‍රත්‍යයා
පරකල්හි ධාත්වන්තයහට "ධාත්වන්තස්ස ලොපො ක්විම්හි"යි ලොප්ව
ක්විප්‍රත්‍යයහට "ක්විලොපො ච"යි ලොප්ව නාම්වත්ව විබතට ලොප්ව
"අම්බුජ"යනුව ලිඞ්ගසංඥව යොව යොහට නිව දීඝව "අම්බුජානි" යනු
වේ. "විලොචෙනානි එතෙහි" යනවාක්‍යයෙහි විපූර්වවූ "ලොචදස්ස
නෙ" යන ධාතු "ලොච"යි සිටී, ඕහට ධාතු සංඥව අන්තයට ලොප්ව
"සබ්බතො ණ්වුත්වාවීවා"යි අප්‍රත්‍යයව පැමිණ කිතක ප්‍රත්‍යයා නාමා
අලිඞ්ගහෙයින් නාම්වත්ව අංව පැමිණ "විලොචනං" යනුවේ, "බලනාති
අස්සාසපස්සාසමනෙනාන ජීවන්ති" යන වාක්‍යයෙහි බලපාණනෙ
යන ධාතු "බල"යි සිටී, ධාතුසංඥව ලොප්ව "ධාතුයා කම්මාදිම්හි
ණො"යි. ණප්‍රත්‍යයව ප්‍රත්‍යය සම්බන්ධිවූ ණහට ලොප්ව අකාරශෙෂව
කාරිතප්‍රත්‍යයා පරකල්හි "අසංයොගන්තස්ස වුද්ධි ,කාරිතෙ"යි වෘද්ධි
වෙයි, වන්නෙහිද "අයුවණ්ණානං චායො වුද්ධි"යි පූර්වයට වෘද්ධිව, නාම්
වත්ව යොහට "ආව බාලා" යනුවේ. "අවතරන්ති සත්තමනෙන"
යන වාක්‍යයෙහි අවපූර්වවූ "තරතරණෙ" යන ධාතු තරයි සිටී, ඕහට
ධාතුසංඥව ලොප්ව ණව අකාරශෙෂව පූර්වවෘද්ධිව නාම්වත්ව ද්විතියා
අංව "බාල" යන්න හා සමසිතව "බාලාවතාරං" යනුවේ. "භා
සිස්සං" යන තන්හි "භාසවියත්තායංවාචායං" යන ධාතුහට ධාතු
සංඥව අන්තයට ලොප්ව ඔහු කෙරෙන් පරව "අනාගතෙ භවිස්ස
න්ති"යි භවිෂ්‍යත් ආත්මනෙපද උත්තමපුරුෂ එකවචන "ස්සං" විභ
ක්තිව ධාතුහු කෙරෙන් පරව "ඉකාරාගමො අසබ්බධාතුකම්හි"යි
ඉකාරාගමව "භාසිස්සං" යනුවේ, "බාලානං" යනතන්හි පෙරමෙන්
සිඩ "බාල" යන්නෙන් සාමිව "බාලානං" යනුවේ. "බුජ්ඣිතං" යන
වාක්‍යයෙහි "බුධඤාණෙ" යන ධාතු බුධයි සිටී, ඕහට ධාතු සංඥව
ලොප්ව තප්‍රත්‍යයව තහට ධකාරව ධහට දකාරව සංහිතව පැමිණ
"බුද්ධි" යනුවේ. "වඩ්ඪනං" යන වාක්‍යයෙහි "වුධු වුද්ධිම්හි" යන ධාතු

**වුඩුයි සිටී. මෙසේම සිඩව සව "පතොයා"යි යාව "වුඩියා" යනුවේ.** මෙතෙකින් "බුඩං"යනාදි මේගාථාහි පදසිද්ධිය සමාප්තයි. තදනන්තරව එහි ක්‍රියාකාරක පදසම්බන්ධය දක්වනුලැබේ.

**"බුඩං අභිවන්දිත්වා බාලාවතාරං භාසිස්සං,"** යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි-බුඩං, සර්වඥයා;අභිවන්දිත්වා, වැඳ; බාලාවතාරං, බාලාවතාර නම්වූ මේ ප්‍රකරණය; භාසිස්සං, කියමි.

**"කෙන විසිට්ඨං බුඩං කෙන පකාරෙන අභිවන්දිත්වා කිමත්ථං බාලාවතාරං * භාසිස්සති"** යනු මෙහි චොදනාපදසම්බන්ධයි,-කෙන විසිට්ඨං බුඩං, කුමකින් විශිෂ්ටවූ සර්වඥයා; කෙන පකාරෙන අභිවන්දිත්වා, කවර ප්‍රකාරයකින් වැඳ; කිමත්ථං, කුමක් පිණිස;බාලාවතාරං, බාලාවතාර නම්වූ ප්‍රකරණය; භාසිස්සති, කියයිදයත්? **"බුඩම්බුජවිලොචනං බුඩං තිධා අභිවන්දිත්වා බාලානං බුඩිවුඩියා බාලාවතාරං භාසිස්සං,** යනමේ පරිහාරය සමග අර්ථපද සම්බන්ධයි.

බුඩ, ප්‍රබුඩවූ, අම්බුජ, නීලොත්පලදලහා සදෘශවූ, විලොචනං, විශිෂ්ටවූ නෙත්‍රවන්දයක් ඇති; බුඩං, (භූතභවිෂ්‍යද් වර්ත්තමානාඛ්‍යාත කාලත්‍රයවර්ත්තිවූ සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශරහිතව ස්වයම්භූඥානයෙන් දැන සත්‍යාවබොධය කළාවූ) සර්වඥයා; තිධා, තුන් පරිද්දෙකින්; හෙවත් කාය වාඩ්මනඃසඛ්‍යාතචාරත්‍රයෙන්; අභිවන්දිත්වා, (භය ලොභ කුලාචාර විනා භක්තිප්‍රෙමාතිභාරූවනතොත්තමාඞ්ගයෙන්) මනාකොට වැඳ;බාලානං,(අවිදිත ශබ්දශාස්ත්‍ර ස්වරූපඇති අව්‍යුත්පන්න) බාලයන්ගේ; බුඩිවුඩියා, ඥානාභිවෘඩිය පිණිස; බාලාවතාරං, (යථොක්තවූ බාලජනයන්ගේ ශබ්දශාස්ත්‍රාවතරණයට අත්‍යන්තොපකාරි හෙයින්)බාලාවතාර නම්වූ ප්‍රකරණය; භාසිස්සං, කියමි. හෙවත් විස්තර මධ්‍යමය හැර සංක්‍ෂෙපයෙන් කියමි.

**"අක්ඛරාපාදයො එකචත්තාළීසං"** යනු මෙහි ආදි සූත්‍රයි.

> **"සඤ්ඤා ච පරිභාසා ච විධි නියමමෙව ච**
> **පටිසෙධාධිකාරො ච ඡබ්බිධං සුත්තලක්ඛණං"**යි.

සංඥාදිවිළිවෙළින් සවැප්‍රකාරවේ, මෙහි සංඥාසූත්‍රනම්,

> **"විභත්තිබ්‍යඤ්ජනා වග්ග නිග්ගහීතක්ඛරා**
> **රස්සාදිඝොසාඝොසා ච සුත්තසඤ්ඤා විපඤ්චධා"**යි

දක්වනලද දශප්‍රකාරවූ සංඥාසූත්‍රයන් අතුරෙන් "අක්ඛරාපාදයො එකචත්තාළීසං" යනු අක්‍ෂර සංඥාවිධානසූත්‍රයි, මේආදී සූත්‍රයන්ට.

---

* භාසිස්සති.

"ආරම්භෙ වචනං ප්‍රාපතිලිඞ්ගණං යොගලක්ඛණං
වාක්‍යං සුත්තව යථාන්‍යාසං ඤාතානාමභිධායකා"ති.

පරියායනම්වෙත්.–මේ සූත්‍රයවනාහි විභත්‍යන්ත පදවිභාගවශයෙන් "අක්ඛරා, අපි, ආදයො, එකචත්තාලීසං"යි· චතුෂ්පදයෙක්වේ හෙද.

"පදං චතුබ්බිධං වුත්තං නාමාඛ්‍යාතොපසග්ගජං
නිපාතඤ්ච තඤ්ඤූහි අසෙසාබලවගිධාවති"යි

නාමාදිවශයෙන් චතුෂ්පදයෙක්වේ, එයින් "අක්ඛරා" යනු ප්‍රථමා බහුවචනාන්ත නාමික පදය, "අපි" යනු උපසර්ග පදය, "ආදයො" යනු ප්‍රථමා බහුවචනාන්ත නාමික පදය, "එකචත්තාලීසං" යනු ප්‍රථමා එකවචනාන්ත නාමික පදය, මෙහි "අක්ඛරා" යන පදයෙන් සංඥා නිර්දේශ සන්දර්ශිතයි, මෙහි අකාරය,

"පටිසෙධවුඩ්ඪිභාවෙ අඤ්ඤත්ථෙ සදිසෙපි ච
විරුද්ධෙ ගරහෙ සුඤ්ඤෙ අකාරො විරහප්පකෙ"ති.

දසඅරුතුවෙක හෙන්නේය, මෙතැන්හි "අව්‍යාකතා ධම්මා" යනාදි තන්හි මෙන් අන්‍යාර්ථයෙහි වැටේ, "අපි"යන පදයෙන් යථොක්තයන්ගේ අපෙක්ෂා නිර්දේශ සන්දර්ශිතයි. හෙද

"සම්භාවනෙ ච ගරහාපෙක්ඛාසු ච සමුච්චයෙ
පඤ්හෙ සංවරණෙ චෙව ආසංසායෙ අපි ඉති"ති,

සත්අර්ථයෙක පැණේ, "ආදයො" යන පදයෙන් සංඥිනිර්දේශ සන්දර්ශිතයි. හෙද

"මරියාදායං ප්‍රකාරෙච සමීපාවයවෙ තථා
චතුර්ෂ්වර්ථේෂු මෙධාවී ආදිශබ්දන්තු ලක්ඛයෙ"ති.

සතර අරුතුවෙක දන්නේයි. "එකචත්තාලීසං" යන විශේෂණ නිර්දේශයෙන් සඞ්ඛ්‍යාසන්දර්ශිතයි, මේ "එකචත්තාලීසං" ග්‍රහණයෙන්

"අධිකක්ඛරවචනානි එකතාලීසතො ඉතො
න බුද්ධවචනානීති දීපෙතාචරියාසභො"ති

එක්සාලිසකින් අධිකාක්ෂරපද්‍යරචනාවක් බුදුවදන්හි නොවේයයි ප්‍රකාශකළෝ. "නක්ඛරන්තීති අනන්තානමභිධෙය්‍යං පකාසිතං බ්‍යඤ්ජනානීති අක්ඛරා, අආදි සෙසං තෙ ආදයො; එකං ච චත්තාළීසං ච එකචත්තාළීසං, එකෙනාධිකා වා චත්තාළීසං එකචත්තාළීසං" යනු වාක්‍යයි–මේ සූත්‍රයෙහි පදසිද්ධි කරත්; නදුම්වූ "ඛර ඛයෙ" යන ධාතුහු කෙරෙන්

“සබ්බතොණවුත්වාවිවා’ යි අප්‍රත්‍යයව පැමිණ කර්මධාරයෙහි තත්පුරුෂ සමාසව “අත්තනානස්ස තප්පුරිසෙ”යි නහට අව “වග්ගෙ ඝොසාඝොසානං තතිය පඨමා”යි චිත්වව “තඞ්ඛා”දීන් තම්වත්ව ඝොහට ආව “අක්ඛර” යනුවේ, අපි යන උපසර්ගයාකෙරෙන් සිව “සබ්බාසමාවුසො” යනාදින් ලොප්ව අපි යනුවේ “ආදියති” යන වාක්‍යයෙහි ආපූර්වවූ “ද” යන ධාතුකෙරෙන් “සඤ්ඤායං දධාතො ඉ”යි ඉව පැමිණ සිව ලොප්ව “ආදි” යනුවේ. “අ ආදි යෙසං තෙ” යන වාක්‍යයෙහි බහුව්‍රීහි සමාසව ප්‍රකෘතිවත්ව සමාසහෙයින් නාම්වත්ව යොව “ඉවණ්ණුවණ්ණොඣලා”යි ඣ සඤ්ඤව යො පරකල්හි අකෘතහ්‍රස්ව ඣ සංඥයට “යොසව කතරස්සා ඣො”යි අව සංහිතාකාර්‍ය්‍යව ආදයො” යනුවේ. එකශබ්දයාකෙරෙන් සිව අංව “එකං” යනුවේ. “දස”යි සතර තැනකතබා ද්වන්ද්වසමාසයෙන් එකශෙෂකොට දසයි සිටිකල්හි යො විභක්ත්‍යපරකොට “ගණනෙ දසස්ස ද්විතිචතුපඤ්චඡස්සත්තට්ඨනවකානං” යනාදි සූත්‍රයෙන් දසශබ්දයට චත්තාර යනාදෙසව එම සූත්‍රයෙන් යොහට ඊසං යනාදෙසව “ළදරානං”යි රහට ළව “චත්තාලීසං” යනුවේ, නැවත “එකච චත්තාලීසච” යන වාක්‍යයෙහි ද්වන්ද්ව සමාසව “එකචත්තාලීසං” යනුවේ,

සුත්තන්තෙ, පිටකත්‍රයට; උපකාර, වහල්වූ; අකාරාදයො, අකාරයා ආදිකොට ඇති; එකචත්තාලීසං, එක්සාළිසක් පමණවූ, අපි, ඔහුද, හෙවත් “අත්ථො අක්ඛරසඤ්ඤාතො” යන පූර්වවාක්‍යයෙන් සඥිත ප්‍රයෝජන ඇති වර්ණයෝද, අක්ඛර, අක්ෂරයෝ නම් වෙත්; තං යථා (තෙ කතමෙ) ඔහු කවරහ? ස්ථානකරණප්‍රයත්න වශයෙන් අටනොනෙක උපදනාවූ අකාරයා ආදිකොට ඇති නිග්ගහිතයා කෙළවරකොට ඇති එක්සාළිසක් පමණවූ අක්ෂරයෝයි.

මෙයින්

“නිස්සයාදෙ සරා වුත්තා බ්‍යඤ්ජනා නිස්සිතා තතො
වග්ගෙ ගක්‌ඛි බහුත්තාදෙ තතො ඨානලහුක්කමා”යි.

කියනලද නිශ්‍රයානිශ්‍රිතයෙන් පෙර නිශ්‍රයොක්තය, බහුක අල්පයෙන් පෙර බහුකොක්තය, ලඝුගුරුවලින් පෙර ලඝුකොක්තය, ඝොෂා ඝොෂයෙන් පෙර අඝොෂොක්තය, සිථිල ධනිතයෙන් පෙර සිථිල ලොක්තයි,

තත්ථ අක්ඛරෙසු, ඒ එක්සාළිසක් පමණවූ අක්ෂරයන් අතුරෙහි, ඔකාරන්තා, ඔකාරයා කෙළවරකොට ඇති, අට්ඨ, අටදෙන; සරා නාම, ස්වරයෝ නම්වෙත්.

සරන්ති ගච්ඡන්තීති සරා, බ්‍යජනෙ සාරෙන්තීති වා සරා–තෙසු සරෙ
සු, ඒ ස්වරයන් අටදෙනා අතුරෙහි; ලහුමත්තා, ලඝුවූ මාත්‍රා ඇති;
අ ඉ උ ඉති, අකාර ඉකාර උකාර යන; තයො, තුන්දෙන; රස්සා,
හ්‍රස්වස්වරයෝ නම් වෙත්—ලහුකා මත්තා පමාණං යෙසන්තෙ ලහු
මත්තා, රස්සකාලයොගතො රස්සා, රස්ස සංඛාතො කාලො එතෙ
සමත්ථීති වා රස්සා–තෙසු සරෙසු, ඒස්වරයන් අටදෙනා අතුරෙහි;
රස්සෙහි, හ්‍රස්වයන් තුන්දෙනා කෙරෙන්; අඤ්ඤෙ, අන්‍යවූ ස්වර
යන් පස්දෙනා දීඝා, දීර්ඝස්වරයෝ නම් වෙත්—දීඝකාලයොගතො
දීඝා, දීඝකාලො ඒතෙසමත්ථීති වා දීඝා *–අනන්තරා, වර්ණව්‍යව
ධාන කාලව්‍යවධානයක් නැත්තාවූ; බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනයෝ; සං
යොගො, සංයොගනම් වේ. "එත්ථ" යනාදි ක්‍රමයෙන් උදාහරණයි,"එ
ත්ථ" යනු සංයොගයට පූර්වවූ කෙවලගුරුවූ එකාරයාගේ හ්‍රස්වොච්චාර
ණයට උදාහරණය, "සෙය්‍යො" යනු සංයොගයට පූර්වවූ සව්‍යඤ්ජන
ගුරුවූ එකාරයාගේ හ්‍රස්වොච්චාරණයට උදාහරණය,"ඔට්ඨො" යනු සං
යොගයට පූර්වවූ කෙවලගුරුවූ ඔකාරයාගේ හ්‍රස්වොච්චාරණයට උදාහ
රණය, "සොත්ථි"යනු සංයොගයට පූර්වවූ සව්‍යඤ්ජන ගුරුවූ ඔකාරයා
ගේ හ්‍රස්වොච්චාරණයට උදාහරණය–සරෙ ඨපෙත්වා, ස්වරයන් අට
දෙනා තබා; සෙසා, සෙසු; කාදයො, කකාරයා ආදිකොට ඇති;
නිග්ගහීතන්තා, නිග්ගහීතයා කෙළවරකොට ඇත්තාහු; බ්‍යඤ්ජනා
බ්‍යඤ්ජනයෝ නම් වෙත්–සෙසියන්තීති සෙසා,අත්ථං බ්‍යඤ්ජන්ති පකා
සෙන්තීති ව්‍යඤ්ජනා–"**වග්ගා පඤ්ච පඤ්චසො මන්තා**", යනු වර්ග
සංඥ විධානසූත්‍රයි. වජ්ජීයන්ති අනන්තරෙඨහි යරලවාදීහීති වග්ගා, †
පඤ්ච පඤ්ච විභාගෙනාති වා පඤ්ච පඤ්ච එතෙසමත්ථීති වා පඤ්චප
ඤ්චසො,' මො අන්තො යෙසං තෙ මන්තා–වග්ගානං, වර්ගාක්ෂරයන්
සම්බන්ධිවූ; පඨමදුතියා, ප්‍රථම ද්විතීයාක්ෂරයෝද; හෙවත් ක ඛ ච ඡ ට
ඨ ත ථ ප ඵ යන අකුරුද; සො ච, සකාරයද යනමොවුහු; අඝොසා,
අඝොෂයෝ නම් වෙත්; ළන්තා, ළකාරයා කෙළවරකොට ඇති; අ
ඤ්ඤෙ, සෙසු වර්ණයෝ; ඝොසා, ඝොෂ නම් වෙත් අංඉති, අංකියා;
අකාරතො, අකාරයා කෙරෙන්.

**"බින්දු චූළාමණාකාරො නිග්ගහීතන්ති වුච්චතෙ**
**කෙවලස්සාප්පයොගත්තා අකාරෙ සන්නිධීයතෙ"**

---

* දවන්ති සද්දෙන දූරං ගච්ඡන්තීති වා දීඝා.

† වග්ගන්ති එකීභාවං සමානභාවං ගච්ඡන්තීති වා'වග්ගා.

චූලමණිකාරෙ, සිළුමිණකට බඳුවූ ආකෘතිඇති; බිඤ්ඤු, බින්දුතෙම; නිග්ගහිතං ඉති, නිග්ගහිතයයි; වුච්චතෙ, කියනුලැබේ; කෙවලස්ස, හුදකලාබින්දුහුගේ; අප්පයොගතතා, උච්චාරණාදි ප්‍රයොගයක් නොකොට හැකිබැවින්; අකාරෙ, අකාරයතෙම; සන්නිධියතෙ, ලංකරණුලැබේ-රස්සසරං නිස්සාය ගය්හතීති නිග්ගහීතං, කරණං නිග්ගහෙත්වා ගය්හතීති වා නිග්ගහිතං, කියනලද මැයි.

**“කරණං නිග්ගහෙත්වාන මුඛෙනාවිවටෙනයං**
**වුච්චතෙ නිග්ගහිතන්ති වුත්තං බින්දු සරානුගං”**

කරණං නිග්ගහෙත්වාන, (කණ්ඨතාලවාදි) කරණස්ථාන හකුලුවා; අවිවටෙන මුඛෙන, අවිවෘතවූ මුඛය කරණකොටගෙන; සරානුගං, (හ්‍රස්ව) ස්වරයා අනුව යන්නාවූ; යං, යම් බින්දුවක්; උච්චතෙ, කියනුලැබේද; බින්දු (ඒ) බින්දුතෙම; නිග්ගහිතං ඉති, නිග්ගහීතයයි; වුත්තං, (පූර්වාචාර්‍ය්‍යයන්විසින්)කියනලදී-සඤ්ඤානාමානි එතාසානි සඤ්ඤා

**සඤ්ඤාවිධානය කියා නිමවනලදී.**

---

පුබ්බබ්‍යඤ්ජනං, පූර්වයෙහිවූ ව්‍යඤ්ජනයා; සරතො, ස්වරයා කෙරෙන්; පෘථක්කාතබ්බං, වෙන්කටයුත්තේයි-**“සරා සරෙ ලොපං”** යනු පූර්වස්වරලොප විධානසූත්‍රයි-**“සරා”** යනු ප්‍රථමා බහුවචනාන්තනාමිකපදයි, **“සරෙ”** යනු සප්තම්‍යෙක වචනාන්ත නාමිකපදයි, **“ලොපං”** යනු ද්විතීයෛක වචනාන්ත නාමිකපදයි.

“සරා” යනු කාරීනිර්දේශයි, “සරෙ” යනු නිමිත්ත නිර්දේශයි, “ලොපං” යනු කාර්‍ය්‍යනිර්දේශයි * ලුත්තන්ති ලොපො, තං ලොපං.

**විනාසො විජ්ජමානස්ස ලොපො ඉති පවුච්චති**
**අවිජ්ජමානං යං තත්ථ තස්ස උප්පත්ති ආගමො.**

අනන්තරෙ, වර්ණව්‍යවධාන කාලව්‍යවධානයක් නැත්තාවූ; සරෙ පරෙ, ස්වරයා පරකල්හි; සරා, පූර්වස්වරයෝ; ලොපං, ලොපට; පප්පොන්ති පැමිණෙත්-නයෙ පරං යුත්තෙ ඉති,“නයෙපරං යුත්තෙ” යන පරිභාෂා සූත්‍රයෙන්; අස්සරං ව්‍යඤ්ජනො, ස්වර රහිතවූ ව්‍යඤ්ජනතෙම; පරක්ඛරං, පරාක්ෂරයාකරා; නෙතබ්බං, පැමිණවිය යුත්තේයි; සරෙඉති, සරෙයන; අයම්, මෙතැන්හි; ඕපසිලෙසිකොකාසසත්තමී, ඖපශ්ලෙෂිකාධාරසප්තම්ය; තතො, එහෙයින්; වර්ණකාලව්‍යවධානෙ, වර්ණව්‍යවධාන කාලව්‍යවධාන ඇතිකල්හි; කාරියං, සංහිතාකාර්‍ය්‍යය; නහොති, නොවේ.

---

* ලුප්‍යතීති ලොපො.

"මං අහාසි" යනාදිය මෙහි ක්‍රමයෙන් උදාහරණයි. මං:අහාසි ඉති, "මංඅහාසි" යනුද; පමාදමනුයුඤ්ජන්ති ඉති, "පමාද මනුයුඤ්ජන්ති" යන; ආදිගාථායං, මේපදාදි ගාථායෙහි; ජනාඅප්පමාදං ඉතිච, "ජනා අප්පමාදං" කියාදවේ. "මං අහාසි" යනු වර්ණව්‍යවධානයට උදාහරණයි. "ජනා අප්පමාදං" යනු කාලව්‍යවධානයට උදාහරණයි "මං අහාසි" යනතන්හි අකාර පරවූවද බින්දු මැදවූහෙයින් පූර්වකාරයත් අකාරයට ලොප්නොවේ. "ජනා අප්පමාදං" යන තන්හි "පමාදමනුයුඤ්ජන්ති" යනාදිගාථායෙහි පෙර පෙදකෙළවර සිටි නකාරයත් ආකාරයහට උතුරුපෙද පෙර අකාර පරවුවද කල්වැවදන් හෙයින් ලොප්නොවේ. පෙර පෙද අන්තසැතැප්මෙන් උතුරුපෙද ආදිය කියනහෙයින් විච්ඡේදනාකාර මැද කාලව්‍යවධාන නම්වේ. සබ්බසන්ධිසු, සියලු සංහිතාකාර්‍යයන්හිම; එවං, මෙසේමැයි-අනන්තරං පූර්වස්වර ලොපයට අනතුරුකොට; පරස්ස සරස්ස, පරස්වරයට; ලොපං, ලොපය; වක්ඛති, (ආචාර්‍යතෙම මතු) කියන්නේය; තස්මා, එහෙයින්; අනෙන, මේ සූත්‍රයෙන්; පුබ්බස්ස, පූර්වස්වරයට; ලොපො, ලොපය; ඤායති, හැඟේ; තෙනඑව, එහෙයින්ම; සත්තමීනිද්දිට්ඨස්ස, සප්තමීන් දක්වන ලද්දහුගේ; පරතාඅපි, පරබවද; ගම්‍යතෙ, දන්නාලැබේ-අධිකරීයති සම්බන්ධීයතීති අධිකාරෝ.

"ක්වචාසවණ්ණං ලුත්තෙ"-මෙහි ක්වචි යන්නහු කෙරෙන් පරවූ චි යන නිපාතය අල්පාර්ථයෙහි වැටේ. "අසවණ්ණං" යනු කාර්‍යිනිර්දේශයි, "ලුත්තෙ" යනු නිමිත්තනිර්දේශයි-වණ්ණීයති අත්ථො එතෙනාති වණ්ණො, සමානො වණ්ණො යස්ස සො සවණ්ණො, නසවණ්ණො අසවණ්ණො, (තං) අසවණ්ණං-අසවණ්ණොහොතීති, අසමානවර්ණවේනුයි-සරෙ, පූර්වස්වරයා; ලුත්තෙ, ලොප්කළ කල්හි; පරෙ සරෙ, පරස්වරතෙම; ක්වචි, කිසිතැනෙක්හි; ඨානාසන්නං, උත්පත්තිස්ථාන හෙයින් ආසන්නවූ; දීඝං, දීර්ඝබවට; යාති, පැමිණේ—අන්තස්ස, පදාන්තවූ-ක්වචීති, ක්වචියනු; කිං, කුමටද; "තෙඑ" යන තන්හි පදාන්තවූ එකාරයහට යකාරාදේශ නොවන පිණිසයි-සරෙ පරෙ, ස්වරයා පරකල්හි; අන්ත, පදාන්තවූ; ඔකාරුකාරානං, ඔකාර උකාරයන්ට; ක්වචි, කිසිතැනෙක්හි; වො, වකාරයෙක් ආදේශවේ--ආදෙසි වණ්ණස්ස ඨානෙ ආදිස්සතීති ආදෙසො-තයස්සුසමෙතායසමා, "තයස්සු සමෙතායසමා" යනතන්හි (පදාන්තවූ ඔකාර උකාරයන්ට වකාරාදේශ නොවනපිණිසයි)—ඉධෙව, "ඉධෙව" යනතන්හි (ධකාරයට දකාරාදේශ නොවනපිණිසයි-වකාරෙන, වග්‍රහණයෙන්; බ්‍යඤ්ජනෙපි, බ්‍යඤ්ජනයා පරකල්හිද; (ධකාරයට දකාරයෙක් ආදේශවේ)-නවා, විකල්පයෙන්-පටිග්ගහි, "පටිග්ගහි" යනතන්හි (ඉවර්ණයහට යකාරාදේශ නොවනපිණිසයි)-රස්සදීඝගහණෙඨං, හ්‍රස්වය දීර්ඝය යන

මොවුන්ගේ සංග්‍රහය පිණිසයි-රිත්තං, රිකාරාදෙශබවට-ඡ අභිඤ්ඤා පුථු එව පාණුව, "ඡ අභිඤ්ඤා පුථු එව පාණුව" යනාතන්හි (ළකාර ගකාරාගම නොවනපිණිසයි-නවිකාරෙත්‍යයෙවා, ලොපාගමාදි අන් විකාරයෙක් නොවෙයි යන අදහසයි.

### ස්වරයන් සම්බන්ධසංහිතා කියා නිමවනලදී.

---

සොමුනි, "සොමුනි" යන තන්හි (අකාරාගම නොවන පිණිසයි) තබ්බයොග, එමට්ඨානෙයහි-අවසුස්සතු, "අවසුස්සතු" යනාතන්හි අව ශබ්දයට ඔකාරාදෙශ නොවන පිණිසයි.

### ව්‍යඤ්ජනයන් සම්බන්ධ සංහිතා කියා නිමවනලදී.

---

තථංකම්මං, "තථංකම්මං" යනාතන්හි තද්වගීයනාසාදෙශ නොවන පිණිසයි.

**"සසෙ ච"** යනු විධිසූත්‍රයි, සහ ශබ්දයා කෙරෙන් **නා** විබත්ට "සබ්බාසමාවුසො" යනාදි සුත්‍රයෙන් ලොප්ව සහ ශබ්දයට "ඵවචයාද නිට්ඨා නිපාතනා සිජ්ඣන්ති"යි සකාරව යකාරයා කෙරෙන් නිමිත්ත සප්තම්ව **සම්**ංහට ඒකාරව **ච**යනු නිපාතව "සයෙව්" යනුවේ. "සහ, යෙ, ච"යි ත්‍රිපදවේ. **සහ** යනුද **ච** යනුද නිපාතයි, **සෙ** යනු සප්තම්‍යෙකවචනාන්තනාමික පදයි, **සහ** යනු කාර්‍ය්‍යනිර්දේශයි, **සෙ** යනු නිමිත්තනිර්දේශයි, **ච** යනු **ස්‍ව මා** දෙශානුකර්ෂණය පිණිසයි. තෙනසහ; ඒ යකාරයා සමග; බින්දුනො, නිග්ගහීතයහට-බින්දුන්තා, නිග්ගහීතයා කෙරෙන්; පරෙ සරෙ, පරස්වරයා; ලුත්තෙ, ලොප්කළ කල්හි; සංයොගො ව්‍යඤ්ජනො, සංයොගවූ ව්‍යජනතෙම; විනාසංයොගො හොන්ති, නටුවාවූසංයොග ඇත්තේ වේනුයි; (යනු සූත්‍රාර්ථහෙයින්,) පුබ්බසලොපො, පූර්ව සකාරයට ලොප්වේ.

### නිග්ගහීතයන් සම්බන්ධ සංහිතා කියා නිමවනලදී.

---

ඉධ, මෙතැන්හි; අනිද්දිට්ඨා, නොදක්වන ලද්දාවූ; සන්ධයො, සංහිතාවෝ; වුත්තානුසාරෙන, කියනලද නයානුසාරයෙන්; ඤෙය්‍යා, දතයුත්තාහුයි-අඤ්ඤදිසසංයොගෙ, අසදෘශයන්ගේ විසදෘශසංයෝගබවක් ඇතිකල්හි; එකසරූපතාව, සමානස්වරූප බවද වේ-මියනමො, ස්වර මකාරයෙක් ආගමවේ; සකාරෙ, සකාරයෙහි; අකාරස්ස, අකාරයහට; උව, උකාරයෙක්ද ආදෙශවේ-වාක්‍යසුබුද්ධච්චාරණත්ථං, වාක්‍යයාගේ සුබොධොච්චාරණය පිණිසද; ඡන්දහානිරක්ඛ, ඡන්දස්හුගේ නොපිරිහීම පිණිසද; වණ්ණලොපොපි, අක්ෂර ලොපයද වේ.

**අක්ඛරනියමො ඡන්දං ගරුලහුනියමො භවෙ වුත්ති**
**දීඝො සංයොගාදිපුබ්බො රස්සො ච ගරු ලහු තු රස්සො.**

අක්ඛරනියමො, එකාක්ෂරව්‍යක්ෂරාදිවූ අක්ෂරයන්ගේ නියමය; ඡන්දං භවෙ, ඡන්දස් නම් වේ; ගරුලහුනියමො, වංකොජු ගුරුලඝූන් ගේ නියමය; වුත්ති භවෙ, වෘත්තිනම් වේ; දීඝො, (කෙවල) දීර්ඝාක්ෂර යද; සංයොගාදි පුබ්බො රස්සොච, සංයොගාදීන්ට පූර්වවූ හ්‍රස්වාක්ෂර යද; ගරු භවෙ, ගුරු නම්වේ; රස්සොතු, (කෙවල) හ්‍රස්වාක්ෂරය වනාහි; ලහු භවෙ, ලඝු නම්වේ. **"ආ, අස්ස, අං, අ"** යනු මෙහි ක්‍රමයෙන් උදාහරණයි, ආ යනු කෙවල දීර්ඝවූ ගුරුහට උදාහරණය, අස්ස යනු සංයොගයට පූර්වවූ ගුරුහට උදාහරණය, අං යනු නිග්ගහීතයට පූර්වවූ ගුරුහට උදාහරණය, අ යනු ලඝුහට උදාහරණයි.

**එවමඤ්ඤම්පි විඤ්ඤෙය්‍යා සංහිතා තන්තියා හිතා**
**සංහිතාති ච වණ්ණානං සන්නිධබ්‍යවධානතො.**

තන්තියා, පාලියට; හිතා, අනුකූලවූ; අඤ්ඤම්පි සංහිතා, (මෙහි ස්වරූපයෙන් නොදක්වනලද්දාවූ) සෙසු සංහිතාවෝද; එවං, මේ යට කීපරිද්දෙන්; විඤ්ඤෙය්‍යා, දතයුත්තාහ; සංහිතා ඉතිච, (සංහිතා යන්නෙහි) සංහිතා නමුදු; වණ්ණානං, අක්ෂරයන්ගේ; අබ්‍යවධානතො, අතරක් නැතිවීමෙන්; සන්නිධි, ලංවීමයි, හෙවත් එක්කොට කීමයි.

**ව්‍යතිමිශ්‍රකසංහිතා කියා නිමවනලදී.**

---

මෙතැන්පටන් ස්වරසංහිතාදියෙහි පද සිදුකරණු ලැබෙත්.

**"ලොකග්ගො"**කියා සංහිතාකාර්‍යයක් කළමනා තන්හි **"ලෝක"** කියාවේ, **අග්ගො** කියාවේ. "ලොක-අග්ගො" යනතන්හි "පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ" යන පරිභාෂා සූත්‍රයෙන් ස්වරයා කෙරෙන් ව්‍යඤ්ජන පහවේ, පහවන්නෙහිදු කකාරයෙන් අකාරයා කෙරෙන් කකාර පහවේ, කකාර හල්වේ, ස්වරයා පරකල්හි පූර්වස්වරයට "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ, යට සිටි ස්වර රහිත ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂාසූත්‍රයෙන් දුරාක්ෂරයා කරා පැමිණේ. "ලොක අග්ගො" කියා පදබිඳ තුබූතන්හි සංහිතාකාර්‍යයීව "ලොකග්ගො" යනුවේ.

**"පන-ඉමෙ, පන්-ඉමෙ"** යන තන්හි-"පුබ්බමධො-ඨිතමස්සරං වියොජයෙ" යන පරිභාෂාසූත්‍රයෙන් නකාරයෙහි අකාර පහකොට අසමාන ස්වරූපයාකෙරෙන් පරස්වරයහට "වා පරො අසරූපා"යි විකල්පයෙන් ලොප්කොට පමුණුවා "පනමෙ" යනුද පසෙක්හි පූර්වස්වරලොපයෙන් "පනිමෙ" යනුදවේ.

**"බන්ධුස්ස-ඉව, න-උපෙති"** යන තන්හි සකාර නකාරස්ථ අකාර පහව ස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සර සරෙ ලොපං"යි ලොප්ව පසුව පරස්වරයහට "ක්වචාසවණ්ණං ලුත්තෙ"යි අසමාන වර්ණවෙයි, එන්නෙහිදු තාලුජවූ ඉකාරයහට කණ්ඨතාලුජවූ එකාරය හා ඕෂ්ඨජවූ උකාරයට කණ්ඨෝෂ්ඨජවූ ඔකාරව ස්වරයාකරු පැමිණ "බන්ධුස්සෙව නො පෙති" යනුවේ.

**"තත්‍ර-අයං"** යනාදි තන්හි-"පුබ්බ-පෙ-වියොජයෙ"යි රකාරාදීන්ගේ ස්වර පහකොට ස්වරපරකල්හි පූර්වස්වර ලොප්කොට පර ස්වරයන්ට **"දීඝං"**යි දීඝීකොට "නයෙ පරංයුත්තෙ"යි පරාක්ෂරයා කරු පැමිණවූකල්හි "තත්‍රායං" යනාදිය වේ.

**"කිංසු-ඉධ"** යන තන්හි "පුබ්බ-පෙ-වියොජයෙ"යි ස්වර පහකොට අසමාන ස්වරයාකෙරෙන් පරස්වරයහට "වාපරො අසරූපා"යි ලොප්කොට "පුබ්බොච"යි පූර්වයට දීඝීකොට පැමිණවූකල්හි "කිංසූධ" යනුවේ.

**"තෙ-අජ්ජ, තෙ-අහං"** යන තන්හි"පුබ්බ-පෙ-වියොජයෙ"යි තකාරස්ථ එකාර පහකොට "යමෙදන්තස්සාදෙසො"යි එකාරයහට යකාරාදේශකොට යකාර තකාරයෙහි සංහිතකොට අසෙක්හි ව්‍යඤ්ජනයා පරනිමිත්තෙන් "දීඝං"යි දීඝීකොට පරාක්ෂරයා කරුපැමිණවූකල්හි "ත්‍යජ්ජ, ත්‍යාහං" යනුවේ. **"තෙ-එසං"** යනතන්හි ස්වර පහව ලොප්ව පැමිණ "තෙසං" යනුවේ.

**"සො-අස්ස, අනු-එති"** යනතන්හි ස්වරපහව ඔකාර උකාර යන්ට "වමොදුදන්තානං"යි වකාරාදේශව වකාර සකාරනකාරයන් හි සංහිතව පරාක්ෂරයා කරුපැමිණ "ස්වස්ස, අන්වෙති" යනුවේ. **"න සො-අස්සු, සමෙතු-ආයස්මා"** යනතන්හි ස්වරපහව ලොප්ව පරාක්ෂරාරූඪව "නස්සු, සමෙතායස්මා" යනුවේ.

**"ඉධ-අහං"** යනතන්හි ස්වරපහව ධකාරයහට "දොධස්සච"යි දකාරව ව්‍යඤ්ජනයා පරකල්හි "දීඝං"යි දීඝීව "ඉදාහං" යනුවේ.

**"පති-අන්නං, වුත්ති-අස්ස"** යනතන්හි ඉකාරපහව ස්වරයා පරකල්හි ඉවර්ණයට "ඉවණ්ණො යං නවා"යි යකාර ව යකාර ත කාරයෙහි සංහිතව කරණලද යකාරාදේශ ඇති **ති**ශබ්දයහට පසෙක්හි "සබ්බො චං ති"යි චකාරව "පරද්වෙභාවො ඨානෙ"යි ද්විත්වව පරාක්ෂරයා කරුපැමිණ "පච්චන්නං වුත්‍යස්ස" යනුවේ. *

---

* "පති-අන්නං" යනතන්හි තකාරස්ථ ඉකාරයට යකාරාදේශ නොකොට කෙවල **ති** ශබ්දයට පමණක් **ච**කාරාදේශ කිරීමෙන් "පච්චන්නං"යි සිද්ධකළනැකිබවද ඒ යුක්තියුක්ත බවද හන්මු-විස්තාර සුබෝධිකා ටීකාවෙන් දතයුතුයි.

**"පති-අග්ගි"** යනතන්හි පති ශබ්දයහට "ක්වචි පටි පතිස්ස" යි පටියනාදේශව පූර්වස්වරයහට "සරා සරෙ ලොපං" යි ලොප්ව පැමිණ "පටග්ගි" යනුවේ.

**"යථා-එව, යථා-එව"** යනතන්හි ස්වරපහව ස්වරයා කෙරෙන් පරවූ එව ශබ්දයා සම්බන්ධ ආදි එකාරයට "එවාදිස්ස රි පුබ්බො ච රස්සො" යි රිකාරාදේශව එම සූත්‍රයෙන්ම පූර්වස්වරයහට හ්‍රස්වව පසෙක්හි රිකාරනොව පූර්වස්වර ලොප්ව පැමිණ "යථරිව, යථෙව" යනුවේ.

**"න-ඉමස්ස"** යනාදීතන්හි ස්වරයා පරකල්හි "යවමදනතරළා චාගමා" යි යකාරාදීහු ආගමව පරාක්ෂරයා කරාපැමිණ "නයිමස්ස" යනාදිය වේ. **"පුථ-එව, පා-එව"** යනතන්හි මේ සූත්‍රයෙහි චග්‍රහණයෙන් ගකාරාගමව පසෙක්හි ව්‍යඤ්ජනයා පරනිමිත්තෙනාත් පූර්වස්වරය හට හ්‍රස්වව යටසිටි ස්වර රහිතවූ ව්‍යඤ්ජනයෙහි "නයෙ පරං යුත්තෙ" යි පරාක්ෂරයා කරාපැමිණ "පුථගෙව පගෙව" යනුවේ *

**"අභි-උග්ගතො"** යනතන්හි ස්වරයා පරකල්හි "අභි" ශබ්දය හට "අබ්භො අභි" යි "අබ්භ" යනාදේශව පූර්වස්වරයහට ලොප්ව පැමිණ "අබ්භුග්ගතො" යනුවේ—සරානං සන්ධි සරසන්ධි.

---

**"සො-භික්ඛු, කච්චිනු-ත්වං, ජනෙම-තං"** යනතන්හි ස්වර පහව ව්‍යඤ්ජනයා පරකල්හි පූර්වස්වරයහට "ලොපඤ්ච තත්‍රාකාරො" යි ලොප්ව පූර්වපක්ෂයෙහි මෙම සූත්‍රයෙන් අකාරාගමව හා අන්‍යපක්ෂව යෙහි මෙහිම චග්‍රහණයෙන් ඔකාර උකාරාගමව පරාක්ෂරයා කරාපැමිණ "ස භික්ඛු, කච්චිනොත්වං, ජනෙමුතං" යනුවේ.

**"උ-ඝොසො, ආ-ඛාතං"** යනතන්හි, ස්වරයා කෙරෙන් පරවූ ඝකාර ඛකාරයන්ට "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා" යි ගකාර කකාර විත්තව වර්ගව්‍යඤ්ජනයා පරකල්හි පසෙක්හි පූර්වස්වරයට හ්‍රස්වව "උග්ඝොසො, අක්ඛාතං" යනුවේ.

**"පර-සහස්සං, අප්පස-බො"** යනතන්හි ව්‍යඤ්ජනයා පරකල්හි "ක්වචි ඔ බ්‍යඤ්ජනෙ" යි ඔකාරාගමව පූර්වස්වරයහට ලොප්ව පසෙක්හි "යවමදනතරළා චාගමා" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් ගකාරයෙක්ද ආගමව පැමිණ "පරොසහස්සං, අප්පගොබො" යනුවේ.

---

* "පුථගෙව පගෙව" යනතන්හි "යවමදනතරළා චාගමා" යන සූත්‍රයෙන් චග්‍රහණයෙන් ගකාරාගම වීමට යුතුයයි නොහැගේ. එසේවුව හොත් කාත්‍යායනයෙහි නියමිත "ඔනා සරෙ පුථස්සාගමො ක්වචි" යන සූත්‍රයහා "පාස්ස චන්තො රස්සො" යන සූත්‍රයද නිරර්ථකවේ. විමසා බලා ගතයුතු.

**"අව-නද්ධා"** යනතන්හි "අව" ශබ්දයහට "ඔ අවස්ස"යි ඔකාරාදේශව "ඔනද්ධා" යනුවේ-බ්‍යඤ්ජනානං සන්ධි බ්‍යඤ්ජනසන්ධි.

---

**"කිං-කතො"** යනාදීතන්හි වර්ගව්‍යඤ්ජනයා පරනිමිත්තකොට නිග්ගහීතයට "වග්ගන්තං වා වග්ගෙ"යි තද්වර්ගාන්තාදේශව "කිඞ්කතො" යනාදියවේ. **"පුං-ලිඞ්ගං"**යනතන්හි ලකාරයා පරකල්හි නිග්ගහීතයට මෙහිම වග්‍රහණයෙන් ලකාරාදේශව "පුල්ලිඞ්ගං" යනුවේ

**"එවං-අස්ස, එතං-අවොච"** යනතන්හි ස්වරයා පරකල්හි නිග්ගහීතයට "මදා සරෙ"යි මකාර දකාරාදේශව ස්වරලොප්ව පැමිණි "එවමස්ස එතදවොච" යනුවේ.

**"තං-එව, තං-හි"**යනතන්හි එකාර හකාරයන් පරනිමිත්තකොට නිග්ගහීතයහට "එහෙ ඤ්ඤං"යි ඤකාරාදේශව පසෙක්හි "පරවෙහා වෝ ඨානෙ"යි ඤකාර ද්විත්වව පැමිණි "තඤ්ඤෙව, තඤ්ඤි" යනුවේ. විකල්පයෙන් ඤකාරනොවූ තන්හි "තමෙව, තංහි" යනුවේ.

**"සං-යොගො"** යනතන්හි යකාරයා පරනිමිත්තකොට ඒ පර යකාරය සමග නිග්ගහීතයට "ස යෙ ච"යි ඤකාරව ද්විත්වව "සඤ්ඤොගො" යනුවේ.

**"චක්ඛු-අනිච්චං, අව-සිරෙ"** යනතන්හි ස්වරව්‍යඤ්ජනයන් පරකල්හි "නිග්ගහීතඤ්ච"යි කිසිතැනෙක්හි නිග්ගහීතාගමව "චක්ඛුං අනිච්චං අවංසිරෙ" යනුවේ.

**"විදූනං-අග්ගං, තාසං-අහං"** යනතන්හි ස්වරයා පරකල්හි නිග්ගහීතයට "ක්වචි ලොපං"යි ලොප්ව පූර්වස්වරද ලොප්ව පසෙක්හි පරස්වරයට දීර්ඝව "විදූනග්ගං තාසාහං" යනුවේ.

**"බුද්ධානං-සාසනං, සං-රාගො"** යනතන්හි බ්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහීතයට "බ්‍යඤ්ජනෙ ච"යි ලොප්ව පසෙක්හි පූර්වස්වරයට දීර්ඝව "බුද්ධානසාසනං සාරාගො" යනුවේ.

**"බීජං-ඉව"** යනතන්හි නිග්ගහීතයා කෙරෙන් පරස්වරයට "පරෙ වා සරෙ"යි ලොප්ව "බීජංව" යනුවේ.

**"එවං-අස්ස"** යනතන්හි නිග්ගහීතයා කෙරෙන් පරස්වරයට "පරෙවා සරෙ"යි ලොප්ව සංයොග සකාරවශයෙන් පූර්වසකාරයට "බ්‍යඤ්ජනෙ ච විසඤ්ඤොගො"යි ලොප්ව "එවංස" යනුවේ-නිග්ගහීතස්ස සන්ධි නිග්ගහීතසන්ධි.

---

**"යදි-එවං, බොධි-අඞ්ගා"** යනතන්හි "පුබ්බ=පෙ=වියොජයෙ" යන සූත්‍රයෙන් ස්වර පහකොට "ඉවණ්ණො යං නවා" යි යකාරව යකාර සංහිතව යවත්වූ දකාර ධකාරයන්ට "අනුපදිඨානං වුත්තයොගතො" යි ජකාර ඣකාරව ද්විත්වව පරක්ඛරයා කර පැමිණ "යජ්ජෙවං, බොජ්ඣඞ්ගා" යනුවේ.

**"පරි-එසනා"** යනතන්හි ස්වරපහව "ඉවණ්ණො යං නවා" යි ඉකාරයට යකාරකළ කල්හි "අනුපදිඨානං වුත්තයොගතො" යි රකාරයට යකාරත් යකාරවය සංහිතව පරස්වරයා කර පැමිණ "පය්‍යෙසනා" යනුවේ.

**"සරති"** යනතන්හි "අනු=පෙ=යොගතො" යි සස්වර මකාරයෙක් ආගමව එයින්ම අකාරයහට උකාරව "සුමරති" යනුවේ.

**"ඉති-එවං"** යන තන්හි ස්වරපහව ස්වරයා පරකල්හි ඉවණ්ණයට "අනු=පෙ=යොගතො" යි වකාරව තකාරයෙහි සංහිතව පරක්ඛරයා කර පැමිණ "ඉත්වෙවං" යනුවේ.

**"සා-ඉත්ථි"** යනතන්හි ස්වරපහව අසමාන ස්වරයාකෙරෙන් පරස්වරයට "වා පරො අසරූපා" යි ලොප්ව පූර්වස්වරයට "අනු=පෙ=යොගතො" යි ඔකාරව පැමිණ "සොත්ථි" යනුවේ.

**"බුසා-එව"** යනතන්හි ස්වරයා පරකල්හි "යවමදනතරලාවාගමා" යි මකාරාගමව පූර්වස්වරයට "රස්සං" යි හ්‍රස්වව පරවූ එකාරයට "අනු=පෙ=යොගතො" යි ඉකාරව පැමිණ "බුසමිව" යනුවේ.

**"බහු-ආබාධො"** යනතන්හි ස්වරපහව ස්වරයා පරකල්හි උකාරයට "වමොදුදන්තානං" යන සූත්‍රයෙන් වකාරව "අනු=පෙ=යොගතො" යි හකාර වකාර විපර්‍යාසව සංහිතව පැමිණ "බව්හාබාධො" යනුවේ.

**"අධි-අභවි"** යනතන්හි "අධි" ශබ්දයට "අනු=පෙ=යොගතො" යි "අඩ" යනාදේශව ස්වරයා පරකල්හි පූර්වස්වරයට ලොප්ව පරස්වරයට "දීඝං" යි දීර්ඝව පරක්ඛරයා කරපැමිණ "අඩාභවි" යනුවේ

**"සුඛං-දුක්ඛං-ජීවො"** යනතන්හි මූලදෙපසෙහි බ්‍යඤ්ජනයා පරකල්හි නිග්ගහිතයට "අනු=පෙ=යොගතො" යි එකාරයදු "ජීවො" යනතන්හි පද්‍යන්ත ඕකාරයට එකාරයද කොට මූලදෙපසෙහි පූර්වස්වරලොප්ව පැමිණ "සුඛෙ දුක්ඛෙ ජීවෙ" යනුවේ.

**"පරි-බොධො, පරි-දාහො"** යනතන්හි බ්‍යඤ්ජනයා පරකල්හි රකාර දකාරයන්ට "අනු=පෙ=යොගතො" යි ළකාරව "පළිබොධො පරිළාහො" යනුවේ.

"මං-අභාසි, බුධං-සරණං" යනතන්හි මූලදෙපසෙහි සවර ව්‍යජනයන් පරකල්හිද අනත්‍ය පක්‍ෂයෙහි අන්‍තයෙහි සිටි නිග්‍ගහිත යටද "අනු=පෙ=යොගතො"යි මකාරව "මම් අභාසි, බුධම්, සරණම්" යනුවේ.

"තං-ඉමිනා" යනතන්හි සවරයා පරකල්හි නිගගහිතයට "මද සරෙ"යි දකාරව පරසවරයට "අනු=පෙ=යොගතො"යි අකාරව පැමිණ "තදමිනා" යනුවේ.

"එවං-ඉමං, කිං-අහං" යනතන්හි සවරයා පරකල්හි නිගගහීතයට "කචි ලොපං"යි ලොප්ව පරඉකාරයට "අනු=පෙ=යොගතො"යි උකාරය හා අකාරයට එකාරව පූර්වසවර ලොප්ව පැමිණ "එවුමං, කෙහං" යනුවේ.

"පටිසඞ්ඛාය-යොනිසො" යනතන්හි ව්‍යජනයා පරකල්හි පූර්ව යකාරයට "අනු=පෙ=යොගතො"යි ලොප්ව "පටිසඞ්ඛායොනිසො" යනුවේ.

"අලාබූනි සිදනති" යනතන්හි ව්‍යජනයා පරකල්හි පූර්ව අකාරයට "අනු=පෙ=යොගතො"යි ලොප්ව "ලාබූනි සීදනති" යනුවේ.

"අකරම්හසෙතෙ" යනතන්හි සකාරයෙහි ගුරුවූ එකාරයට "අනු=පෙ=යොගතො"යි ලහුවූ අකාරයෙක්ව "අකරම්හසතෙ" යනුවේ.

සඤ්ඤාවිධානං සරසන්ධි සන්ධි
නිසෙධනං ඛ්‍යජනසන්ධිසන්ධි,
යො නිගගහිතස්ස ච සන්ධිකපෙප
සුනිච්ඡයො සොභි මයෙත්ථ වුත්තො.
පචාමිස්සකසන්ධි නිමි.

——o——

"ජිනවචන යුත්තං හි" යනු අධිකාර සූත්‍රයි-ජිනවචනයුත්තං හි ඉති, "ජිනවචනයුත්තං හි" යනු; සබ්බත්ථ, හැමතන්හි; අධිකාරො, සම්බන්ධකරණුලැබේ. "ජිනවචනයුත්තං" යනු ප්‍රථමෛක වචනාන්තයි. "හි" යනු නිපාතයි—දෙවපුත්තාදිමාරෙ විධමනාදිවසෙන ජිතාවාති ජිනො, පාපකෙ අකුසලෙ ධම්මෙ අජිනි ජිනාති ජිනිස්සතීති වා ජිනො, ජිනස්ස වචනං=ජිනවචනං, ජිනවචනස්ස යුත්තං=ජිනවචනයුත්තං.

"ලිඞ්ගඤ්ච නිපච්චතෙ" යනු පරිභාෂා සූත්‍රයි. "ලිඞ්ගං" යනු ප්‍රථමෛක වචනාන්තයි. "ච" යනු නිපාතයි. "නිපච්චතෙ" යනු ආඛ්‍යාත පදයි-ලීනං අත්ථං ගමයතී බොධයතීති ලිඞ්ගං.

**රුක්ඛාදි වචනං ලිඞ්ගං ලිඞ්ගත්ථො තෙන දීපිතො**
**එවං ලිඞ්ගඤ්ච ලිඞ්ගත්ථං ඤත්වා යොජෙය්‍ය පණ්ඩිතො.**

ජිනවචනයොග්ගං, සර්වඥවචනයට සුදුසුවූ; ලිඞ්ගං, ලිඞ්ගය; ඉධ, මේ කාත්‍යායනයෙහි; ඨපීයති, තබනුලැබේ; නිප්ඵාදියතිච, නිපදවනුද ලැබේ.

**“තතො ච විභත්තියො”**යනු විධිසූත්‍රයි-“තතො” යනු **පඤ්චම්‍ය** ර්ථයෙහි නිෂ්පන්න නිපාතයි. “ච”යනු නිපාතයි. “විභත්තියො” යනු ප්‍රථමා බහුවචනාන්තයි. “තතො” යනු අවධිනිර්දේශයි. “ච” යනු සමුච්චය නිර්දේශයි. “විභත්තියො” යනු කාර්‍ය්‍යීනිර්දේශයි-**එකම්පි අත්ථං කම්මාදිවසෙන එකත්තාදිවසෙන ච විභජන්ති විවිධා භාජෙන්තීති විභත්තියො**-තස්මා ලිඞ්ගාපරා, ඒ ලිඟුහුකෙරෙන් පරව; විභත්තියො හොන්ති, විභක්තීහු වෙත්. චකාරෙන, චග්‍රහණයෙන්; තාසං, ඒ විභක්තීන්ට; එකවචන පඨමාදිසඤ්ඤාච, එකවචන බහුවචන සංඥාවෝ හා ප්‍රථමාදිසංඥාවෝද වෙත්-තාසං, ඒ විභක්තීන්ගේ; අනියමප්පසඞ්ගෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි; වත්තිච්ඡාවසා, වක්තෘහුගේ විවක්‍ෂාවශයෙන් වෙත්-සො, යමෙක්; කම්මකත්තාදි; කර්මකර්තෘ ආදීවූ; අවත්ථන්තරං, අන්‍යඅවස්ථාවකට; අප්පත්තො, නොපැමිණියේද; සසරූපට්ඨො, ස්වකීය රූපයෙන්ම සිටියේද; සුද්ධො, ශුද්ධද; හෙවත් කර්මාදීන්හා අමිශ්‍රද; සො, හෙතෙම; ලිඞ්ගත්ථො නාම, ලිඞ්ගාර්ථනම්වේ. තස්ස, ඒ ලිඞ්ගාර්ථයාගේ; අභිධානමත්තෙ, කථනමාත්‍රයෙක්හි-තස්සා අපි, ඒ ප්‍රථමා විභක්තිහුගේද; අනියමෙ, අනියමින් ප්‍රාප්තියක් ඇති කල්හි; එකම්හි වත්තබ්බෙ, වක්තෘහු එකාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණු කැමතිකල්හි; එකවචනං, එකවචනවූ; සි, සිවිභක්තියවේ· අනෙන, මොහුකාරණකොටගෙණ; වුච්චතෙඉති, කියනුලැබේනුයි; වචනං, වචනනම්වේ-තස්මිං කතෙතු, ඒ පූර්වස්වරය ලොප්කළකල්හි වනාහි; ක්වචාදිනා, ක්වචාදිසූත්‍රයෙන්;-යුත්තෙන, යුක්තස්ථානයෙහි; පරං, පරස්වරයාකරු; නයෙ, පමුණුවන්නේය-අග්ගයො,, “අග්ගයො” යන තන්හි(යොවිභක්තියට ආකාර එකාර නොවන පිණිසයි)-අභිමුඛීකරණං, අනභිමුඛයා අභිමුඛකිරීම; ආලපනං, ආලපන නම් වේ; තදධිකෙ, ඒ ආලපනාර්ථය අධිකකොටඇති-ගපරෙ, ගසංඥයපරකල්හි; අකාරෙ, අකාරය; පිතු, පිතුසබ්දය; සත්ථු, සත්ථුශබ්දය; අත්ත, අත්ත ශබ්දය; රාජාදීනං, රාජශබ්දය යන මේ අදීන්ගේ; අන්තොච, අන්ත ස්වරයද; අත්තං, අකාරාදේශබවට; යාති, පැමිණේ-සො, “සො”යන සූත්‍රය; සිං, “සිං” යන සූත්‍රය; සඛාච, “සඛාච” යන සූත්‍රය; සඛාතො ගයස්සවා, “සඛාතො ගස්සෙවා”යන සූත්‍රය; ඉති ආදිනිද්දිට්ඨෙහි, මේ

ආදීන් දක්වන ලද්දවුන් කෙරෙන්; අසෙසඥ, අනන්‍යවූ; අවණ්ණ, අවණ්ණාන්තනාමය; ඉවණ්ණ, ඉවණ්ණාන්තනාමය; උවණ්ණ, උවණ්ණාන්තනාමය; ඔකාරන්තා,ඔකාරන්තනාමය යන මොවුහු; සෙසා, ශෙෂයෝ නම් වෙති; තෙහි,ඒ ශෙෂයන්කෙරෙන්; පරෙ, පරවූ; ගසි, ගය සිය යන දෙදෙන; ලුප්‍යනෙත, ලොප්කරණු ලැබෙත්-යො, යමෙක්; කරෙනි, කෙරේද; සො, හෙතෙම; කඤ්ඤා නාම, කඤ්ඤා නම්වේ.

"අපෙතා නෙන"යනු විධිසූත්‍රයි, ත්‍රිපදයි. අපෙතා යනු පචම්‍ය ර්ථයෙහි නිෂ්පන්න නිපාතයි, නා යනුද එන යනුද ප්‍රථමෛකවච නාන්තයි. අපෙතා යනු අවධිනිර්දේශයි, නා යනු කාරිනිර්දේශයි, එන යනු කාර්‍ය්‍යනිර්දේශයි-"දත්‍යකාමො වා භරිමනො වා ධාරයතො වා"යි ව්‍යාකාරය තෙතැන්හිම යොදනු-වසයෙදන,වශබ්දග්‍රහණයෙන්; ඝාවි, ඝිසිතැනෙක්හි; න, දීර්ඝනොවේ-යසමා, යමක්හුකෙරෙන්; අපෙතිවා, පහවන්නේ හෝ වේද; භයං, බිය උපදින්නේ හෝ වේද; ආදනෙතාවා, ගන්නේ හෝ වේද;'තං, ඒ; අපාදනංනාම, අපාදන නම්වේ; තස්‌ම, ඒ අපාදනාර්ථයෙහි; පචම්හොති, පචම්විභක්තිවේ.

බුද්ධො, සර්‍වඥතෙම; බුධ,ප්‍රිත්වත්වූ සර්‍වඥය; බුධං, සර්‍වඥයා; සරතො, සිහිකරන්නාහට; සුඛං, ඓහලෞකික පාරලෞකිකසැපය; දදති, (යම්හෙයකින්) දේද; තතො, එහෙයින්; බුද්ධෙන, සර්‍වඥයා විසින්; දුක්කරං, නොකොටහැක්කේ; කිං, කිම; (සිහිකරන්නාහට පවා සැපදෙන බැවින් ඔහුවිසින් නොකොට හැක්කෙක් නම් නැත එහෙයින්) බුද්ධෙන, සර්‍වඥයා කරණකොටගෙණ; මහිද්ධයො, මහත්වූ ඍද්ධිඇති; මුනයොඅපි, ශාරිපුත්‍රමෞද්ගල්‍යා යනාදීවූ මහාශ්‍රාවකයෝ පවා; සුඛිතා, සුවපත්වූහ; හෙවත් නිර්‍වාණ සුඛප්‍රාප්තවූහ; තතො, එහෙයින්; බුද්ධස්සඑව, සර්‍වඥයාහටම; මනං, සිත; දදෙ, දෙම්, හෙවත් බුදුන් සිහිකරමි; (එහෙයින්) බුධා, සර්‍වඥයාකෙරෙන්; අච්චුතං, ච්‍යුති රහිතවූ; පදං, නිර්‍වාණපදය; අහං, මම; ලභෙය්‍යං, ලබමි; (සිහිකළ පමණකින්ම නිවන් ලැබේදයත්) බුද්ධස්ස, සර්‍වඥයාගේ; ඉද්ධි, ඍද්ධි තොමෝ; කිංනකරෙ, කුමක්නම් නොකරන්නිද (හැමකරන්නීය එහෙයින්) මම, මාගේ; භත්ති, භක්තිතොම; බුද්ධෙ, සර්‍වඥයාකෙරෙහි; භව භවෙ, ජන්ම ජන්මයෙහි; අත්‍ථු, වේවා.

සරූපනා, සමානස්වරූප ඇතිබැවින්-පකෙබ, එක්පක්‍ෂයෙක්හි; ජිනවචනානුරොධෙන, සර්‍වඥවචනයට අවිරුද්ධවූ පරිද්දෙන්; එනානාවො. එන යනාදෙශයාගේ නොහ්ම වේ-අනත්තානං ඉති, "අනත්තං" යන; භාවනිද්දෙසෙන, භාවනිර්දේශයෙන්; සුමනිච, සුවිභක්ති

**පරකල්හිද; අතො, අත** යනාදෙශවේ-**සුනංහිසුයොසු, සුය නංය හිය යොය** යන මොවුන් පරකල්හිද; චකාරෙන, චග්‍රහණයෙන්; අඤ්ඤෙසුපි පරෙසු, සෙසු විභක්තීන් පරකල්හිද; නත්තුස්ස, නත්තුශබ්දයාගේ; අතෙනා, අන්තය තෙම; අත්තං, අකාරාදෙශබවට; **යාති, පැමිණේ-වුත්තං** හිත්වා, කියනලද **සිවිභක්ති** හැර; **සෙසෙසු, සෙසු** විභක්තීන් **පරකල්හි-කතො**, කරණලද; **තිකාරෙ, තිකාරාදෙශද**; **ලොපොච**, ලොපද; යෙසං, **යම්කෙනෙකුන්ටද**; තෙසු යොසු, **ඒ යො** විභක්තීන් පරකල්හි; සරානං, ස්වරයන්ට; **දීඝො හොති, දීඝවේ**-, අකතරස්සො, නොකරණලද හ්‍රස්වඇති-සිතො, **සිවිභක්ති කෙරෙන්**; අඤ්ඤෙසු, සෙසුවිභක්තීන් පරකල්හි-නාමෙහි, **නංවිභක්ති පරකල්හි**; පිතුනං ඉති අපි හොති, **පිතූනං** කියාදවේ-අම්හිපරෙ,අංවිභක්ති පර **කල්හි**; ගොසද්දොකාරස්ස, **ගොශබ්දයා** සම්බන්ධිවූ ඔකාරයට; **ආව අවාහොන්ති,ආවය අවය** යන මොවුහු වෙති; චසද්දෙන,**චශබ්දග්‍රහණ යෙන්**; හිනංවජ්ජිතෙසු, **හිය නංය** යන මොවුන් වර්ජිතකොට ඇති; සෙසෙසුඅපි, සෙසුවිභක්තීන් පරකල්හිද **(ආවය අවය යන** මොහු වෙත්)-නතොනමාදෙ, නතොනමාදි සූත්‍රයෙහි; චකාරෙන, **චශබ්ද** ග්‍රහණයෙන්; නංඉති, **නංයන**; අස්ස,මෝහාව; අං, **අංයනාදෙශද**; **ඔස්ස**, ගොශබ්දයාගේ ඔකාරයහට; අවොච, **අවයනා** දෙශදවේ.

**පුංලිඞ්ග නාමයෝ කියා නිමවනලද්දහ.**

---

අසන්තා, සසදනොවන බැවින්; රස්සොච, හ්‍රස්වයම; විසෙසො, වෙනසි-අනාදිතො, අනාදීන් කෙරෙන් පර (ඊ ප්‍රත්‍යයට උදාහරණ දක්වනු ලැබේ)

**ස්ත්‍රීලිඞ්ග නාමයෝ කියා නිමවන ලද්දහ.**

---

නිච්චං, අවිකල්පයෙන්—විභත්තාදෙසෙ, විභක්තියට ආදෙශවූ; සරෙ පරෙ, ස්වරයා පරකල්හි; මනාදිතො, **මන** ශබ්දාදීන් කෙරෙන් **පරව; වා, විකල්පයෙන්**; සාගමො හොති, සකාරයෙක් ආගමවේ.

මනං, සිතකියන **මන** ශබ්දය; සිරං, හිස කියන **සිර** ශබ්දය; උරං, ලයකියන **උර** ශබ්දය; තෙජං, තෙජස් කියන **තෙජ** ශබ්දය; රජං, රජස්කියන **රජ** ශබ්දය; ඔජං, ඔජස්කියන ඔජ ශබ්දය; **වයං**, වයස්කියන **වය** ශබ්දය; පයං, කිරිකියන **පය** ශබ්දය; **යසං, යශස්**

කියන සඝ ශබ්දය; තපං, තපස් කියන තප ශබ්දය; වචං, වචන කියන වච ශබ්දය; චෙතං, චෙතස කියන චෙත ශබ්දය යන; එවංආදි, මොවුන් ආදිකොට ඇති ශබ්දයෝ; මනොගණො, මනොගණ නම්වෙත්.

අංනපුංසකෙහි ඉති, "අංනපුංසකෙහි" යන සූත්‍රයෙන්; සිලොපි, සිවිභක්ති පරකල්හි; සවිභත්තිස්ස, විභක්ති සහිතවූ; නන්තස්ස, නන්ත ප්‍රත්‍යයට; අං, අං යනාදෙශවේ.

## නපුංසක ලිඞ්ගනාමයෝ කියා නිමවන ලද්දුහ.

---

සට, කළය කියන සට ශබ්දය; කට, කළාල කියන කට ශබ්දය; යභි, යට කියන යභි ශබ්දය; මුට්ඨි, මිට කියන මුට්ඨි ශබ්දය; සින්ධු, සාගරය කියන සින්ධු ශබ්දය; රෙණු, රොණු කියන රෙණු ශබ්දය යන; පහුතයොච, මේආදී ශබ්දයෝද; ද්විපදචතුප්පදජාතිවාචිනොච, ද්විපාද චතුෂ්පාද ජාතිවාචී ශබ්දයෝද; පුම්ත්ථිලිඞ්ගා, පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග ඇත්තාහුයි-අස්සම, ආශ්‍රමපදය කියන අස්සම ශබ්දය; භවන, ගෘහය කියන භවන ශබ්දය; නට, ඉවුර කියන නට ශබ්දය; පුට, පත්‍රපුටය කියන පුට ශබ්දය—නාමිකතා, නාමිකෘත ශබ්දයෝද—නිසෙධා, ප්‍රතිෂෙධ සූත්‍රය හෙතුකොටගෙණ-එකසද්දො, එක ශබ්දයතෙම; සඞ්ඛ්‍යා, ගණනය; අතුල්‍ය, අසදෘශය; අසදිසෙ, අතිකෙක; අසහායත්ථෙ, අසහාය යන මොවුන් අර්ථකොට ඇත්තේය; යදා, යම්කලෙක්හි; සඞ්ඛ්‍යත්ථෙ, සඞ්ඛ්‍යාව අර්ථකොට ඇත්තේද; තදා, එකල්හි; එකවචනො, එක වචන ඇත්තේවෙයි; අඤ්ඤදත්ථෙ, සෙසු තන්හි; සබ්බවචනො, සියලු වචන ඇත්තේවේ-නතතංච, නකාරබවම; විසෙසො, වෙනසි-අන්තපකෙඛ, අකාරාදෙශකළ පක්ෂයෙහි; ලිඞ්ගත්තයෙ, පුංස්ත්‍රී නපුංසක සඞ්ඛ්‍යාත තුන් ලිඟුයෙහිම; සමං, විභක්තිරූප සමයි-අත්ථජොතකා, අර්ථයන් ප්‍රකාශකරන්නාවූ; වණ්ණා, අක්ෂරයෝ; පදං, පදනම්-එසො අම්හාකං සත්ථා, "එසො අම්හාකං සත්ථා" යනතන්හි (වොණො යනාදෙශ නොවන පිණිසයි)-බහුවචනෙන, බහුවචන ග්‍රහණයෙන්; පඨමෙ යොවිහිච, ප්‍රථමා යො විභක්ති පරකල්හිද (වොණො යනාදෙශවේ)-අයං, මේසූත්‍රය; එදීඝානං, එකාරය දීඝය යන මොවුන්ට; අපවාදො, බාධකයි-ආනවුහියා, නවුති ශබ්දය දක්වා පැවති ශබ්ද-රාසිභෙදෙතු, ගණභෙදයක් ඇතිකල්හි වනාහි.

යත්ථෙසු, යම් යම් අර්ථයන්හි; එසා, මේය; එසො, මෙතෙමේය; එතං ඉති, මේයයි යන; පසිද්ධි, ප්‍රසිද්ධිතොමෝ; ලොකස්ස, ලොකයාහට; හොති, වේද; තානි ඉමානි අත්ථා, ඒ මේ අර්ථයෝ; ලොකෙන, ලෝවැස්සා විසින්; පිපුම නපුංසකානි ඉති, ස්ත්‍රීපුං නපුංසකයෝයයි; වුච්චනෙත, කියනුලැබෙත්.

තස්මා, එහෙයින්; තදන්තාතමපි, ඒ තො ප්‍රත්‍යයාදීන් අන්ත කොට ඇත්තවුන්ටද; විභත්‍යන්තතායං, විභක්තීන් අන්තකොට ඇති බැවින්; පදත්තං, පදබව; සිචං ඉති, සිද්ධනුයි; පුන, නැවත; තවිභ ත්‍යාදි, විභක්ති නොවේ-සත්‍යාමත්‍යත්ථෙව, සත්‍යාමි අවියෙහිද; තොහො ති, තො ප්‍රත්‍යය වේ-කකාරකාරලොපෙ, කකාරයෙහි අකාරයට ලොප්කල කල්හි; හිංචනං දචනං සු ච, **හිංචනං දචනං** ප්‍රත්‍යයන් පරකල්හිද (**කිං** ශබ්දයට **කු** යනාදෙශවේ)

**"සබ්බාස්මාවුසොපසග්ගනිපාතාදීහි ච"** යනු විධිසූත්‍රයි— "සබ්බාසං" යනු ෂෂ්ඨී බහුවචනාන්තයි. "ආවුසොපසග්ගනිපාතාදීහි" යනු පඤ්චමී බහුවචනාන්තයි. "ච" යනු නිපාතයි. "සබ්බාසං" යනු කාර්‍ය්‍යීනිර්දේශයි. "ආවුසොපසග්ගනිපාතාදීහි" යනු අවධිනිර්දේශයි. උපසග්ගා ච නිපාතා ච=උපසග්ගනිපාතා, උපසග්ගනිපාතා ආදී යෙසං තෙ=උපසග්ගනිපාතාදයො, ආවුසො ච උපසග්ගනිපාතාදයො ච=ආවුසොපසග්ගනිපාතාදයො, තෙහි ආවුසොපසග්ගනිපාතාදීහි.

උපෙච්චත්ථං සජන්තීති උපසග්ගා හි පාදයො,
චාදී පදාදිමජ්ඣන්තෙ නිපාතා නිපතන්ති හි.

සන්තමෙව හි නීලාදිවණ්ණං දීපාදයො විය,
ධාතුසම්ං සන්තමෙවත්ථං උපසග්ගා පකාසකා.

ධාත්වත්ථං බාධතෙ කොචි කොචි තං අනුවත්තතෙ,
තමෙවඤ්ඤො විසෙසෙති උපසග්ගගතී තිධා.

උපසග්ගා නිපාතා ච පච්චයා ච ඉමෙ තයො,
නෙකෙ නෙකත්ථවිසයා ඉති නෙරුත්තිකාබ්‍රවුං

පසද්දො සද්දිතො චෙව පකාරත්ථෙ ච සම්භවෙ,
ආදිකම්මප්පධානන්තොභාවතප්පරතාසු ච,
වියොගපත්ථනාතිත්ති භුසත්ථානාවිලාදිසු.

පරාති පරිහානිම්හි පරාජයගතිස්වපි,
වික්කමාමසනාදීසු විහනතීති විනිද්දිසෙ.

නිස්සෙසනිග්ගතාභාව නිසෙධන්තොපවෙසනෙ,
නික්ඛන්තපාතුභාවෙසු උපමානුපධාරණෙ.

නිහරණාවසානෙසු නිසද්දො ජෝතකාදිසු,
නීති නියරණත්ථා ච නිවත්තාවරණාදිසු.

උ උග්ගමෙ පධානෙ ච අත්ථලාභෙ ච සත්තියං,
උග්ගතෙ සම්භවෙත්ථ ච වියොගකථනාදිසු.

කුච්ඡිතාසොභනාභාව විරූපත්තාසම්බිසු,
කිච්ඡාදිසු ච අත්ථෙසු දූසද්දො සමුදීරිතො.

සම්මා සම සමන්තත්ථ සහපඤ්ඤත්තාසම්බිසු,
පභවාභිමුඛත්ථෙ ච සඞ්ගහෙචාපි සඞ්ගතෙ.

පොනොපුඤ්ඤෙ ච සඞ්ඛෙපෙ භුසත්ථෙ විස්සුතාය ච,
සමොධාන පිධානාදීස්වත්ථෙසු සමුදීරිතො.

විසෙසෙ ච විරුද්ධෙ ච වියොගෙ විගතෙපි ච,
විරූපතායං විවිධෙ විසද්දො සමුදීරිතො.

අවසද්දො අධොභාව වියොගෙ සුද්ධිනිච්ඡයෙ,
ජානනෙ දෙසථෙය්‍යෙසු පරිභාවාදෙ පවත්තතෙ.

භුසත්ථෙ හීනසාදිස්ස තතියත්ථෙසු ලක්ඛණෙ,
ඉත්ථම්භූතස්ස අක්ඛ්‍යානෙ අනුසද්දොනුගමෙ තථා,
භාගවිච්ඡානුපච්ඡින්න පච්ඡාදිසු ච වත්තතෙ.

සමන්තත්ථෙ පරිච්ඡෙදෙ වජ්ජනාලිඞ්ගනෙසු ච,
නිවාසලක්ඛණත්ථෙසු දොසක්ඛානාවජානනෙ,
පරිසද්දො තථාපූජා භොජනාදිසු වත්තති.

අධිකිස්සරපරිභාවා ධිට්ඨානාධිභවෙසු ච,
නිච්ඡයජ්ඣායනත්ථෙසු පාපුනාදිස්වධීරිතො.

විසිට්ඨානත්ථාභිමුඛෙ කුලසාරූප්පලක්ඛණෙ,
අභික්කමිත්ථම්භූතක්ඛානවිච්ඡාස්වභීරිතො.

පටිගතෙ පටිලොමෙ ච පරිදානෙ නිවත්තනෙ,
පතිනිධිම්හි ච සාදිස්ස නිසෙධාදානලක්ඛණෙ.

පටිදපතිකාරෙසු විච්ඡායං පටිබොධනෙ,
භාගිත්ථම්භූත අක්ඛාන අත්ථාදිසු පතීරිතො

සුසද්දො සොභනෙ සුට්ඨුසම්මාසුඛසමිද්ධිසු,
ආපරිස්සජනව්හානෙ සමීපාභිමුඛෙසු ච.

මරියාදාභිවිධිච්ඡාසු නිවාසාදානපත්තිසු,
උද්ධකම්මාදි කම්මාදිස්වත්ථෙසු ච විධීයතෙ.

අති තිසයන්තික්කන්තභුසත්ථාතික්කමාදිසු
අපි සම්භාවනාපෙක්ඛානින්දාපඤ්හසමුච්චයෙ.

ගරහාපගතපූජාසු වජ්ජනෙ ච පදුස්සනෙ,
අප සද්දො තු විඤ්ඤෙය්‍යො සම්පොපගමෙසුප.

දෙසක්ඛානොපපත්තීසු ගය්හාකාරාධිකෙසු ච,
සාදිස්සාපරිතාපුබ්බකම්මෙමස්වතසනෙපි ච
සඤ්ඤාපූජාථුසත්ථාදිසච්චත්ථෙසු සමුදීරිතො.

## ඔපසග්ගිකපදං

නෙපාතිකපදංදානි පවක්ඛාමි සමාසතො,
අසත්ථවාචිකං තච අලිඞ්ගාසඞ්ඛ්‍යමව්‍යයං.

පදත්තපූරණං කිඤ්චි කිඤ්චි අත්ථස්ස පූරණං,
පාදපූරණමඤ්ඤඤ්චාති නෙපාතිකපදං තිධා

ඉතරීතරයෝගෙ ච සමාහාරෙවධාරණෙ,
සමුච්චයාන්වාචයාදෙ චසද්දො සමුදීරිතො.

විකප්පතුප්මානෙසු වාසද්දො තු සමුච්චයෙ,
වවත්ථිතවිභාසාදි සවෙත්ථෙසු ච පවත්තති.

නාලංහලම්මානො ච පටිසෙධත්ථවාචකා,
අලන්ති පරියත්තිම්භි භූසනෙපිච වත්තති,

පටිසෙධවුඩ්ඪිතබ්භාවෙ අඤ්ඤත්ථෙ සදිසෙපිච,
විරුද්ධෙ ගරහෙ සුඤ්ඤෙ අකාරො විරහප්පකෙ.

අථො වත තථා බලවස්සුතං නං ච තුවො පන,
හඤ්ච කීවහ යග්ඝෙ හි මනං ඛො වෙ තතො යථා.

සුදං චරහිහං සෙය්‍යපිදං වතපි ආදයො,
පදපූරණමත්තත්ථා නිපාතානි පකාසිතා.

අථොති අන්වාදෙසෙ ච නිපාතො තෙසු දස්සිතො;
බෙදනුකම්පාසඞ්ඛාපෙපකංසනෙත්ථ ච වත්රිතො.

අථාති අධිකාරත්ථෙ පඤ්හා වානන්තරාදිසු,
බද්ධූති ච පයිඞ්මහි පටිසෙධාවධාරණෙ.

පහසඳ්දෙ විසේසනේ තුසද්දෙ තු නිවත්තනෙ,
අථො විසෙසහෙතුමහි භාවෙවෙකංසතාදිසු.

විකප්පෙයං තං කථං තෙන සෙය්‍යථිදං තිහම්පන,
වත්තනෙ සම්භවෙ භියෙ‍ායොධිකෙ පිති සමුච්චයෙ.

දුවිධත්ථපූරණං වුත්තං යොගායොගවිභත්තියා,
සක්කාවීති ලබ්භා ඉච්චෙතෙ පය්‍යායං ස්මිරිතා.

අම්භො හො ආවුසො හම්භො අරෙ රෙ ජෙ හරෙ ඉති,
භෙ ආමන්තනෙ දිවා හියෙ‍ායො නමො චාදෙ විසුච්චතෙ.

සම්මා සාමං සයං තිතති සං සො තො ධා ච පච්චයා,
තතියත්ථෙ චතුත්ථ්‍යත්ථෙ තවෙතුංපච්චයන්තකා.

සො තො පඤ්චම්‍යා අත්ථෙ සත්තම්‍යත්ථෙ ච තො සියා,
ත්‍රථහංහිංහධාදයන්තා සත්තම්‍යත්ථස්ස ජොතකා.

සමන්තතො එකමන්තං එකජ්ඣං පරිතො පරි,
හෙට්ඨා සමන්තා සාමන්තා උච්චං නීචං තිරො රහො.

අභිතො පරම්මුඛා උද්ධං අධො තිරියමන්තරා,
සම්මුඛා අන්තරං අන්තො බහිද්ධා බාහිරා බහි.

බාහිරං ආවි අජ්ඣත්තං ඔරපාරං පුරෙ හුරං,
ආරා (ච) ආරකා පච්ඡා පෙච්ච සත්තමියා සියුං.

අජ්ජ පරජ්ජු සජ්ජු සෙව සුවෙ හියෙ‍ායො පරෙ දිවා,
අභිණ්හං සතතං නිච්චං කාලං කල්ලමභික්ඛණං.

තදනන්තර සුවෙ පාතො සායං සම්පති ආයති,
මුහුං මුහුත්තකඤ්ච යදා භූතපුබ්බං පුරා තදා.

යාවදෙව තාවදෙව යාවදෙ තාවදෙ පිච,
තංධුනාදනිරත්‍යන්තා කාලසත්තමියා සියුං.

විභත්තියුත්තානෙතානි නිපාතානීති දීපයෙ,
සොභනෙසච්චති සොත්ථිච ආමන්තා සම්පටිච්ඡනෙ.

අප්පෙවනාම අප්පෙව නුසද්දෙ සංසයෙ මතා,
අද්ධා තග්ඝ ජාතුකාමං සස්සකං අංසද්දඤ්ච.

ඉච්චෙව මෙතෙකංසත්ථෙ එව ඉත්‍යවධාරණෙ,
නනු කච්චිනු කිං කිංසු කථං කිමනු පුච්ඡනෙ
ඉත්ථමෙවමිත්වෙවතෙ සමුද්දිට්ඨා නිදස්සනෙ,

ඉතිවාක්‍යපරිසමත්තිහෙතුවත්ථෙසු ච වත්තති,
චයාභාවෙ මුද්ධා ගීයෙය්‍යා සොමත්තායාති වාධිකෙ.

යාවතා තාවතා යාව තාව කිත්තාවතා පිව,
කීව එත්තාව කීවෙතෙ පරිච්ඡෙදත්ථවාචකා.

එවං ඔපායිකං සාහු ආම සාධු ලහුපිච,
පතිරූපන්ති එත්තෙ තු නිපාතා සම්පටිච්ඡනෙ.

එවමෙවං එවමෙව යථෙවෙවං තථෙව ච,
යථා තථා සෙය්‍යථාපි යථාතථරිවාපි ච.

යථානාම සෙය්‍යථාපිනාමා විය යථාහිව
යථරිව එවමෙවෙති යථාතථරිවාදයො

නිපාතා තෙ සමුද්දිට්ඨා පටිභාගත්ථවාචකා,
අනන්තරවිකප්පත්ථෙ අථවාති විධීයතෙ.

යථාති යොග්ගතා වීච්ඡා පදත්ථා නාතිවත්තති,
සුදස්සනෙ ච සබ්බඤ්ඤූති හුතත්ථායං සම්මතො.

එවමිත්‍යුපදෙසෙ ච පඤ්හාදිසු ච වත්තති,
පසංසා පත්ථනා නින්දා සහොති ලාප්‍යනුග්ගහෙ.

නාමසඤ්ඤා පසංසාසු නින්දාපඤ්හාසු වත්තති,
සාධුඉති පසංසායං වත්ථාතායාචනෙපි ච.

එවමෙතං සාධුසුට්ඨු සඤ්ඤා චුත්තානුමොදනෙ,
තුනං පරිච්ඡිතකකත්ථානුමානානුස්සතීසු ච.

අසද්ධෙය්‍යානුස්සවෙසු කිර නින්දුයම්මතො,
කස්මා කාරණපුච්ඡායං ඉධඝහන්දහ චොදනෙ.

කාරණච්ඡෙදනෙ යස්මා තස්මා තෙන තථාහිති,
සමක්‍රියායන්තු අමා සහ සද්ධිං සම්මතො,

විසුං පුථු අසඞ්ඝාතෙ විප්පයොගෙ විනා රිතෙ,
බහුප්පකාරෙ පුථුනානාසඤ්ඤා සුට්ඨුතු කුච්ඡිතෙ.

පුන අප්පථමෙ චුත්තං විච්ඡත්ථෙසු කාචිති,
ධාකබත්තුං සකිං සඬ්ඛා විභාගත්ථස්ස ජොතකා.

ඊසකං අප්පමත්තෙසු මන්දත්ථෙ සනිකං ඉති,
ආසුතුනනාවරං ඛිප්ප මචිරං තුවටං ලහු.

සීඝත්ථෙ දීඝකාලෙ ච චිරස්සං චිරම්රිතං,
සචෙ චෙ යදි සද්ධ තු සම්භාවනත්ථවාචකා.

පිරාවධාරණත්ථෙසු ධුවං තණ්හි අභාසනෙ,
භාවසාපෙධලිකං විච්ඡා මුසාසච්චෙසු චන්තරෙ.

පුච්ඡත්ථ්‍යාසිංසනෙ සච්ඡි සක්ඛිපච්චක්ඛවාචකා,
ඡා තුන ඡානමනන්තානි නිපාතානුස්සනෙ සියුං.

වුත්තා පදනනායා තස්මා නිපාතාත්‍යනන්තරත්තරා,
නෙපාතිකනාති තං වුත්තං යං අව්‍යයසලක්ඛණං.

## නෙපාතිකපදං.

යෙ, යම් ශබ්දයෙකෙනෙක්; තිලිඞ්ගෙසු, ස්ත්‍රීපුනනපුංසක සඞ්ඛ්‍යාත තුන්ලිඟුයෙහිද; සබ්බාසු විභත්තීසු ච, ප්‍රථමාවිතීයාදි සියලු විභක්ති වලද; සබ්බෙසු වචනෙසු ච, ඒකවචන බහුවචන සඞ්ඛ්‍යාත සියලු වච නයන්හිද; සදිසා, සමානස්වරූප වෙත්ද;තෙ, ඔහුතුමූ; නිපාතා ඉති, නිපාතයෝයයි; කිත්තිතා, කියනලද්දුහ-උච්චං රුක්ඛො උච්චංරු ක්ඛා, "උච්චා රුක්ඛො.උච්චං රුක්ඛා" යනු මෙහි වචනවල සමානභා වයට උදාහරණයි. ලතාසරංවා "උච්චං ලතා උච්චං.සරං" කියාදවේ. (මේ ලිඟුවල සමාන භාවයට උදාහරණයි.)

උභයෙසු, දෙපක්ෂයෙහි (උපසර්ගනිපාතයන් අතුරෙහි); විභත්ති විභක්තිය; අත්ථ, අර්ථය; ක්‍රිය, ක්‍රියාවය; දෙස, ප්‍රදෙශය; සමය, කාලය; දිසා, දිශාය; ගුණත්ථෙහි, ගුණය යන මොවුන් අර්ථකොට ඇති (උපසර්ගනිපාතයන් කෙරෙන් පරව); සබ්බා විභත්තියො, සියලු විභ ක්තීහු; යථායොගං,යෙදෙන යෙදෙන පරිද්දෙන් වෙති;අසඞ්ඛ්‍යෙහිතු, මෙයින් පිටත් උපසර්ගනිපාතයන් කෙරෙන් පරව වනාහි; පඨමා, ප්‍රථමා විභක්ති වේ.

නාමං, නාමයතෙම; එකෙකලිඞ්ගං, එකිඑකී ලිඟුඇත්තේය; විලිඞ්ගං, ලිඞ්ගද්වයක් ඇත්තේය; තිලිඞ්ගං, ලිඞ්ගත්‍රයක් ඇත්තේය; අපි, නැවත; අලිඞ්ගිකං ඉති, ලිඟුනැත්තේයයි; චතුධා, සතර පරිද් දෙකින් වේ; අත්ථං, අර්ථකරා; නමයතීති, නැමේනුයි; නාමං ඉති,නාම යයි; කිත්තිතං, කියනලදී.

**නාමය කියා නිමවනලදී.**

## මෙතැන් පටන් මෙහි පදසිද්ධිය සංක්ෂෙපයෙන් දක්වනුලැබේ.

"බුද්ධො, බුද්ධා" යනතන්හි "ජිනවචනයුත්තං හි" යනු වැටෙන්නෙහි "ලිඞ්ගඤ්ච නිපච්චතෙ" යන පරිභාෂාසූත්‍රයෙන් ජිනවචනානුකූලව "බුධ" යන ප්‍රකෘතිය "බුද්ධ" කියා දෙතැනක වෙයි, ඕහට "පරසමඤ්ඤා පයොගෙ" යන පරිභාෂාසූත්‍රයෙන් ලිඞ්ගසංඥ වෙයි, ඒ ලිඞ්ගනු කෙරෙන් පරව "සියො අංයො නාහි සනං ස්මාහි සනං ස්මිංසු" යන සූත්‍රයෙන් විභක්ති සංඥකරණලද ස්‍යාදීනු "තතො ච විභත්තියො" යන සූත්‍රයෙන් වෙති. ඔවුන්ගේනුදු ප්‍රථමා ද්විතීයාදිවශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "වත්තිච්ඡානුපුබ්බිකා සද්දපටිපත්ති" යනු න්‍යාය හෙයින් වක්තෘහු ප්‍රථමාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි ච ශබ්දග්‍රහණයෙන් ප්‍රථමා සංඥකරණලද සිය යොය යන දෙදෙන "ලිඞ්ගත්ථෙ පඨමා" යන සූත්‍රයෙන් ලිඞ්ගාර්ථයෙහි වෙති. ඔවුන්ගේනුදු එකවචන බහුවචනවශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "එකම්හි වත්තබ්බෙ එකවචනං" යනු න්‍යායහෙයින් වක්තෘහු එකාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණු කැමතිකල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි ච ශබ්දග්‍රහණයෙන් එකවචන සංඥකරණලද සිවිභක්ති එක්තෙනක වෙයි. "බහුම්හි වත්තබ්බෙ බහුවචනං" යනු න්‍යායහෙයින් වක්තෘහු බහ්වර්ථමාත්‍රයක් ප්‍රකාශකරණුකැමති කල්හි "තතො ච විභත්තියො" යන සූත්‍රයෙහි චශබ්දග්‍රහණයෙන් බහුවචන සංඥකරණලද යොවිභක්ති එක්තෙනක වේ. පුල්ලිඞ්ගයෙහි වැටෙන්නාවූ අකාරාන්තනාමයා කෙරෙන් පරවූ සිවිභක්තිහට "සො" යන සූත්‍රයෙන් ඔකාරයෙක් ආදෙශවේ. ආදෙශස්වරයා පරකල්හි පූර්වස්වරයට "සරලොපොමාදෙසප්පච්චයාදිම්හි සරලොපෙ තු පකති" යන සූත්‍රයෙන් ලොප්වේ. පරස්වරයහට "ක්වචාසවණ්ණං ලුත්තෙ" යන සූත්‍රයෙන් අසමාන වර්ණ පත්තෙහි එම අනුවර්තිත තුග්‍රහණයෙන් ප්‍රතිෂෙධ වේ. යට සිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයා කරා පැමිණ විභක්ත්‍යන්තහෙයින් "පරසමඤ්ඤා පයොගෙ" යන සූත්‍රයෙන් පදසංඥව "බුද්ධො" යනුවේ. අකාරාන්තනාමයා කෙරෙන් පරවූ යොවිභක්තිහට "සබ්බයොනීනමාඑ" යන සූත්‍රයෙන් ආකාරයෙක් ආදෙශවේ. ආදෙශ ස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපොමාදෙසප්පච්චයාදිම්හි සරලොපෙ තු පකති" යන සූත්‍රයෙන් ලොප්ව පරස්වරයහට "ක්වචාසවණ්ණං ලුත්තෙ" යන සූත්‍රයෙන් අසමානවර්ණපත්තෙහි එහිව අනුවර්තිත තුග්‍රහණ

යෙන් ප්‍රතිෂේධවේ. ශුට සිටි ස්වරරහිතවූ ව්‍යඤ්ජනතෙම “නයෙපරං යුත්තෙ” යන පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයා කරා පැමිණ විභක්ත්‍යන්තහෙයින් “පරසමඤ්ඤා පයොගෙ” යන සූත්‍රයෙන් පදසංඥව “බුද්ධා” යනුවේ–“බුද්ධො” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ලිඞ්ගාර්ථයෙහි සිද්ධවූ ප්‍රථමා එකවචනාන්තනාමික පදය. “බුද්ධා” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ලිඞ්ගාර්ථයෙහි සිද්ධවූ ප්‍රථමා බහුවචනාන්තනාමික පදයි. බුද්ධො, සර්වඥතෙම; විරොචති, බබලා; බුද්ධා, සර්වඥවරයෝ තුමූ; විරොචන්ති, බබලත්.

**“හෙබුද්ධ බුද්ධා, භවන්තො බුද්ධා”** යනතන්හි සිවිභක්ති දෙතන කහා යොවිභක්ති එක්තෙනකවේ සිහට “ආලපනෙ සි ගසඤ්ඤො”යි ගසංඥව ගසංඥයා පරකල්හි “අකාරපිතාද්‍යන්තානමා”යි ආකාරව ආකාරයහට “ආකාරෙවා”යි විකල්පයෙන් හ්‍රස්වව ශේෂයාකෙරෙන් පරවූ ගසංඥාට “සෙසතො ලොපං ගසිපි”යි ලොප්ව යොහට “සබ්බයොනීනමා ඒ”යි ආකාරව පැමිණ “(හෙ)බුද්ධ බුද්ධා, (භවන්තො) බුද්ධා” යනුවේ “හෙබුද්ධ බුද්ධා” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ආලපනාර්ථයෙහි සිද්ධවූ ප්‍රථමා එකවචනාන්තනාමික පදයි. “භවන්තො බුද්ධා” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි ආලපනාර්ථයෙහි සිද්ධවූ ප්‍රථමා බහුවචනාන්තනාමික පදයි–හෙබුද්ධ බුද්ධා, පින්වත්වූ සර්වඥය; ත්වං, නුඹවහන්සේ; විරොච, බබලනු මැනවි. භවන්තො බුද්ධා, පින්වත් සර්වඥවරයෙනි; තුම්හෙ, නුඹවහන්සේලා; විරොචථ, බබලව්.

**“බුද්ධං බුද්ධෙ”** යනතන්හි අංපරකල්හි පූර්වස්වරයට ලොප්ව පැමිණ යොහට “සබ්බයොනීනමාඒ”යි එකාරව පැමිණ “බුද්ධං බුද්ධෙ” යනුවේ–“බුද්ධං බුද්ධෙ” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි කර්මාර්ථයෙහි සිද්ධවූ ද්විතීයා එකවචන බහුවචනාන්තනාමික පදයි.

**“බුද්ධෙන බුද්ධෙහි බුද්ධෙභි”** යනතන්හි නාවිභක්තිහට “අතො නෙන”යි එන යනාදේශව හිවිභක්ති පරකල්හි අකාරයහට “සුහිස්වකාරෙ ඒ”යි එකාරව හිවිභක්තිහට “ස්මාහිස්මින්නං මහාභිම්හි වා”යි විකල්පයෙන් භි යනාදේශව “බුද්ධෙන බුද්ධෙහි බුද්ධෙභි” යනුවේ–“බුද්ධෙන බුද්ධෙහි බුද්ධෙභි” යනු “බුද්ධ” ශබ්දයහට පුල්ලිඞ්ගයෙහි කර්තෘ අර්ථයෙහි සිද්ධවූ තෘතීයා එකවචන බහුවචනාන්තනාමික පදයි–කරණකාරකයද මෙසේමැයි.

**“බුද්ධාය බුද්ධස්ස බුද්ධානං”** යනතන්හි චතුර්ථී එකවචන සවිභක්තිහට “ආය චතුත්ථෙකවචනස්ස තු”යි විකල්පයෙන් ආය යනාදේශව පසෙක්හි “සාගමො සෙ”යි සකාරාගමව නං පරකල්හි ශබ්දය

සම්බන්ධිවූ අකාරයහට "සුනංහි සුච"යි දීඝව "බුද්ධාය බුද්ධස්ස බුද්ධානං" යනුවේ–"බුද්ධ" ශබ්දයහට පුල්ලිඟුයෙහි සම්ප්‍රදානාර්ථයෙහි සිද්ධවූ චතුර්ථී එකවචන බහුවචනාන්තනාමික පදයි.

**"බුද්ධා බුද්ධම්හා බුද්ධස්මා බුද්ධෙහි බුද්ධෙභි"** යනතන්හි පඤ්චමී එකවචන **ස්මා** විභක්තිහට "ස්මාස්මිනනං වා"යි විකල්පයෙන් ආකාරාදේශව "ස්මාහිස්මිනනං ම්හාභිම්හිවා"යි විකල්පයෙන් **ම්හා** යනාදේශව **භි**විභක්ති පරකල්හි අකාරයහට "සුහිස්වකාරෙ එ"යි එකාරව **භි**විභක්තිහට "ස්මාහිස්මිනනං ම්හාභිම්හි වා"යි විකල්පයෙන් **හි** යනාදේශව "බුද්ධා බුද්ධම්හා බුද්ධස්මා බුද්ධෙහි බුද්ධෙභි" යනුවේ. "බුද්ධා බුද්ධම්හා බුද්ධස්මා, බුද්ධෙහි බුද්ධෙභි" යනු "බුද්ධ" ශබ්දයට පුල්ලිඟුයෙහි අපාදනාර්ථයෙහි සිද්ධවූ පඤ්චමී එකවචන බහුවචනාන්තනාමික පදයි. සාම්‍යවියද සම්ප්‍රදාන කාරකය හා සමයි. මෙහි "බුද්ධාය" යන රූපය නැතුවා පමණක් වෙනසි.

**"බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං බුද්ධෙසු"** යනතන්හි සප්තමී එකවචන **ස්මිං** විභක්තිහට පසෙක්හි "ස්මාස්මිනනං වා"යි එකාරය හා පසෙක්හි "ස්මාහිස්මිනනං ම්හාභිම්හි වා"යි **ම්හි** යනාදේශව **සු** පරකල්හි අකාරයහට "සුහිස්වකාරෙ එ"යි එකාරව විභත්‍යන්තහෙයින් "පරසමඤ්ඤාපයොගෙ" යන සූත්‍රයෙන් පදසංඥව "බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං, බුද්ධෙසු" යනුවේ–"බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං බුද්ධෙසු" යනු "බුද්ධ" ශබ්දයට පුල්ලිඟුයෙහි ඔකාශාර්ථයෙහි සිද්ධවූ සප්තමී එකවචන බහුවචනාන්තනාමික පදයි.

| | **එකවචන** | **බහුවචන** |
|---|---|---|
| **ප්‍ර–** | බුද්ධො | බුද්ධා |
| **ආ–** | (හෙ)බුද්ධ බුද්ධා | (භවන්තො) බුද්ධා |
| **දි–** | බුද්ධං | බුද්ධෙ |
| **තෘ–** | බුද්ධෙන | බුද්ධෙහි බුද්ධෙභි |
| **ක–** | බුද්ධෙන, | බුද්ධෙහි බුද්ධෙභි |
| **ච–** | බුද්ධාය බුද්ධස්ස | බුද්ධානං |
| **ප–** | බුද්ධා බුද්ධම්හා බුද්ධස්මා | බුද්ධෙහි බුද්ධෙභි |
| **ෂ–** | බුද්ධස්ස | බුද්ධානං |
| **ස–** | බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං | බුද්ධෙසු |

**"බුද්ධ" ශබ්දයෙන් සර්වඥයන් කියත්.**

එවං සුරාසුරනරෝරගනාගයක්ඛා
ගන්ධබ්බකින්නරමනුස්සපිසාචපේතා,
මාතඞ්ගජඞ්ගමතුරඞ්ගවරාහසීහා
ව්‍යග්ඝච්ඡකච්ඡපතරච්ඡමිගස්සසොණා.

ආලෝකලෝකනිලයානිලචාගයෝග
වායාමගාමනිගමාගමධම්මකාමා,
සඞ්ඝාසඝොසපටිසාසවකොධලොභ
සාරම්භථම්භමදමානපමාදමක්ඛා.

පුන්නාගපූගපනසාසනචම්පකම්බා
හින්තාලතාලවකුලජ්ජුනකිංසුකා ච,
මන්දාරකුන්දපුචිමන්දකරඤ්ජරුක්ඛා
සෙය්‍යා මයූරසකුණණ්ඩජකොඤ්චහංසා.

මොහුදු බුදුසඳහා සදිසයෝ්යි. මෙයින්මතු සදිසවූ විබත්හු නොදක්වනු ලැබෙත්.

---

"ස්‍යාව"යි සිහට ආව" පැමිණ **"අත්තා"** යනුවේ–"යොනමා නො"යි **යො**හට **ආනො**ව පැමිණ **"අත්තානො"** යනුවේ–"බ්‍ර‍හ්මත්ත සඛරාජාදිතො අමානං"යි අංහට **ආනං**ව පැමිණ **"අත්තානං"** යනුවේ–**හි** පරකල්හි "අත්තානොතා හිස්මිමනත්තං"යි අත්තාන්තයහට **අන**ව "සුහිස්වකාරෙ එ"යි අකාරයට එකාරව පැමිණ **"අත්තනෙහි අත්තනෙභි"** යනුවේ–"සස්ස නො"යි **ස**හට **නො**ව **"අත්තනො"** යනුවේ–"සුනංහිසු ච"යි දීඝව **"අත්තානං"** යනුවේ–"අම්හතුම්හන්තු රාජබ්‍ර‍හ්මත්තසඛසත්ථුපිතාදීහි ස්මා නාව"යි **ස්මා**විබත **නා**විබත මෙන්ව **"අත්තනා"** යනුවේ–"තතො ස්මිනි"යි **ස්මිං**හට **නි**ව "අත්තනි" යනුවේ–"අත්තත්තං" යන සූත්‍ර‍විධාකරණයෙන් **සු**විභක්ති පරකල්හිද අනව "සුහිස්වකාරෙ එ"යි එකාරව පැමිණ **"අත්තනෙසු"** යනුවේ.

| | **එකවචන** | **බහුවචන** |
|---|---|---|
| **ප්‍ර‍–** | අත්තා | අත්තානො |
| **ආ–** | (හෙ) අත්ත අත්තා | (භවන්තො) අත්තානො |
| **ද්වි–** | අත්තානං අත්තං | අත්තානො |
| **තෘ–** | අත්තෙන අත්තනා | අත්තනෙහි අත්තනෙභි |
| **ක–** | අත්තෙන අත්තනා | අත්තනෙහි අත්තනෙභි |

| | | |
|---|---|---|
| ච– | අත්තනො | අත්තානං |
| ප– | අත්තනා අත්තම්හා අත්තස්මා | අත්තනෙහි අත්තනෙභි |
| ඡ– | අත්තනො | අත්තානං |
| ස– | අත්තනි | අත්තනෙසු |

### "අත්ත" ශබ්දයෙන් ආත්මය කියත්.

"නාම්හි රඤ්ඤා වා" යි විභක්ති සහිත "රාජ" ශබ්දයහට "රඤ්ඤා" යනාදෙශව **"රඤ්ඤා"** යනුද. **නා**හට **එන** යනාදෙශව **"රාජෙන"** යනුද වේ. **හි**පරකල්හි **රාජ** ශබ්දයට "රාජස්ස රාජු සුනංහිසු ච" යි විකල්පයෙන් **රාජු** යනාදෙශව "සුනංහිසුව" යි දීඝව **"රාජූහි රාජූභි"** යනුද "සුහිස්වකාරෙ එ" යි එකාරව **"රාජෙහි රාජෙභි"** යනුදවේ. "රාජස්ස රඤ්ඤො රාජිනො සෙ" යි සවිභත්තික "රාජ" ශබ්දයට "රඤ්ඤො රාජිනො" යනාදෙශව **"රඤ්ඤො රාජිනො"** යනුද. "රඤ්ඤං නම්හි වා" යි **නං** විභක්ති සහිත රාජශබ්දයහට විකල්පයෙන් **රඤ්ඤං** යනාදෙශව **"රඤ්ඤං රාජූනං රාජානං"** යනුදවේ. "ස්මිම්හි රඤ්ඤෙ රාජිනි" යි **ස්මිං** සහිත රාජශබ්දයහට "රඤ්ඤෙ රාජිනි" යනාදෙශව **"රඤ්ඤෙ රාජිනි"** යනුද, සු පරකල්හි **රාජු** යනාදෙශාදිය වීමෙන් **"රාජූසු රාජෙසු"** යනුද වේ.

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර– | රාජා | රාජානො |
| ආ– | (හෙ) රාජ රාජා | (භවන්තො) රාජානො |
| ද්වි– | රාජානං රාජං | රාජානො |
| තෘ– | රඤ්ඤා රාජෙන | රාජූහි රාජූභි රාජෙහි රාජෙභි |
| කා– | රඤ්ඤා රාජෙන | රාජූහි රාජූභි රාජෙහි රාජෙභි |
| ච– | රඤ්ඤො රාජිනො | රඤ්ඤං රාජූනං රාජානං |
| ප– | රඤ්ඤා රාජම්හා රාජස්මා | රාජූහි රාජූභි රාජෙහි රාජෙභි |
| ඡ– | රඤ්ඤො රාජිනො | රඤ්ඤං රාජූනං රාජානං |
| ස– | රඤ්ඤෙ රාජිනි රාජම්හි රාජස්මිං | රාජූසු රාජෙසු |

### "රාජ" ශබ්දයෙන් රජ දරුවන් කියත්.

"ආසිම්හි" යි **සි** පරකල්හි **න්තු**හට ආව **සි**හට ලොපව **"ගුණවා"** යනුවේ. **යො** පරකල්හි විභක්ති සහිතවූ **න්තු**හට **න්තො** යනාදෙශව **"ගුණවන්තො"** යනුද, විභක්ති රහිත **න්තු**ප්‍රත්‍යයාගේ අන්තයහට "න්තුස්සන්තො යොසු ච" යි අකාරව **යො**හට "සබ්බයොනීනමා එ" යි ආකාරව පැමිණ **"ගුණවන්තා"** යනුදවේ. **ග** සංඥයා පරකල්හි

විභක්ති සහිතවූ න්තුහට "අවණ්ණා ච ගෙ"යි අං අ ආ යනුව "(භෙ) ගුණවං ගුණව ගුණවා" යනුද යොහට පෙරමෙන්ව "(භවන්තො) ගුණවන්තො ගුණවන්තා" යනුදවේ. අං පරකල්හි න්තුභාගයාගේ අන්තයහට "න්තුස්සන්තො යොසුච"යි චග්‍රහණයෙන් අකාරව පැමිණ "ගුණවන්තං" යනුවේ. යොහට එකාරව පැමිණ "ගුණවන්තෙ" යනුවේ, නා විභක්ති සහිත න්තුහට "තොතිතා සස්මිංනාසු"යි විකල්පයෙන් තා-යනාදෙශව "ගුණවතා" යනුද නාහට එන යනාදෙශව "ගුණවන්තෙන" යනුද පූර්ව සූත්‍රවලින් "ගුණවන්තෙහි ගුණවන්තෙභි" යනුදවේ. ස විභක්ති සහිත න්තුහට "තොතිතා සස්මිංනාසු"යි විකල්පයෙන් තො යනාදෙශව පසෙක්හි සකාරාගමව "ගුණවතො ගුණවන්තස්ස" යනුවේ. නං විභක්ති සහිත න්තුහට "තම්හි තංවා"යි විකල්පයෙන් තංව පසෙක්හි නං පරකල්හි "න්තුස්සන්තො යොසු ච"යි චග්‍රහණයෙන් අන්තයට අකාරව "සුනංහිසුච"යි දීර්ඝව "ගුණවතං ගුණවන්තානං" යනුවේ. ස්මිං සහිත න්තුහට "තොතිතා සස්මිංනාසු"යි විකල්පයෙන් තිව "ගුණවති" යනුද ස්මිංහට "ස්මාස්මින්නං වා"යි එකාරව "ගුණවන්තෙ" යනුද ගුණවන්තම්හි ගුණවන්තස්මිං ගුණවන්තෙසු" යනුද වේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | ගුණවා | ගුණවන්තො ගුණවන්තා |
| ආ- | (භෙ)ගුණවං ගුණව ගුණවා | (භවන්තො) ගුණවන්තො ගුණවන්තා |
| ද්වි- | ගුණවන්තං | ගුණවන්තෙ |
| තෘ- | ගුණවතා ගුණවන්තෙන | ගුණවන්තෙහි ගුණවන්තෙභි |
| ක- | ගුණවතා ගුණවන්තෙන | ගුණවන්තෙහි ගුණවන්තෙභි |
| ච- | ගුණවතො ගුණවන්තස්ස | ගුණවතං ගුණවන්තානං |
| ප- | ගුණවතා ගුණවන්තම්හා ගුණවන්තස්මා | ගුණවන්තෙහි ගුණවන්තෙභි |
| ෂ- | ගුණවතො ගුණවන්තස්ස | ගුණවතං ගුණවන්තානං |
| ස- | ගුණවති ගුණවන්තෙ ගුණවන්තම්හි ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

### "ගුණවන්තු" ශබ්දයෙන් ගුණ ඇත්තවුන් කියත්.

එවං "මුඛවා කුලවා ඵලවා යසවා ධනවා සුතවා භගවා හිමවා බලවා සීලවා, පඤ්ඤවා" ඉච්චාදයො ගුණවන්තුසද්දසමා.

"සිම්හි ගච්ඡන්තාදීනං න්තසද්දො, අං"යි. න්තහට අංව සිහට ලොප්ව "ගච්ඡං" යනුද, සිහට ඕව "ගච්ඡන්තෝ" යනුද, "න්ත" හට "න්තු" වත්ව සොවිභක්ති සහිත න්තුහට "න්තුස්සන්තෝ"යි න්තෝ යනාදේශව "ගච්ඡන්තෝ"යනුද, සොහට ආව"ගච්ඡන්තා" යනුද වේ. සෙස්ස "ගුණවන්තු" ශබ්දය හා සමයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | ගච්ඡං, ගච්ඡන්තෝ | ගච්ඡන්තෝ, ගච්ඡන්තා |
| ආ- | (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තෝ)ගච්ඡන්තෝ, ගච්ඡන්තා |
| ද්වි- | ගච්ඡන්තං | ගච්ඡන්තෙ |
| තෘ- | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ක- | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ච- | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ප- | ගච්ඡතා, ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ෂ- | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ස- | ගච්ඡති, ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු |

"ගච්ඡන්ත" ශබ්දයෙන් යන්නවුන් කියත්.

එවං මහං චරං තිට්ඨං දදං භුඤ්ජං සුණං පචං
ජයං ජීරං චවං මියං සරං කුබ්බං ජපං වජං.

ඉච්චාදයො ගච්ඡන්ත සද්දසමා.

### අකාරන්තං.

ආකාරන්ත පුංලිඞ්ගයෝ අප්‍රසිද්ධයි, * "අග්ගි" ශබ්දයා කෙරෙන් සිව සිපරකල්හි ඉවණියාට "ඉවණ්ණුවණ්ණොජ්ඣාලා"යි ඣසංඥව ඣි හටලොප්ව "අග්ගි" යනුද, සොහට "ඝපතො ච යොනං ලොපො"යි

* "සා, මා, පච්චක්ඛධම්මා" යනාදී ආකාරන්තනාමද පෙණෙත් එහි වරනැඟීම මෙසේයි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | සා | සා |
| ආ- | (හෙ) ස සා | (භවන්තො) සා |
| ද්වි- | සං | සෙ |
| තෘ- | සෙන, | සාහි සාභි |
| ක- | සෙන | සාහි සාභි |
| ච- | සාය සස්ස | සානං |
| ප- | සා සම්හා සස්මා | සාහි සාභි |
| ෂ- | සස්ස | සානං |
| ස- | සෙ සම්හි සස්මිං | සාසු |

"සා" ශබ්දයෙන් සුනඛයන් කියත්.

විකල්පයෙන් ලොප්ව "යොසු කතනිකාරලොපෙසුදීඝං"යි ඣසංඥයා හට දීඝව "අග්ගී" යනුද, පසෙක්හි "යොස්වකතරස්සො ඣො"යි යො පරකල්හි අකෘත හ්‍රස්ව ඣසංඥයට අකාරව "අග්ගයො" යනුද වේ- "අමෙමා නිග්ගහිතං ඣලපෙහි"යි ඣසංඥයා කෙරෙන් පරවූ අං විභක්තිය නිග්ගහිතබවට පැමිණ "අග්ගිං" යනුවේ-හිපරකල්හි "සුනංහිසුච"යි දීඝව පසෙක්හි හිහට භිව "අග්ගීහි අග්ගීභි" යනුවේ-ස හට "ඣලතො සස්ස නො වා"යි නො යනාදේශව "අග්ගිනො" යනුද, පසෙක්හි සකාරද්විත්වව "අග්ගිස්ස" යනුද වේ-"ඣලතො ච"යි ස්මාහට නාව "අග්ගිනා" යනුවේ.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | අග්ගි * | අග්ගී, අග්ගයො |
| ආ- | (හෙ) අග්ගි | (භවන්තො) අග්ගී, අග්ගයො |
| දි- | අග්ගිං | අග්ගී, අග්ගයො |
| තෘ- | අග්ගිනා | අග්ගීහි, අග්ගීභි |
| ක- | අග්ගිනා | අග්ගීහි, අග්ගීභි |
| ච- | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| පං- | අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | අග්ගීහි අග්ගීභි |
| ෂ- | අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| ස- | අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගීසු † |

**"අග්ගි" ශබ්දයෙන් ගිනි කියත්.**

**ජොති පාණි ගණ්ඨි මුට්ඨි කුච්ඡි වත්ථි සාලි වීහි**
**ව්‍යාධි ඔධි බොධි සන්ධි රාසි කෙසි සාති දීපි.**

**ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි**
**අසි මසි නිධි විධි අහි කිමි පති හරි**

**අළි තිමි කලි බලි ජලනිධි ගහපති**
**උරුබින්ධි වරමති නිරුපධි අධිපති.**

ඉච්චාදයො අග්ගි සද්දාව.

"ආදි" ශබ්දයා කෙරෙන් පර ස්මිංහට "ආදිතො ඔ ච"යි අං ඔ යනාදේශව "ආදිං ආදො" යනුවේ. සෙස්ස "අග්ගි" ශබ්දය මෙනි.

**ඊකාරන්තං.**

* "අග්ගිස්සිනි" යන සූත්‍රයෙන් "අග්ගි" ශබ්දාන්තයට "ඉනි" යනාදේශව "අග්ගිනි" යන රූපයක්ද ප්‍රථමා ඒකවචනයෙහි වේ.

† දීඝ නොවීමෙන් "අග්ගිසු" යනුද වේ.

ශි පරකල්හි "දණ්ඩි" ශබ්දයහට "අඝෝ රස්සං" යනාදින් හ්‍රස්ව පැමිණ "නසිස්මිමනපුංසකානි"යි ප්‍රතිෂෙධව සිහට ලොප්ව "දණ්ඩි" යනුද, පසෙක්හි යොහට "ඝපතො ච යොනං ලොපො"යි ලොප්ව "දණ්ඩි" යනුද පසෙක්හි යොපරකල්හි ඣසංඥයට "අඝෝරස්සමෙකවචනයොස්වපි ච"යි හ්‍රස්වව කෘතහ්‍රස්ව ඣසංඥයා කෙරෙන් පරවූ යොහට "යොනං නො"යි නොව "දණ්ඩිනො" යනුද වේ–ග පරකල්හි ඣසංඥයට "ඣලපා රස්සං"යි හ්‍රස්වව "(භො) දණ්ඩි" යනුවේ, අං පරකල්හි "අඝෝරස්සං" යනාදියෙන් හ්‍රස්වව පසෙක්හි "නං ඣතො කතරස්සා"යි අංහට නංව "දණ්ඩිනං දණ්ඩිං" යනුවේ–"අඝෝරස්සං" යනාදීන් හ්‍රස්වව "දණ්ඩිනා" යනුවේ–"ඣලතො සස්සනො වා"යි පසෙක්හි සහට නොව "දණ්ඩිනො දණ්ඩිස්ස" යනුවේ–"ස්මිංනි"යි ස්මිංහට නිව "දණ්ඩිනි" යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | දණ්ඩි | දණ්ඩී, දණ්ඩිනො |
| ආ– | (භො) දණ්ඩි | (භවන්තො) දණ්ඩී, දණ්ඩිනො |
| ද්වි– | දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| තෘ– | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ක– | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ච– | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ප– | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| ඡ– | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ස– | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩීසු |

**"දණ්ඩි" ශබ්දයෙන් දඩු ගන්නවුන් කියත්.**

**ධම්මී සඞ්ඝී ඤාණී හත්ථී චක්කී පක්ඛී දාඨී රට්ඨී**
**ඡත්ති මාලි වම්මි යොගි භාගි භොගි කාමි සාමි.**

**ධජී ගණී සසී කුට්ඨී ජටී යානි සුඛි සිඛී**
**දන්ති මන්ති කරී චාගි කුසලි මුසලි බලි.**

**පාපකාරී සත්තුසාරී මලකාරී දීඝජීවී**
**ධම්මවාදී සීහනාදී භූමිසායී සීඝයායී.**

ඉච්චාදයො දණ්ඩි සද්දසමා
ඊකාරන්තා.

'භික්ඛු'' ශබ්දයා කෙරෙන් සියොව විභක්ති පරකල්හි උවණ්ණයට "ඉවණ්ණුවණ්ණාජ්ඣලා''යි ල සංඥව සිහට ලොප්ව ලසංඥයා කෙරෙන් යොහට "ලතො වොකාරොච"යි වො යනාදෙශව "වෙ වොසු ලොච"යි ලසංඥයට අකාරව "ඝපතො ච යොනං ලොපො"යි පසක්හි යොහට ලොප්ව කරණලද ලොප්ඇති යො පරකල්හි ල සංඥයට "යොසුකතනිකාරලොපෙසු දීඝං"යි දීඝීව "භික්ඛූ භික්ඛවො භික්ඛූ" යනුවේ-ග සංඥයට ලොප්ව "(හො) භික්ඛු" යනුද, ආලපන යොහට "අකතරස්සා ලතො යවාලපනස්ස වෙවො"යි වෙවො යනාදෙශව "වෙවොසු ලොච"යි ලසංඥයට අකාරව "භික්ඛවෙ භික්ඛවො භික්ඛූ" යනුදවේ.

| එකවචන. | බහුවචන. |
|---|---|
| පු- භික්ඛු | භික්ඛවො, භික්ඛූ |
| ආ- (හෙ) භික්ඛු | (භවන්තො) භික්ඛවෙ, භික්ඛවො භික්ඛූ |
| ද්වි- භික්ඛුං | භික්ඛවො, භික්ඛූ |
| තෘ- භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| ක- භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| ච- භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ප- භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූහි, භික්ඛූභි |
| ෂ- භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ස- භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛූසු, භික්ඛුසු |

**"භික්ඛු" ශබ්දයෙන් භික්ෂූන් කියත්.**

"ජන්තු"ශබ්දයා කෙරෙන් පර යොහට "ලතො වොකාරොච"යි කාරග්‍රහණයෙන් නොව "ජන්තුනො" යනුවේ.

| එකවචන. | බහුවචන. |
|---|---|
| පු- ජන්තු | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| ආ- (හෙ) ජන්තු | (භවන්තො) ජන්තූ ජන්තවො ජන්තුනො, ජන්තුයො |
| ද්වි- ජන්තුං | ජන්තූ, ජන්තවො, ජන්තුනො ජන්තුයො |
| තෘ- ජන්තුනා | ජන්තූහි ජන්තූභි |
| ක- ජන්තුනා | ජන්තූහි ජන්තූභි |
| ච- ජන්තුනො, ජන්තුස්ස | ජන්තූනං |

| | | |
|---|---|---|
| ප– | ජන්තුනා, ජන්තුම්හා, ජන්තුස්මා | ජන්තූහි ජන්තූභි |
| ෂ– | ජන්තුනො, ජන්තුස්ස | ජන්තූනං |
| ස– | ජන්තුම්හි, ජන්තුස්මිං | ජන්තූසු, ජන්තුසු |

**"ජන්තු" ශබ්දයෙන් සත්වයන් කියත්.**

"සත්ථු" ශබ්දයා කෙරෙන් සිව "සත්ථුපිතාදීනමා සියම්, සිලොපො ච"යි "සත්ථු" ශබ්දයාගේ අන්තයට ආකාරව මෙයින්ම සිහට ලොප්ව **"සත්ථා"** යනුද, **යො** පරකල්හි "සත්ථු" ශබ්දයාගේ අන්තය හට "අඤ්ඤෙසුචාරත්තං"යි **ආර** යනාදෙශව "**තතො යොනමො තු**"යි **යො**හට ඔකාරව "සත්ථාරො" යනුදවේ. **ආර** යනාදෙශයා කෙරෙන් **නා**හට "නා ආ"යි ආකාරව **"සත්ථාරා"** යනුවේ–සවිභත්ති පරකල්හි "උස්සස්මිං සලොපො ච"යි "සත්ථු" ශබ්දයාගේ අන්තයට උකාරව සහට මෙයින්ම ලොප්ව **"සත්ථු සත්ථුනො සත්ථුස්ස"** යනුද, **නං** පරකල්හි "වා නම්හි"යි විකල්පයෙන් **ආර**ව පසෙක්හි "සත්ථුනාත්තඤ්ච"යි "සත්ථු" ශබ්දාන්තයට අකාරව "සුනංහිසු ච"යි දීඝව **"සත්ථාරානං, සත්ථානං"** යනුදවේ–**ස්මා විභත්තිනා** විබත වෙත්ව "නා ආ"යි **නා**හට ආකාරව **"සත්ථාරා"** යනු වේ–**ස්මිං**හට ඉකාරව "ආරෙ රස්සමිකාරෙ"යි **ඉ** පරකල්හි **ආර** යන්නට හ්‍රස්වව **"සත්ථරි"** යනුවේ.

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර– | සත්ථා | සත්ථාරො |
| ආ– | (හෙ) සත්ථ සත්ථා | (භවන්තො) සත්ථාරො |
| ද්වි– | සත්ථාරං | සත්ථාරෙ සත්ථාරො |
| තෘ– | සත්ථාරා | සත්ථාරෙහි සත්ථාරෙභි |
| ක– | සත්ථාරා | සත්ථාරෙහි සත්ථාරෙභි |
| ච– | සත්ථු සත්ථුනො සත්ථුස්ස | සත්ථාරානං සත්ථානං |
| ප– | සත්ථාරා | සත්ථාරෙහි සත්ථාරෙභි |
| ෂ– | සත්ථු සත්ථුනො සත්ථුස්ස | සත්ථාරානං සත්ථානං |
| ස– | සත්ථරි | සත්ථාරෙසු |

**"සත්ථු" ශබ්දයෙන් ශාශනෘන් කියත්.**

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර– | නත්තා | නත්තාරො |
| ආ– | (භෙ) නත්ත නත්තා | (භවන්තො) නත්තාරො |
| ද්වි– | නත්තාරං | නත්තාරෙ නත්තාරො |

| | | |
|---|---|---|
| තෘ- | නත්තාරා | නත්තාරෙහි නත්තාරෙහි |
| ක- | නත්තාරා | නත්තාරෙහි නත්තාරෙහි |
| ච- | නත්තු නත්තුනො නත්තුස්ස | නත්තාරානං නත්තානං |
| ප- | නත්තාරා | නත්තාරෙහි නත්තාරෙහි |
| ෂ- | නත්තු නත්තුනො නත්තුස්ස | නත්තාරානං නත්තානං |
| ස- | නත්තරි | නත්තාරෙසු |

**"නත්තු" ශබ්දයෙන් මුණුබුරන් කියත්.**

"පිතාදීනමසිම්හි"යි සිව්භක්ති හැර සෙසු විභක්ති පරකල්හි **ආර** යනාදෙශයට හ්‍රස්වවේ.

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර- | පිතා | පිතරෝ |
| ආ- | (හෙ) පිත පිතා | (භවන්තො) පිතරො |
| ද්වි- | පිතරං | පිතරෙ පිතරො |
| තෘ- | පිතරා | පිතරෙහි පිතරෙභි පිතූහි පිතූභි |
| ක- | පිතරා | පිතරෙහි පිතරෙභි පිතූහි පිතූභි |
| ච- | පිතු පිතුනො පිතුස්ස | පිතරානං පිතානං පිතූනං |
| ප- | පිතරා | පිතරෙහි පිතරෙභි පිතූහි පිතූභි |
| ෂ- | පිතු පිතුනො පිතුස්ස | පිතරානං පිතානං පිතූනං |
| ස- | පිතරි | පිතරෙසු පිතූසු |

**"පිතු" ශබ්දයෙන් පිතෲන් කියත්.**

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර- | භාතා | භාතරො |
| ආ- | (හෙ) භාත භාතා | (භවන්තො) භාතරො |
| ද්වි- | භාතරං | භාතරෙ භාතරො |
| තෘ- | භාතරා | භාතරෙහි භාතරෙභි භාතූහි භාතූභි |
| ක- | භාතරා | භාතරෙහි භාතරෙභි භාතූහි භාතූභි |
| ච- | භාතු භාතුනො භාතුස්ස | භාතරානං භාතානං භාතූනං |
| ප- | භාතරා | භාතරෙහි භාතරෙභි භාතූහි භාතූභි |
| ෂ- | භාතු භාතුනො භාතුස්ස | භාතරානං භාතානං භාතූනං |
| ස- | භාතරි | භාතරෙසු භාතූසු |

**"භාතු" ශබ්දයෙන් භ්‍රාතෲන් කියත්.**

**සෙතු කෙතු රාහු භානු සඞ්කු උච්ඡු වෙළු මච්චු**
**සින්ධු නෙරු මෙරු සන්තු කාරු හෙතු ජන්තු රුරු**

හන්තු ජේන්තු නේතු සෝතු ඤාතු ජේතු හෝතු දාතු ධාතු නත්තු බොද්ධු විඤ්ඤාපෙතු *

ඉච්චෙවමාදයො සද්දා

**ඌකාරන්තා.**

---

“අභිභූ” ශබ්දයා කෙරෙන් පර සිහට ලොප්ව “අභිභූ” යනුවේ. යොවිභක්ති ලොප්කළ කල්හි “අභිභූ” යනුද, “අඝොරස්සං” යනාදීන් හ්‍රස්වකොට යොහට වො යනාදෙශ කළකල්හි “අභිභුවො” යනුද වේ. මෙහි ආලපනයෙහි කෘත හ්‍රස්වබැවින් වෙ යනාදෙශ නොවේ, සෙස්ස “භික්ඛු” ශබ්දසමෙනි, හ්‍රස්වභාවය පමණක් වෙනසි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | අභිභූ | අභිභුවො අභිභූ |
| ආ– | (හෙ) අභිභූ | (භවන්තො) අභිභුවො අභිභූ |
| ද්වි– | අභිභුං | අභිභුවො අභිභූ |
| තෘ– | අභිභුනා | අභිභූහි අභිභූභි |
| ක– | අභිභුනා | අභිභූහි අභිභූභි |
| ච– | අභිභුනො අභිභුස්ස | අභිභූනං |
| ප– | අභිභුනා අභිභුම්හා අභිභුස්මා | අභිභූහි අභිභූභි |
| ෂ– | අභිභුනො අභිභුස්ස | අභිභූනං |
| ස– | අභිභුම්හි අභිභුස්මිං | අභිභූසු |

**“අභිභූ” ශබ්දයෙන් මැඩපවත්වන්නවුන් කියත්.**

“සබ්බඤ්ඤූ” ශබ්දයා කෙරෙන් පර **යො**හට ලොප්ව **“සබ්බඤ්ඤූ”** යනුද, පසෙක්හි “ලතො වොකාරෙච”යි ච් ග්‍රහණයෙන් **නො** යනාදෙශව පෙරසේ හ්‍රස්වව **“සබ්බඤ්ඤුනො”** යනුදවේ. මෙහි **යො**හට **වො** ආදෙශ නොවේ.

---

* මෙහි “ජෙතු සොතු” යනාදි ගණයෙන් දක්වනලද ශබ්ද සමූහය අභිජ් පොත්වල “භික්ඛු” ශබ්දය ලඟටද, අනතුරුව දක්වූ “හන්තු” ශබ්දදිය “හාතු” ශබ්දය ලඟටද දක්වනලදී. මෙහිද “සෙතු” යනාදිය “භික්ඛු” ශබ්දයමෙන්ද “නත්තු” ආදිය “පිතු” ශබ්දදිය මෙන්ද වරනැගියයුතු.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | සබ්බඤ්ඤූ | සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ |
| ආ– | (හෙ)සබ්බඤ්ඤු | (භවන්තො) සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ |
| ද්වි– | සබ්බඤ්ඤුං | සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤූ |
| තෘ– | සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූහි සබ්බඤ්ඤූභි |
| ක– | සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූහි සබ්බඤ්ඤූභි |
| ච– | සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| ප– | සබ්බඤ්ඤුනා සබ්බඤ්ඤුම්හා සබ්බඤ්ඤුස්මා | සබ්බඤ්ඤූහි සබ්බඤ්ඤූභි |
| ෂ– | සබ්බඤ්ඤුනො සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| ස– | සබ්බඤ්ඤුම්හි සබ්බඤ්ඤුස්මිං | සබ්බඤ්ඤූසු |

**“සබ්බඤ්ඤූ” ශබ්දයෙන් සියල්ල දන්නවුන් කියත්.**

## ඔකාරාන්තං.

“ගො” ශබ්දයා කෙරෙන් සිහට ලොප්ව **“ගො”** යනුවේ. **යො** පරකල්හි **ගො** ශබ්දය සම්බන්ධිවූ ඔකාරයට “යොසුච”යි **ආව** යනාදෙශව **“ගාවො”** යනුවේ. “අවම්හි ච”යි අං විභක්ති පරකල්හි ගො ශබ්දයාගේ ඔකාරයට **ආව අව** යනාදෙශයෝව “ආවස්සු වා”යි **ආව යන්නේ වකාරස්ථ අකාරයට විකල්පයෙන් උකාරව “ගාවුං ගාවං ගවං”** යනුවේ. **නා** පරකල්හි **ගො** ශබ්දයාගේ ඔකාරයට “අවම්හි ච”යි චශබ්දයෙන් **ආව අව** යනාදෙශ හා **නා**හට “අතො නෙන”යි **එන** යනාදෙශව **“ගාවෙන ගවෙන”** යනුවේ. **ස පරකල්හි** ඔකාරයට “ගාවසෙ”යි **ආව** යනාදෙශ හා “අවම්හි ච”යි **චග්‍රහණයෙන් අව** යනාදෙශව **“ගාවස්ස ගවස්ස”** යනුවේ. “නතොනං” යනාදි සූත්‍රයෙහි චකාරයෙන් නංහට ආව **ගො** ශබ්දයාගේ ඔකාරයට **අවව** “සුහිනාසුච”යි **චග්‍රහණයෙන් ගොහට ගු**යනාදෙශව නකාර විත්වව **“ගවං ගුන්නං ගොනං”** යනුවේ. **ස්මා**පරකල්හි **ගොශබ්දයාගේ** ඔකාරයට “අවම්හිච”යි **චග්‍රහණයෙන් ආව අව** යනාදෙශව **ස්මා**හට “ස්මාස්මිංනානං වා”යි විකල්පයෙන් ආකාරව පැමිණ **“ගාවා ගවා ගාවම්හා ගවම්හා ගාවස්මා ගවස්මා”** යනුවේ. **ස්මිං** විභක්ති පරකල්හි “අවම්හිච”යි **චකාරයෙන් ආව අවව** “ස්මාස්මිංනානං වා”යි විකල්පයෙන් **ස්මිං**හට එකාරව **සුපරකල්හි “සුහිස්වකාරෙ එ”යි එකාරව “ගාවෙ ගවෙ ගාවෙසු ගවෙසු ගොසු”** යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | ගො | ගාවො |
| ආ– | (හෙ) ගො | (භවන්තො) ගාවො |
| ද්වි– | ගාවුං ගාවං ගවං | ගාවො |
| තෘ– | ගාවෙන ගවෙන | ගොහි ගොහි |
| ක– | ගාවෙන ගවෙන | ගොහි ගොහි |
| ච– | ගාවස්ස ගවස්ස | ගවං ගුන්නං ගොනං |
| ප– | ගාවා ගවා ගාවම්හා ගවම්හා ගාවස්මා ගවස්මා | ගොහි ගොහි |
| ෂ– | ගාවස්ස ගවස්ස | ගවං ගුන්නං ගොනං |
| ස– | ගාවෙ ගවෙ ගාවම්හි ගවම්හි ගාවස්මිං ගවස්මිං | ගාවෙසු ගවෙසු ගොසු |

**“ගො” ශබ්දයෙන් ගෙරින් කියත්.**

**බුඩත්තා රාජගුණවා ගච්ඡන්තු නගාදි දණ්ඩි ච**
**භික්ඛු ච ජන්තු සත්ථා ච නත්තා ච පිතු මාතු ච**
**අග්ගි සබ්බඤ්ඤු ගොණි එවං පුල්ලිඞ්ගසඞ්ගහො.**

පුමානං ලිනා අඞ්ගා

## පුල්ලිඞ්ගා.

“සබ්බඤ්ඤු සබ්බඤ්ඤූ සබ්බඤ්ඤූයො” යනතන්හි සිවිභත්‍යාදීන් පර කල්හි සඤ්ඤී ලිඞ්ගයෙහි වැටෙන්නාවූ ආකාරයහට “අංසො”යි සසංඥව “සෙසතො ලොපං ගසිපි”යි සිහට ලොප්ව **“සබ්බඤ්ඤූ”** යනුද, “සපතො ච යොනං ලොපො”යි විකල්පයෙන් යොහට ලොප්ව **“සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤූයො”** යනුද වේ–“ඝඉත ච”යි ඝසංඥයහට එකාරව **“(හෙ) සබ්බඤ්ඤු”** යනුද, **යො**හට පෙර පරිදිව **“(භොන්ති) සබ්බඤ්ඤූ, සබ්බඤ්ඤූයො”** යනුදවේ. නාදී එකවචනයන්ට “ඝතොනාදීනං”යි **ආය** යනාදෙශව **“සබ්බඤ්ඤූය”** යනුවේ. සසංඥා කෙරෙන් **ස්මිං** හට “ඝපතො ස්මිං යං වා”යි විකල්පයෙන් **යං** යනාදෙශව **“සබ්බඤ්ඤූයං සබ්බඤ්ඤූය”** යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | කඤ්ඤා | කඤ්ඤා කඤ්ඤායො |
| ආ– | (හෙ) කඤ්ඤෙ | (හොති) කඤ්ඤා කඤ්ඤායො |
| ද්වි– | කඤ්ඤං | කඤ්ඤා කඤ්ඤායො |
| තෘ– | කඤ්ඤාය | කඤ්ඤාභි කඤ්ඤාහි |
| ක– | කඤ්ඤාය | කඤ්ඤාභි කඤ්ඤාහි |
| ච– | කඤ්ඤාය | කඤ්ඤානං |
| ප– | කඤ්ඤාය | කඤ්ඤාභි කඤ්ඤාහි |
| ෂ– | කඤ්ඤාය | කඤ්ඤානං |
| ස– | කඤ්ඤායං කඤ්ඤාය | කඤ්ඤාසු |

**"කඤ්ඤා" ශබ්දයෙන් දසහැවිරිදි ස්ත්‍රීන් කියත්.**

**සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා චින්තා මන්තා තණ්හා වීණා**
**ඉච්ඡා මුච්ඡා එජා මායා මෙත්තා මත්තා සික්ඛා භික්ඛා**
**ජඞ්ඝා ගීවා ජිව්හා වාචා ඡායා ආසා ගඞ්ගා නාවා**
**ගාථා සෙනා ලෙඛා සාලා මාලා වෙලා පූජා ඛිඩ්ඩා**
**පිපාසා වෙදනා සඤ්ඤා චෙතනා තසිණා පජා**
**දෙවතා වට්ටකා ගොධා බලාකා පරිසා සභා**
**ඌකා සෙපාලිකා ලඞ්කා සලාකා වාලුකා සිඛා**
**විසාඛා විසිඛා සාඛා වචා වඤ්ඣා ජටා ඝටා**
**ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා ච කරුණා වනිතා ලතා**
**කථා නිද්දා සුධා රාධා වාසනා සිංසපා පපා**
**පභා සීමා ඛමා ජායා ඛත්තියා සක්ඛරා සුරා**
**දොලා තුලා සිලා ලීලා ලාලෙලා මෙඛලා කලා**
**වළවා ලම්බුසා මූසා මඤ්ජුසා සුලසා දිසා**
**නාසා ජුණ්හා ගුහා ඊහා ලසිකා වසුධා සුධා**

ඉච්චාදයො කඤ්ඤා සද්දසමා

**ආකාරන්තං.**

"රත්ති" ශබ්දයා කෙරෙන් **සි යොව** සත්‍රී ලිඞ්ගයෙහි වැටෙත් නාවූ ඉවණ්ණයට "තෙ ඉත්ථිඛ්‍යා පො"යි පසංඥව **සිහට** ලොප්ව "සපතො ච යොනං ලොපො"යි යොනට විකල්පයෙන් ලොප්ව කර ණලද ලොප්ඇති **යො** පරකල්හි "යොසු කතනිකාරලොපෙසු දීඝං"

යි දීඝීව "රත්ති රත්ති රත්තියො" යනුවේ-පසංඥයා කෙරෙන් පරවූ නා ස ස්මා ස්මිං විභක්තීන්ට "පතොයා"යි යාව "රත්තියා" යනුවේ. "සපතො ස්මිං යං වා"යි ස්මිංහට විකල්පයෙන් යං යනාදෙශව "රත්තියං රත්තියා" යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | රත්ති | රත්තී රත්තියො |
| ආ- | (හෙ) රත්ති | (භොන්ති) රත්තී රත්තියො |
| ද්වි- | රත්තිං | රත්තී රත්තියො |
| තෘ- | රත්තියා | රත්තීහි රත්තීභි |
| ක- | රත්තියා | රත්තීහි රත්තීභි |
| ච- | රත්තියා | රත්තීනං |
| ප- | රත්තියා | රත්තීහි රත්තීභි |
| ෂ- | රත්තියා | රත්තීනං |
| ස- | රත්තියං රත්තියා | රත්තීසු * |

"රත්ති" ශබ්දයෙන් රාත්‍රිය කියත්.

පත්ති යුත්ති වුත්ති කිත්ති මුත්ති තිත්ති ඛන්ති කන්ති
සන්ති නන්ති සිද්ධි සුද්ධි ඉද්ධි වුද්ධි බුද්ධි බොධි
භූමි ජාති පීති සූති නන්දි සන්ධි සානි කොටි
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි පාලි ආලි නාලි කෙලි

සති මති ගති චුති ධිති රති රුචි ඡවි යුවති කන්ති රස්මි අසනි වසනි ඔසධි අඞ්ගුලි ධූලි දුන්දුභි දොණි අටවි පාටලි සිරි ඵුති ආකති

ඉච්චාදයො රත්තිව

ඉකාරන්තං

---

* මෙහි ප්‍රථමා බහුවචනයෙහි "රත්‍යො" යන රූපයක්ද තෘතීයා පඤ්චමී එකවචනයන්හි "රත්‍යා" යන රූපයක්ද, සප්තමී එකවචනයෙහි "රත්‍යං, රත්‍යා, රත්තිං, රත්තො" යන රූපද වෙත්.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | නදී | නදී නදියො |
| ආ– | (හෙ) නදී | (භොනි) නදී නදියො |
| ද්වි– | නදිං | නදී නදියො |
| තෘ– | නදියා | නදීහි නදීභි |
| ක– | නදියා | නදිහි නදීභි |
| ච– | නදියා | නදීනං |
| ප– | නදියා | නදීහි නදීභි |
| ඡ– | නදියා | නදීනං |
| ස– | නදියං නදියා | නදීසු * |

**"නදි" ශබ්දයෙන් ගංහෝ කියත්.**

**මහී වෙතරණී වාපී පාටලී කදලී ඝටී**
**නාරී කුමාරී තරුණී වාරුණී බ්‍රාහ්මණී සඛී**
**ගන්ධබ්බී කින්නරී නාගී දෙවී යක්ඛී අජී මිගී**
**වානරී සූකරී සිඟී හංසී කාකී ච කුක්කුටී**

ඉච්චාදයො නදීව

"කඤ්ඤා" ශබ්දය "කඤ්ඤ"යි සිටි, ස්ත්‍රී ලිඞ්ගයෙහි වැටෙන්නාවූ අකාරාන්ත නාමයාකෙරෙන් පරව "ඉත්ථියමතො ආපපච්චයො"යි ආප්‍රත්‍යයව ප්‍රත්‍යයස්වරයා පරකල්හි පූර්වස්වරයහට "සරලොපො" දීන් ලොප්ව පැමිණ ප්‍රත්‍යයාන්තයා නමා අලිඞ්ග හෙයින් "තද්ධිතා"දි සූත්‍රයෙහි චග්‍රහණයෙන් නාමවත්ව ඔහුකෙරෙන් පරව සිව ලොප්ව "**කඤ්ඤා**" යනුවේ. "නදාදිතොවා ඊ" යන්නෙන් ඊ ප්‍රත්‍යයව "**නදී**" යනුවේ. ඊප්‍රත්‍යයා පරකල්හි "මාතුලාදීනමානත්තමීකාරෙ"යි "මාතුල" ශබ්දාන්තයට ආනව "**මාතුලානී**"යනුවේ. ඊපරකල්හි "භවන්ත" ශබ්දයහට **භොත** යනාදෙශව "**භොතී**"යනුවේ. "මාණව" ශබ්දාදීන් කෙරෙන් "ණවණිකණෙය්‍යණන්තූහි"යි ඊප්‍රත්‍යයව "**මාණවී**" යනාදියවේ. "ගුණවන්තු" ශබ්දයා කෙරෙන් ඊව ඊපරකල්හි න්තුහට "න්තුස්ස තමීකාරෙ"යි විකල්පයෙන් තකාරව "**ගුණවතී**

---

* මෙහි ප්‍රථමා ආලපන විභීයා බහුවචනයන්හි "නජ්ජො" යනුද, විතීයා එකවචනයෙහි "නදියං" යනුද, තෘතීයා චතුර්ථී පඤ්චමී ෂෂ්ඨී එකවචනයන්හි "නජ්ජා" යනුද, සප්තමී එකවචනයෙහි "නජ්ජං" යනුදවේ.

**ගුණවන්ති"** යනුවේ. "මහන්ත" ශබ්දාදීන්ගේ "න්ත" යන්න "න්තු" වත්ව මෙසේම සිද්ධව **"මහන්ති මහන්ති"** යනාදිය වේ. "පති භික්ඛු රාජීකාරන්තෙහි ඉනී"යි **ඉනී** ප්‍රත්‍යයව "පතිස්සිනිම්හි"යි "පති" ශබ්දාන්තයට අකාරව "සරලොපා"දියෙහි "තු" **ග්‍රහණයෙන්** ලොපප්‍රතිෂෙධව "වාපරො අසරූපා"යි ඉකාරයහට ලොප්ව "පුබ්බො ච"යි දීඝව **"ගහපතානි"** යනුවේ.

**කඤ්ඤා රත්ති නදී යාගු මාතු ධීතුදුහිතාපි**
**ජම්බු අංගාදි නගරාදි මාතුලානි ඝටාදි ච**
**භොති මාණවිකාදී ගුණවන්ති මහන්තිතිච**
**ගහපතානි ච මෙධාවි ධම්මචාරිනිසඞ්ගහො**

ඉත්ථියා ලිනා අඞ්ගා

**ඉත්ථිලිඞ්ගා.**

---

"චිත්ත" ශබ්දයා කෙරෙන් **සිස්යාව** අකාරාන්ත නපුංසකලිඞ්ග නාමයාකෙරෙන් පරවූ **සි**හට "සිං" යන සූත්‍රයෙන් **අං** යනාදෙශව පැමිණ **"චිත්තං"** යනුද, **යො**හට "අංතො නිච්ච"යි අවිකල්පයෙන් **නි** යනාදෙශව **නි**හට "සබ්බයොනීනමාඑ"යි විකල්පයෙන් **ආව** නිපරකල්හි "යොසු කතනිකාරලොපෙසු දීඝං"යි දීඝව **"චිත්තා චිත්තානි"** යනුදවේ. ගසංඥයා පරකල්හි "අකාර පිතාද්‍යන්තානමා"යි **ආව** "ආකාරොවා"යි විකල්පයෙන් හ්‍රස්වව ගසංඥයහට ලොප්ව **"(භො) චිත්ත චිත්තා"** යනුවේ. විතියා **යො**හට **නිව නි**හට "සබ්බයොනීනමාඑ"යි විකල්පයෙන් **එව "චිත්තෙ චිත්තානි"** යනුවේ.

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| **ප්‍ර–** | චිත්තං | චිත්තා චිත්තානි |
| **ආ–** | (භො) චිත්ත චිත්තා | (භවන්තො) චිත්තා චිත්තානි |
| **ද්වි–** | චිත්තං | චිත්තෙ චිත්තානි |
| **තෘ–** | චිත්තෙන | චිත්තෙහි චිත්තෙභි |
| **ක–** | චිත්තෙන | චිත්තෙහි චිත්තෙභි |
| **ච–** | චිත්තාය චිත්තස්ස | චිත්තානං |
| **ප–** | චිත්තා චිත්තම්හා චිත්තස්මා | චිත්තෙහි චිත්තෙභි |
| **ෂ–** | චිත්තස්ස | චිත්තානං |
| **ස–** | චිත්තෙ චිත්තම්හි චිත්තස්මිං | චිත්තෙසු |

**"චිත්ත" ශබ්දයෙන් සිත කියන්.**

පුඤ්ඤපාපඵලරූපසාධනං සොතඝානසුඛදුක්ඛකාරණං
දානසීල ධනඣාන ලොචනං මූල කූල බල ජාල මඞ්ගලං
නළිනලිඞ්ග මුඛඞ්ග ජලම්බුජං පුළින ධඤ්ඤ හිරඤ්ඤ පදමකං
පදුමපණ්ණ සුසානවනායුධං හදයචීවරවත්ථ කුලින්ද්‍රියං

ඝතවදනයානොදකසොපාණපාණං
භවන භුවන ලොහාලාත තුණ්ඩණ්ඩ පීඨං
කාරණ මරණ ඤාණා රම්මණා රඤ්ඤතානං
තගර නගර තිරච්ඡාන ඡිද්දොදකානි

ඉච්චාදයො චිත්තංව

"මන" ශබ්දයා කෙරෙන් පර නාහට "මනොගණාදිතො ස්මිං නානම් ආ"යි ආකාරව විභත්ත්‍යාදෙශ ස්වරයා පරකල්හි "සසරෙ වා ගමො"යි "මන" ශබ්දයා කෙරෙන් සකාරාගමව "මනසා" යනුවේ. "සස්ස චො"යි සවිභක්තිහා ඔකාරව "මනසො" යනුවේ. ස්මාවිභක්තිහට "සස්ස චො"යි චග්‍රහණයෙන් ආකාරව "මනසා" යනුවේ. ස්මිංවිභක්තිහට "මනොගණාදිතො ස්මිංනානම් ආ"යි ඉකාරව "සසරෙ වා ගමො"යි සකාරාගමව "මනසි" යනුවේ.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | මනං | මනා මනානි |
| ආ– | (හෙ) මන මනා | (භවන්තො) මනා මනානි |
| ද්වි– | මනං | මනෙ මනානි |
| තෘ– | මනසා මනෙන | මනෙහි මනෙභි |
| ක– | මනසා මනෙන | මනෙහි මනෙභි |
| ච– | මනසො මනස්ස | මනානං |
| ප– | මනසා මනම්හා මනස්මා | මනෙහි මනෙභි |
| ෂ– | මනසො මනස්ස | මනානං |
| ස– | මනසි මනෙ මනම්හි මනස්මිං | මනෙසු |

"මන" ශබ්දයෙන් සිත කියයි.

සි පරකල්හි විභක්ති සහිත න්තුහට "අං නපුංසකෙහි"යි අංව "ගුණවං" යනුද, යො පරකල්හි "න්තුස්සන්තො යොසු ච"යි න්තු හා ගාන්තාසට අකාරව යොහට "අතො නිච්චං"යි නිව නි පරකල්හි "යොසු ච"යි දීර්ඝව "ගුණවන්තානි" යනුවේ. සෙස්ස පුංලිංගමෙනි. ඛඩසං ඥයා කෙරෙන් පරවූ යොහට "යොනං නි නපුංසකෙහි"යි නිව විකල්පයෙන් යොහට ලොප්ව දීර්ඝව "අඨීනි අඨී" යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | අඝී | අඝී අඝීනි |
| ආ– | (හෙ) අඝි | (හෙ) අඝී අඝීනි |
| ද්වි– | අඝිං | අඝී අඝීනි |
| තෘ– | අඝිනා | අඝීහි අඝීභි |
| ක– | අඝිනා | අඝීහි අඝීභි |
| ච– | අඝිනො අඝිස්ස | අඝීනං |
| ප– | අඝිනා අඝිම්හා අඝිස්මා | අඝීහි අඝීභි |
| ෂ– | අඝිනො අඝිස්ස | අඝීනං |
| ස– | අඝිම්හි අඝිස්මිං | අඝීසු අඝිසු |

"අඝී" ශබ්දයෙයි ඇට කියත්.

නපුංසක "දණ්ඩි" ශබ්දයා කෙරෙන් සිව් ලොප්ව "අසෙරස්සං" යනාදීන් හ්‍රස්වව "දණ්ඩි" යනුවේ-ආලපනයෙහි "(හෙ) දණ්ඩි (භවගෙනා) දණ්ඩිනි දණ්ඩී" යනුද, විතීයාවෙහි දණ්ඩිනං දණ්ඩිං දණ්ඩිනි දණ්ඩි යනුද්වේ, සෙස්ස පුංලිඞ්ගමෙනි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | ආයු | ආයූ ආයූනි |
| ආ– | (හෙ) ආයු | (හෙ) ආයූ ආයූනි |
| ද්වි– | ආයුං | ආයූ ආයූනි |
| තෘ– | ආයුනා | ආයූහි ආයූභි |
| ක– | ආයුනා | ආයූහි ආයූභි |
| ච– | ආයුනො ආයුස්ස | ආයූනං |
| ප– | ආයුනා | ආයූහි ආයූභි |
| ෂ– | ආයුනො ආයුස්ස | ආයූනං |
| ස– | ආයුම්හි ආයුස්මිං | ආයුසු ආයූසු |

"ආයු" ශබ්දයෙන් ආයුෂ කියත්.

විහතා මනාදි ගුණවං ගදජං අඝි ච දණ්ඩි ච
ආයු ඉච්චෙවව සඞ්ඛෙපාසඤ්ඤගෙසො නපුංසකෙ.

නපුංසකානං ලිඞ්ගා අඩගා.

**නපුංසකලිඞ්ගා.**

සිහට බව "සබ්බො" යනුද, සබ්බාදීන් කෙරෙන් පර ප්‍රථමා යො විභක්තිය "සබ්බනාමකාරතෙ පඨමො"යි ඒකාරබවට පැමිණ "සබ්බෙ" යනුදවේ. "ආය චතුත්‍ථෙකවචනස්සතු"යි සහට ආය යනාදෙශ හා ස්මා ස්මිං විභක්තීන්ට "ස්මාස්මින්නං වා"යි ආ ඒ ආදෙශ පත් තැනි "නයො නෙව ච සබ්බනාමෙහි"යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධව පූර්වසූත්‍රවලින් නියමිත ආදෙශයෝව "සබ්බස්ස" යනාදියවේ; සබ්බාදීන් කෙරෙන් පර නංහට "සබ්බතො නං සංසානං"යි සංසානං ච "සබ්බනාමානං නම්හි ච"යි ශබ්දාන්තයට ඒකාරට "සබ්බෙසං සබ්බෙසානං" යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | සබ්බො | සබ්බෙ |
| ආ- | (හෙ) සබ්බ සබ්බා | (හෙ) සබ්බෙ |
| ද්වි- | සබ්බං | සබ්බෙ |
| තෘ- | සබ්බෙන | සබ්බෙභි සබ්බෙහි |
| ක- | සබ්බෙන | සබ්බෙභි සබ්බෙහි |
| ච- | සබ්බස්ස | සබ්බෙසං සබ්බෙසානං |
| ප- | සබ්බම්හා සබ්බස්මා | සබ්බෙභි සබ්බෙහි |
| ෂ- | සබ්බස්ස | සබ්බෙසං සබ්බෙසානං |
| ස- | සබ්බම්හි සබ්බස්මිං | සබ්බෙසු |

### "සබ්බ" ශබ්දයෙන් සියල්ල කියත්.

ස්ත්‍රීලිඞ්ගයෙහි "සබ්බා" ශබ්දයා කෙරෙන් පර සවිභක්තිහට "ඝපතො ස්මිං ස්‍යානං සංසා"යි විකල්පයෙන් ස්‍යා යනාදෙශව "සංසා සෙවකවචනෙසු ච"යි සකාරාගමව "සබ්බස්සා සබ්බාය" යනුවේ. ස්මිංහටද මේ සූත්‍රයෙන්ම විකල්පයෙන් සංව සකාරාගමව "සබ්බස්සං සබ්බාසං" යනුවේ. සෙස්ස "කඤ්ඤා" ශබ්දයමෙනි. නපුංසකයෙහි සර්වනාමික විධානයන් හැර සෙස්ස "චිත්ත" ශබ්දයමෙනි. "පුබ්බ" ශබ්දයා කෙරෙන් පරවූ ස්ත්‍රීලිඞ්ග නොවන ස්මිංහට "යදනුපපන්නා නිපාතනා සිජ්ඣන්ති"යි විකල්පයෙන් ඒකාරව "පුබ්බෙ පුබ්බස්මිං" යනුවේ. සි පරකල්හි "ත"හා "එතතෙසං තො"යි සකාරව "සො" යනුවේ. තුන්ලිඟුයෙහි නාහට "තස්ස වා නත්තං සබ්බත්‍ථ"යි විකල්පයෙන් නකාරව "නෙන තෙන" යනාදියවේ. ස්ත්‍රීලිඞ්ගයෙහි තා ශබ්දයා කෙරෙන් පර සහට "තතො සස්ස ස්සාය"යි විකල්පයෙන් ස්සාය යනාදෙශ හා පූර්වසූත්‍රයෙන් ස්‍යා යනාදෙශව තා ශබ්දයාගේ ආකාරයට විකල්පයෙන් ඉකාරව "තිස්සාය තිස්සා තස්සා තාය" යනුවේ. ස්මිංහටද විකල්පයෙන් සංව ආකාරයට ඉකාරව "තිස්සං තස්සං තාසං" යනුවේ.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | සො | නෙ තෙ |
| ද්වි– | නං තං | නෙ තෙ |
| තෘ– | නෙන තෙන | නෙහි තෙහි නෙභි තෙභි |
| ක– | නෙන තෙන | නෙහි තෙහි නෙභි තෙභි |
| ච– | නස්ස තස්ස | නෙසං නෙසානං තෙසං තෙසානං |
| ප– | නම්හා තම්හා නස්මා තස්මා | නෙහි තෙහි නෙභි තෙභි |
| ෂ– | නස්ස තස්ස | නෙසං නෙසානං තෙසං තෙසානං |
| ස– | නම්හි තම්හි නස්මිං තස්මිං | නෙසු තෙසු |

පුල්ලිඞ්ගයි.

| | | |
|---|---|---|
| ප්‍ර– | සා | නා නායො තා තායො |
| ද්වි– | නං තං | නා නායො තා තායො |
| තෘ– | නාය තාය | නාහි තාහි නාභි තාභි |
| ක– | නාය තාය | නාහි තාහි නාභි තාභි |
| ච– | තිස්සාය තිස්සා තස්සා තාය | තාසං තාසානං |
| ප– | නාය තාය | නාහි තාහි නාභි තාභි |
| ෂ– | තිස්සාය තිස්සා තස්සා තාය | තාසං තාසානං |
| ස– | තිස්සං තස්සං තායං | තාසු |

ස්ත්‍රී ලිඞ්ගයි.

## “ත” ශබ්දයෙන් ශේෂ සත අට කියත්.

නපුංසක ලිඞ්ගයෙහි සහට සකාරනොව සිහට, අං යනාදේශව, “තං” යනුවේ. සර්වනාමික විධානයන් හැර සෙස්ස “චිත්ත” ශබ්දය මෙනි.

| | එකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර– | එසො | එතෙ |
| ද්වි– | එතං | එතෙ |
| තෘ– | එතෙන | එතෙහි එතෙභි |
| ක– | එතෙන | එතෙහි එතෙභි |
| ච– | එතස්ස | එතෙසං එතෙසානං |
| ප– | එතම්හා එතස්මා | එතෙහි එතෙභි |
| ෂ– | එතස්ස | එතෙසං එතෙසානං |
| ස– | එතම්හි එතස්මිං | එතෙසු |

පුල්ලිඞ්ගයි.

ස්ත්‍රී ලිඞ්ගයෙහි ස්මාට ස්සාය යනාදෙශ හා සා යනාදෙශද "එති මාසමි"යි එතා ශබ්දාන්තයට ඉකාරද වීමෙන් **"එතිස්සාය එතිස්සා"** යනුද, "ඝතො නාදීනං"යි ඝහට ආයව "එතාය" යනුදවේ.

| | | |
|---|---|---|
| ප්‍ර– | එසා | එතා එතායො |
| ද්වි– | එතං | එතා එතායො |
| තෘ– | එතාය | එතාහි එතාභි |
| ක– | එතාය | එතාහි එතාභි |
| ච– | එතිස්සාය එතිස්සා එතාය | එතාසං එතාසානං |
| පං– | එතාය | එතාහි එතාභි |
| ෂ– | එතිස්සාය එතිස්සා එතාය | එතාසං එතාසානං |
| ස– | එතිස්සං එතස්සං එතායං | එතාසු |

ස්ත්‍රීලිඞ්ගයි.

**"එත" ශබ්දයෙන් තෙල යන අර්ථ කියත්.**

නපුංසක ලිඞ්ගයෙහි සර්වනාමික විධාන හැර සෙස්ස "චිත්ත" ශබ්දය මෙනි.

**සි** පරකල්හි **ඉම** ශබ්දයහට "අනපුංසකස්සායං සිම්හි"යි **අයං** යනාදෙශව සිහට ලොප්ව **"අයං"** යනුද, "සබ්බනාමකාරතෙ පඨමො"යි **යො**හට එකාරව "ඉමෙ" යනුදවේ. **නා**පරකල්හි **ඉම** ශබ්දයට **අන ඉමි** යනාදෙශව මුලපසෙහි **නා**හට **එන**ව **"අනෙන ඉමිනා"** යනුවේ. හි පරකල්හි "සබ්බස්සිමස්සෙවා"යි **ඉම** ශබ්දයට විකල්පයෙන් එකාරව "එහි ඉමෙහි" යනුවේ. **ස ස්මා ස්මිං** යන මොවුන් පරකල්හි "ඉමසද්දස්ස ච"යි **ඉම** ශබ්දයහට විකල්පයෙන් අකාරාදෙශව **"අස්ස ඉමස්ස"** යනාදියවේ. **නං** පරකල්හි "සබ්බස්සිමස්සෙවා"යි විකල්පයෙන් **ඉම** ශබ්දයට එකාරව **"එසං එසානං ඉමෙසං ඉමෙසානං"** යනුවේ.

| | **එකවචන.** | **බහුවචන.** |
|---|---|---|
| ප්‍ර– | අයං | ඉමෙ |
| ද්වි– | ඉමං | ඉමෙ |
| තෘ– | අනෙන ඉමිනා | එහි එභි ඉමෙහි ඉමෙභි |
| ක– | අනෙන ඉමිනා | එහි එභි ඉමෙහි ඉමෙභි |
| ච– | අස්ස ඉමස්ස | එසං එසානං ඉමෙසං ඉමෙසානං |
| පං– | අම්හා අස්මා ඉමම්හා ඉමස්මා | එහි එභි ඉමෙහි ඉමෙභි |
| ෂ– | අස්ස ඉමස්ස | එසං එසානං ඉමෙසං ඉමෙසානං |
| ස– | අස්මිං ඉමම්හි ඉමස්මිං | එසු ඉමෙසු |

පුල්ලිඞ්ගයි.

**"ඉම" ශබ්දයෙන් මේය යන අර්ථ කියත්.**

ස්ත්‍රීලිඞ්ගයෙහි ද සිපරකල්හි **අසං** යනාදෙශව සිහට ලොප්ව **"අසා"** යනුවේ. සෙස්ස එතා ශබ්දය මෙනි, **සංසා** යනාදෙශයන් පරකල්හි අකාර බව පමණක් වෙනසි-නපුංසක ලිඞ්ගයෙහි සිපර කල්හි ඉම ශබ්දයහට "ඉමස්සිදමංසිසු නපුංසකෙ"යි ඉමහට විකල්ප යෙන් ඉදංව **"ඉදං ඉමං"** යනුවේ. යොහට නි ආදෙශවූ තන්හි **"ඉමානි"** යනුවේ. සෙස්ස පුල්ලිඟුමෙනි.

සිපරකල්හි අමු ශබ්දයාගේ මකාරයට "අමුස්ස මො සං"යි සකාරව පසෙක්හි, කකාරාගමව සිහට ඔව **"අසු අමුකො"** යනුවේ.

| එකවචන. | බහුවචන. |
|---|---|
| ප්‍ර– අසු අමුකො | අමූ අමුයො |
| ද්වි– අමුං | අමූ අමුයො |
| තෘ– අමුනා | අමූහි අමූභි |
| ක– අමුනා | අමූහි අමූභි |
| ච– අමුනො අමුස්ස | අමූසං අමූසානං |
| ප– අමුනා අමුම්හා අමුස්මා | අමූහි අමූභි |
| ෂ– අමුනො අමුස්ස | අමූසං අමූසානං |
| ස– අමුම්හි අමුස්මිං | අමූසු |

පුල්ලිඟුයි.

| | |
|---|---|
| ප්‍ර– අසු | අමූ අමුයො |
| ද්වි– අමුං | අමූ අමුයො |
| තෘ– අමුයා | අමූහි අමූභි |
| ක– අමුයා | අමූහි අමූභි |
| ච– අමුස්සා අමුයා | අමූසං අමූසානං |
| ප– අමුයා | අමූහි අමූභි. |
| ෂ– අමුස්සා අමුයා | අමූසං අමූසානං |
| ස– අමුස්සං අමුයං | අමූසු |

ස්ත්‍රීලිඟුයි.

**"අමු" ශබ්දයෙන් ඔම්ය යහ අට කියන්.**

නපුංසකලිඞ්ගයෙහි විභක්ති සහිත **අමුහට** "අමුස්සාදුං"යි **අදුංව** **"අදුං"** යනුවේ. නාහියාදි ගැම පුල්ලිඟුමෙනි.

"සෙසෙසුව" **කිංශබ්දයට** කකාරාදෙශව **"කො"**, යනාදිය වේ.

| එකවචන. | බහුවචන. |
|---|---|
| ප්‍ර– කො | කෙ |
| දු– කං | කෙ |
| තෘ– කෙන | කෙහි කෙභි |
| ක– කේන | කෙහි කෙභි |
| ච– කස්ස | කෙසං කේසානං |
| ප– කම්හා කස්මා | කෙහි කෙභි |
| ඡ– කස්ස | කෙසං කෙසානං |
| ස– කම්හි කස්මිං | කෙසු |

පුල්ලිඟුයි.

| | |
|---|---|
| ප්‍ර– කා | කා කායො |
| දු– කං | කා කායො |
| තෘ– කාය | කාහි කාභි |
| ක– කාය | කාහි කාභි |
| ච– කස්සා කාය | කාසං කාසානං |
| ප– කාය | කාහි කාභි |
| ඡ– කස්සා කාය | කාසං කාසානං |
| ස– කස්සං කායං | කාසු |

ස්ත්‍රීලිඟුයි.

**"කිං" ශබ්දයෙන් කිමෙක යන අර්ථ කියන්.**

නපුංසකයෙහි **සි**හට **අං** ආදෙශ හා **යො**හට **නි** ආදෙශත් හැර සෙස්ස පුල්ලිඟුමෙනි.

**සිවිභක්ති** පරකල්හි විභක්ති සහිත **තුම්හාම්හ** ශබ්දයන්ට "තුම්හං සිම්හි ච"යි **ත්වං අහං** යනාදෙශ හා මෙහිව චශබ්දයෙන් **තුම්හ** ශබ්දයට තුවංව **"ත්වං තුවං අහං"** යනුවේ. **යො**හට එකාරව **"තුම්හෙ"** යනුද, "මයං යොම්හි පඨමෙ"යි අම්හශබ්දයට මයංව **"මයං"** යනුදවේ. **අං** පරකල්හි විභක්ති සහිත **තුම්හාම්හ** ශබ්දයන්ට **තංමං** යනාදෙශව "තවං මමං ච නවා"යි විකල්පයෙන් **තවං මමං**ව "තුම්හස්ස තුවං ත්වම්මම්හි"යි තුම්හ ශබ්දයට **"තුවං ත්වං** යනාදෙශව **"තං තවං තුවං ත්වං මං මමං"** යනුවේ. "වායවප්පඨමො"යි විතීයා යොහට විකල්පයෙන් **ආකං**ව **"තුම්හාකං තුම්හෙ අම්හාකං අම්හෙ"** යනුවේ. "නාම්හි තයා මයා"යි **නා**පරකල්හි විභක්ති සහිත **තුම්හාම්හ** ශබ්දයන්ට **තයා මයා** යනාදෙශව "තයා තයිනං තකාරො ත්වත්තං වා"යි විකල්පයෙන් තහට ත්වයනාදෙශව **"ත්වයා තයා මයා"** යනුවේ. **ස**පරකල්හි "තවමම සෙ"යි **තව මම**ව "තුය්හං මය්හං ච"යි.

තුය්හං මය්හංව "සස්සං"යි සහට අංව, "අම්හස්ස මමං සවිභත්තිස්ස සෙ"යි විභක්ති සහිත අම්හ ශබ්දයට මමං යනාදෙශව **"තව තුය්හං තුම්හං මම මය්හං අම්හං මමං"** යනුවේ. "තුම්හාම්හෙහි නමාකං"යි නංහට ආකංව **"තුම්හාකං අම්හාකං** යනුවේ. **සිං**පරකල්හි "තුම්හාම්හාකං තයිමයි" යන සූත්‍රයෙන් **තයිමයි** යනාදෙශව "තයාතයී නං තකාරො ත්වත්තං වා"යි විකල්පයෙන් **ත**හට **ත්ව** ආදෙශව **"ත්වයි තයි මයි"** යනුවේ. මේ ශබ්දදෙක තුන්ලිඟුයෙහිම සමයි.

| | ඒකවචන. | බහුවචන. |
|---|---|---|
| ප්‍ර- | ත්වං තුවං-අහං | තුම්හෙ-මයං අම්හෙ |
| ද්වි- | තං තවං තුවං ත්වං-මං මමං | තුම්හාකං තුම්හෙ-අම්හාකං අම්හෙ |
| තෘ- | ත්වයා තයා-මයා | තුම්හෙහි තුම්හෙභි-අම්හෙහි අම්හෙභි |
| ක- | ත්වයා තයා-මයා | තුම්හෙහි තුම්හෙභි-අම්හෙහි අම්හෙභි |
| ච- | තව තුය්හං තුම්හං-මම මය්හං අම්හං මමං | තුම්හාකං තුම්හෙ-අම්හාකං අම්හෙ |
| ප- | ත්වයා තයා-මයා | තුම්හෙහි තුම්හෙභි-අම්හෙහි අම්හෙභි |
| ෂ- | තව තුය්හං තුම්හං-මම මය්හං අම්හං මමං | තුම්හාකං තුම්හෙ-අම්හාකං අම්හෙ |
| ස- | ත්වයි තයි-මයි | තුම්හෙසු-අම්හෙසු |

**"තුම්හ" ශබ්දයෙන් තෝය යන අර්ථ හා "අම්හ" ශබ්දයෙන් මමය යන අර්ථ කියත්.**

ද්විතීයා චතුර්ථී ෂෂ්ඨී බහුවචනයන් පරකල්හි පදයා කෙරෙන් පරවූ **තුම්හාම්හ** ශබ්දයන්ට "පදතො දුතියාචතුත්ථීඡට්ඨීසු වොනො"යි **වොනො** යනාදෙශව **රක්ඛතු වො පස්සතු නො, දදාති වො දදාති නො, සඛා වො සඛා නො"** යනුවේ. මෙහි "රක්ඛතු පස්සතු" යනාදිය පදයි, එවුන් කෙරෙන් පර **තුම්හාම්හ** ශබ්දයන්ට **වොනො** යනාදෙශයි. චතුර්ථී ෂෂ්ඨී එකවචනයන් පරකල්හි "තෙමෙකවචනෙ"යි **තෙමෙ** යනාදෙශව **"දදාමි තෙ, දදාහි මෙ, ඉදං තෙ අසං මෙ"** යනුවේ. "නාම්හි" යන සූත්‍රයෙන් "තුම්හාම්හ" ශබ්දයන් කෙරෙන් පරවූ අංහට මෙහි ආදෙශ ප්‍රතිෂෙධව "තං මමම්හි"යි **තංමං** යනාදෙශව **"පස්සෙථ තං අජිනි මං"** යනුවේ. "වා තතියෙ ච"යි තෘතීයෛකවචනයෙහි විකල්පයෙන් **තෙ මෙ** යනාදෙශව **"කතං තෙ තයා වා, කතං මෙ මයා වා"** යනුවේ. "බහුවචනෙසු වොනො"යි තෘතීයා බහුවචන

යත්හි **චොරෙනා** යනාදේශව **"කතං වො, කතං නො"** යනුවේ. මෙහි බහුවචනග්‍රහණයෙන් ප්‍රථමා **යොහට් චොරෙනාව "ගාමං වො ගච්ඡෙය්‍යාථ, ගාමං නො ගච්ඡෙය්‍යාම"** යනුවේ.

**විශබ්දය** ආදිකොට ඇති **අෂ්ටාරස** ශබ්දය කෙළවරකොට ඇති ශබ්දයෝ බහුවචනාන්තයෝයි. **යොපරකල්හි** "යොසු ද්විනනං වෙ ච"යි **ද්විශබ්දයහට වෙ** යනාදෙශව **"ද්වෙ දුවෙ"** යනුවේ. **නං** පරකල්හි **ද්විශබ්දයා** කෙරෙන් පරව "නො ච ද්වාදිතො නම්හි"යි නකාරාගමව **"ද්විනනං"** යනුවේ. තිලිඟුයෙහි සම්යි. **වීසති** ශබ්දයාගේ **නවුති** ශබ්දය දක්වා ස්ත්‍රීලිඞ්ග එකවචනාන්තයි. **සත සහස්‍ර** ශබ්ද නපුංසක එකවචනයි.

| | **බහුවචන.** | **එකවචන.** | **එකවචන.** | **එකවචන.** |
|---|---|---|---|---|
| **ප්‍ර**– | දුවෙ ද්වෙ | විසති | සතං | කොටි |
| **ද්වි**– | දුවෙ ද්වෙ | විසතිං | සතං | කොටිං |
| **තෘ**– | ද්වීහි ද්විහි | විසතියා | සතෙන | කොටියා |
| **ක**– | ද්විහි ද්වීහි | විසතියා | සතෙන | කොටියා |
| **ච**– | ද්විනනං දුවිනනං | විසතියා | සතාය සතස්ස | කොටියා |
| **ප**– | ද්වීහි ද්විහි | වීසතියා | සතා සතම්හා සතස්මා | කොටියා |
| **ෂ**– | ද්විනනං දුවිනනං | විසතියා | සතස්ස | කොටියා |
| **ස**– | ද්විසු | වීසතියා | සතෙ සතම්හි සතස්මිං | කොටියා |

"ක්වචි තො පඤ්චම්‍යත්ථෙ"යි පඤ්චම්‍යර්ථයෙහි **තො** ප්‍රත්‍යයව "ත්වාදයො විභත්තිසඤ්ඤා"යි **තො** ප්‍රත්‍යය පටන් **දානි** ප්‍රත්‍යය කෙළවර කොට ඇත්තවුන්ට විභක්ති සංඥාව "චොරස්මා" යන වාක්‍යයෙහි **"චොරතො"** යනුවේ. "ක්වචිතො"යි සූත්‍ර විධාකරණයෙන් සප්තම්‍යර්ථයෙහිද **තො** ප්‍රත්‍යයව "ආදිස්මිං" යන වාක්‍යයෙහි **"ආදිතො"** යනුවේ. උපසර්ග නිපාතයන් කෙරෙන් පර සියලු විභක්තීන්ට ලොප් වේ. අත්ථාභිමුඛං නමති අත්තනි ච අඤ්ඤං නාමෙතීති නාමං.

**මෙතෙකින් නාමය කියා නිමවනලදී.**

---

සමාසො ඉති, "සමාසො" යන්නෙහි සංඥා නාම; භින්නත්ථානං, වෙන් වෙන්වූ අර්ථ ඇති; පදානං, පදයන්ගේ; එකත්ථතා, සමානාර්ථ බවයි–වාක්‍යත්ථං, වාක්‍යය පිණිස; විභාසා ඉති, විභාසා යනු; අධිකාතබ්බං, සම්බන්ධකටයුතුයි–භින්නප්පවත්තිනිමිත්තා, වෙන් වෙන්වූ ශබ්දප්‍රවෘත්ති නිමිත්තකොට ඇත්තාවූ; සද්දා, ශබ්දයෝ; එකස්මිං වත්ථුනි, එක් වස්තුවෙක්හි; පවත්තා, පැවැත්තාහු; තුල්‍යාධිකරණා,

සමානාධිකරණ නම් වෙත් — සඤ්ඤාවාරෙන, සංඥාමුඛයෙන්; සමා සවිධායකානි, සමාසවිධි කරණුලැබේත් — අගහිතවිසෙසනා, නොගත්නාලද විශෙෂණය ඇති; බුධි, බුධිතොමෝ; විසෙස්සම්හි, විශෙෂ්‍යයාකෙරෙහි; නඋප්පජ්ජන්ති, නූපදීනුයි; විසෙසනං, විශෙෂණය, පුබ්බං හොති, පූර්වේ — තප්පකාසනත්ථං, ඒ සමානාධිකරණත්ව ප්‍රකාශකරණුපිණිස; පයුත්තා, ප්‍රයොගකරණ ලද්දාවූ; සමාසතො, සමාසයාකෙරෙන්; අභිහිතා, අධිකවූ; චයොගුනි, **චය ණොය** යන; එතෙ, මොවුහු — කම්මධාරයො, කර්මධාරය සමාසයද; චදිගුච, දිගු සමාසයද; තප්පුරිසොච, තත්පුරුෂ සමාසයද (යන;) තයො, තුන්දෙන; පරපදෙ, උත්තරපදයෙහි; ලිඞ්ගං, ලිඟු; ලාභිනො, ලබන්නාහ; බහුබ්බිහි, බහුව්‍රීහි සමාසය; පදන්තරෙ, අන්‍යපදයෙහි (ලිඟු ලබන්නේය) — නිවුත්ති, වැළැක්ම වේ — විසෙසනවිසෙස්සානං, විශෙෂණ විශෙෂ්‍යයන් තමන් — ද්වෙධාච, වකත්‍රිධාවද; යථාතතාහි, පෙළවූ පරිදෙදන් වේ — අයුත්තත්ථානං අපි, අයුක්තාර්ථශබ්දයන්ගේද — **කර්මධාරය සමාසයි.**

අධිකත්ථවචනෙ, අධිකාර්ථවචනයෙහි — ප්‍රතීතිත්ථං, ප්‍රතීතිඥපිණිස; අරොපිතත්ථං, ආරොපණයකරණලද අර්ථඇති; වචනං, කිම; අධිකත්ථවචනං, අධිකාර්ථවචන නම් වේ — දබ්බා උපසිත්තං, දීසෙන්මුසුවූ — කථනා, කිමහේතුකොටගෙණ; එත්ථ, මේතැන්හි; අයුත්තත්ථතා, අයුක්තාර්ථබවෙක්; නත්ථි, නැති — ගමකත්තනම්පි, ගමකබවද; සමාසස්ස, සමාසයට; නිබන්ධනං, කාරණයි — **තත්පුරුෂසමාසයි.**

පුම්භාවාතිදෙසා, පුංවත්කිරීම හෙතුකොටගෙණ; * පුබ්බුත්තරපදෙසු, පූර්වෝත්තර පදයන්හිවූ; ආදිප්පච්චයානං, ආදිප්‍රත්‍යය ප්‍රත්‍යය, යන මොවුන්ගේ, අභාවො, නොවීමයි — අජ්ජෙසු ඉති, "අජ්ජෙසු" යන; බහුත්තග්ගහණෙන, බහුවචන ග්‍රහණයෙන්; කිඤ්චි, කිසිතැනෙක්හි; පඨමන්තානංඅපි, ප්‍රථමාන්තවූ නාමයන්ගේද; (සමාසයට උදාහරණ දක්වනුලැබේ) — අප්පඨමන්තානං ඉති, ප්‍රථමාන්තයන්ගේ සමාසය නොවේයනු; කිං, කිම;? දෙසිතො බුද්ධෙන යො ධම්මො, "දෙසිතො=ජො=ධම්මො" (යනතන්හි නොවනපිණිසයි) — **බහුව්‍රීහිසමාසයි.**

---

.* මෙහි "පුබ්බපදෙසු"යි යොනැබැව් හැගේ, කුමක්හෙයින්දයත් "ඉත්ථියං භාසිතපුම්ඉත්ථි පුමාව චෙ" යන සූත්‍රයෙන් තුල්‍යාධිකරණ පදයක් පරකල්හි භාෂිතපුම්ශබ්දයන්ටම පුංවද්භාවය නියමිතාවේ, එබැවින් උත්තරපදයන්ට මෙයින් පුංවද්භාවයක් නොවනහෙයිනි. උත්තරපදයන්ට වූකලි බහුව්‍රීහි සමාසය අන්‍යපදයෙහි ලිඟු ලැබීමෙන් පුංවද්භාව පත්නෙති "ඛවාදිමජ්ජුත්තර"දීන් ග්‍රාහ්‍යවේ.

රූපං, රූපයතෙම; රූපපනලක්ඛණං, විනාශවීම ලක්ෂණකොට ඇත්තේයි-ආදිසද්දත, ආදිශබ්දයෙන්; අඤ්ඤත්‍රාපි, මෙයින් පිටත් සෙසුතන්හිද (එකත්ව නපුංසකත්වය වේ)-භින්නලිඞ්ගානං, භින්න ලිඞ්ගවාචී නාමයන්ගේ (එකත්ව නපුංසකත්වයට උදාහරණ දක්වනු ලැබේ)-සඞ්ඛ්‍යාපරිමාණානං, සඞ්ඛ්‍යාපරිමාණවාචී ශබ්දයන්ගේ (එකත්වනපුංසකත්වයට උදාහරණ දක්වනුලැබේ)-**ද්වන්දසමාසයි.**

නිච්චසමාසත්තා, අවිකල්ප සමාසබැවින්; ආධාරභූතායම්වීථියං ඉති, "ආධාරභූතායම්වීථියං"කියා; පදන්තරෙන, අන්‍යපදයක් සමග; විග්ගහො, වාක්‍යය ගණුලැබේ-ලුජ්ජරෙ, ලොප්කරණු ලැබෙත්-අධිවීථිඉති, "අධිවීථි" යන; එතං පදං, මේපදය; වීථියං ඉති, වීථියෙහි යන; එතං අත්ථං, මේ අර්ථය, වදති, කියා-ඨවිඉති, ඨවියනු; කිං, කිම? උපනගරෙ, "උපනගරෙ" යනතන්හි (අංශනාදෙශ නොවන පිණිසයි)-විච්ඡායං, මේ සමාසය වීප්සාවෙහිය-විච්ඡා නම්, ආමෙණ්ඩිතයි, ආමේණ්ඩිතනම්:-

**"භයෙ කොධෙ පසංසායං තුරිතෙ කොතූහලච්ඡරෙ,**
**හාසෙ සොකෙ පසාදෙ ච කරෙ ආමෙණ්ඩිතං බුධො"**යි.

භය ක්‍රෝධාදියෙහි එකවචනය දෙවිටක් කියන්නේය යේ විච්ඡා නම් වේ, ආමේණ්ඩිත නමුදු වේ-වජ්ජමානා, හරිණුලබන්නාවූ; සීමා, සීමාතෝමෝ; මරියාද, මර්‍යාද නම—අපාදානවිධානෙනෙව, අපාදානකාර්‍ය්‍යය කළහෙයින්ම-පුබ්බපදත්ථප්පධානත්තාභාවා, පූර්වපදයාගේ අර්ථය ප්‍රධානකොට නැතිබැවින්; අබ්‍යයීභාවාභාවො, අව්‍යයීභාවසමාසයාගේ නොවීම වෙයි; කම්මධාරයොඑව, කර්මධාරය සමාසයම වේ-**අව්‍යයීභාවසමාසයි.**

අබ්‍යයීභාවසමාසො, අව්‍යයීභාවසමාසයද; කම්මධාරයතප්පුරිසාචෙ, කර්මධාරය සමාසය තත්පුරුෂසමාසය යන දෙකද; ද්වන්දොච, ද්වන්දසමාසයද; බහුබ්බිහි, බහුව්‍රීහිසමාසයද (යන මොවුහු,) පුබ්බපරූභයඤ්ඤපදත්ථප්පධානා-පුබ්බ, පූර්වපදාර්ථය; පර, පර පදාර්ථය; උභය, උභයපදාර්ථය; අඤ්ඤපදත්ථප්පධානා, අන්‍යපදාර්ථය යන මොවුන් ප්‍රධානකොට ඇත්තාහුයයි; ඤෙය්‍යා, දතයුතුතාහුයි.

**සමාස ගණ්ඨිපදය කියා නිමවනලදී.**

---

**මාහාවීරෝ** මහාවීරා—යන තන්හි **මහන්ත** ශබ්ද **මහන්ත** කියාවේ, ඔහුකෙරෙන් පරව සිවිභක්තිව සිහට ඔකාරයෙක් ආදෙශව පැමිණ **මහන්තො** කියාවේ. ච යන නිපාත කෙරෙන්ද සිවිභක්තිව ලොප්ව **ච** කියා වේ. නාශබ්ද **නා** කියාවේ, ඔහු කෙරෙන් **සිවිභක්තිවේ,**

සිපරකල්හි නශබ්දයට සකාරව සිහට ඔකාරව පැමිණ සො යනු වේ. වීරශබ්දයාගෙරෙන්ද සිව සිහට ඔකාරව පැමිණ වීරො යනු වේ. පසුවද චයන නිපාතව සිවලොප්ව චයි වේ. "මහන්තො ච සො වීරො ච" යන වාක්‍යයෙහි විශෙෂණ විශෙෂ්‍යවූ සමානාධිකරණවූ පදයෝ දෙදෙනෙක් යම්කලෙක්හි සමාසකරණු ලැබෙත්ද එකල්හි ඒ සමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙත්තෙහි "විප දෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො" යන සූත්‍රයෙන් සමාසවූවි, ඕනට ඒ සූත්‍රයෙන්ම කම්මධාරය සංඥද වේ, උක්තාර්ථවූ වාක්‍යයන්ට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යායහෙයින් අප්‍රයොග වේ, පූර්වෝත්තර පදයන් සම්බන්ධවූ විභක්තීන්ට "තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙන් ලොප්වේ, විභක්තීන්ට ලොප්කළකල්හි ස්වරාන්තයට "පකතිචස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘතිවේ, තුල්‍යාධිකරණවූ උත්තරපදයා පරකල්හි "මහන්ත" ශබ්දයහට "මහතං මහා තුල්‍යාධිකරණෙ පදෙ" යන සූත්‍රයෙන් **මහා** යනාදෙශවේ, සමාසයා තමා අලිඟුහෙයින් "තද්ධිතසමාසකිතකා නාමංවාතවෙතුනාදිසුච" යන සූත්‍රයෙන් නාමවත්ව ඔහුකෙරෙන් සිව සිහට ඔව පැමිණ "මහාවීරො" යනුද, බහුබසෙහි යොහට ආව **"මහාවීරා"** යනුදවේ.

**රතනපටී**—යන තන්හි "රතනාම් සා පටී ච" යන වාක්‍යයෙහි "චසා"යන මොවුන්ට අප්‍රයොගව "රතනාපටී"යි ශෙෂව පූර්වෝත්තර පදයන්හි විභක්තිලොප්ව "කම්මධාරයසඤ්ඤෙ ච"යි පූර්වපදයට පුංවත්ව සමාසයා තමා අලිඟුහෙයින් නාමවූත්ව සිව ලොප්ව "රතන පටී" යනුවේ.

**මහාසධා**-යන තන්හි "මහන්තී ච සා සධා ච"යන වාක්‍යයෙහි "චසා" යන දෙකට අප්‍රයොගව විභක්තිලොප්ව පූර්වපදය පුංවත්ව "මහන්ත" ශබ්දයට **මහා** යනාදෙශව නාමවත්ව සිහට ලොප්ව "මහාසධා"යනුවේ.

**නීලුප්පලං**-යන තන්හි "නීලං ච තං උප්පලං ච" යන වාක්‍යයෙහි "චතං" යන දෙකට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නාමවත්ව සිව සිහට අංව "නීලුප්පලං" යනුවේ.

**සඤ්ජිසාමා**-යනතන්හි "සඤ්ජි ච සා සාමා ච" යන වාක්‍යයෙහි "චසා"යන මොවුන්ට අප්‍රයොගව විභක්ති ලොප්ව නාමවූත්ව සිහට ලොප්ව "සඤ්ජිසාමා" යනුවේ.

**මුඛමෙවචන්දො**-යනතන්හි "මුඛමෙව චන්දො"යන වාක්‍යයෙහි "එව" යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නාමවත්ව සිව ඔව "මුඛචන්දො" යනුවේ.

**බහනිස්සගුණො**-යනතන්හි "ගුණො ච සො බහනියො ච"යන වාක්‍යයෙහි "චසො" යන වොවුත්ට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව විශෙෂණ විශෙෂ්‍යයන් තමන් එකත්‍රගුණයේ ඊපසෑවූ පරිද්දෙන් වනහෙයින් විශෙෂණයා පරපදව සිව ඔව "බහනිස්සගුණො", යනුවේ.

**අසුරෝ**-යනතන්හි **න** නිපාතව ඔහුකෙරෙන් පර සිහට ලොප්ව "සුර" ශබ්දයාකෙරෙන් සිව ඔව පැමිණ "නසුරො"යි කර්මධාරය සමාසකළකල්හි "උභෙ තප්පුරිසා"යි තත්පුරුෂසංඥව තත්පුරුෂයෙහි නකාරයට "අත්ත නන්නස්ස තප්පුරිසෙ"යන සූත්‍රයෙන් අකාරාදේශව විභක්තිලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "නාසුරෝ" යන වාක්‍යයෙහි "අසුරෝ"යනුවේ.

**අනසෙසා**-යනතන්හි "න අසෙසා"යන වාක්‍යයෙහි **න** නිපාතයට "සරෙඅන්"යන සූත්‍රයෙන් **අන්** ආදෙශව පැමිණ විභක්ති ලොප ප්‍රකෘති ආදියව "අනසෙසා" යනුවේ.

**අපුනගෙය්‍යා**-යනතන්හි "නපුන"යන නිපාතයන් කෙරෙන් පර සිහට ලොප්ව "ගෙය්‍යා" ශබ්දයාකෙරෙන්ද පර සිහට ලොප්ව "න පුන ගෙය්‍යා"යන වාක්‍යයෙහි **න** යන්නට අකාරව "අපුනගෙය්‍යා"යනුවේ-පුන, නැවත; නගෙය්‍යා, නොකියයුත්තීය්-අද්‍රුකත්‍රීම සමාසයයි.

**තිලොකං**-යනතන්හි "තයො ලොකා සමාහටා" යන වාක්‍යයෙහි "සමාහටා"යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව "සඞ්ඛ්‍යාපුබ්බො දිගු"යන සූත්‍රයෙන් දිගුසංඥව "දිගුස්සෙකත්තං"යන සූත්‍රයෙන් එකත්ව නපුංසකත්වව නම්වත්ව සිව සිහට අංව පැමිණ "තිලොකං" යනුවේ-**කර්මධාරය සමාසයි.**

---

**ගාමගතො**-යනතන්හි **ගාම** ශබ්දයාකෙරෙන් අංව පැමිණ **ගත** ශබ්දයාකෙරෙන් සිව ඔව පැමිණ "ගාමං ගතො"යන වාක්‍යය වේ, මෙහි විත්ථාරාදිගු උත්තරපද නාමයන් හා යම්සේලෙස්හි සමාසකරණු ලැබෙත්ද එකල්හි ඒ සමාසය "නාමානං සමාසො යුත්තත්ථො"යනු වැටෙන්නෙහි "අමාදයො පරපදෙහි"යන සූත්‍රයෙන් සමාසව එම සූත්‍රයෙන් තත්පුරුෂ සංඥද වේ, නැවත විභක්තීන්ව ලොප්ව ප්‍රකෘතිවව සමාසය නාමා අලිගුණ්ගෙයින් "තදිතාදී" සූත්‍රයෙන් නාමවූත්ව සිව ඔව "ගාමගතො" යනුවේ.

**රාජහතො**-යනතන්හි "රාජ" ශබ්දයාකෙරෙන් **නා**හට **රඤ්ඤා** යනාදෙසව "හත" ශබ්දයාකෙරෙන් සිව ඔව "රඤ්ඤාහතො" යන වාක්‍යයෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව පැමිණ "රාජහතො" යනුවේ.

**සොණ්ඩලෙඛ්‍යා**-යනතන්හි "සොණ්ඩහි ලෙඛ්‍යා"යන වාක්‍ය යෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව බව පැමිණ "සොණ්ඩ ලෙඛ්‍යා" යනුවේ.

**දධිභොජනං**-යනතන්හි "දධි" ශබ්දයාකෙරෙන් නාව "උප සිත්ත" ශබ්දයාකෙරෙන් හා "භොජන" ශබ්දයාකෙරෙන් සිව අංව පැමිණ "දධිනා උපසිත්තං භොජනං" යන වාක්‍යයෙහි"උපසිත්තං" යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව අංව පැමිණ "දධිභොජනං" යනුවේ.

**අසිකලම්භො**-යනතන්හි "අසිනා කලහො"යන වාක්‍යයෙහි විභ ක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව පැමිණ "අසිකලහො" යනුවේ.

**බුඩදෙය්‍ය**.-යනතන්හි "බුඩස්ස දෙය්‍යං" යන වාක්‍යයෙහි විභ ක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව අංව පැමිණ "බුඩදෙය්‍යං" යනුවේ.

**පරස්සපදං, අත්තනොපදං**-යන දෙතන්හි "තෙසං විභත්තියො ලොපාච" යන සූත්‍රයෙහි චශබ්දයෙන් විභක්තීන්ට ලොප්නොව සමාසවේ.

**චොරභයං**-යනතන්හි "චොරස්මා භයං" යන වාක්‍යයෙහි විභ ක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව අංව පැමිණ "චොරභයං" යනුවේ.

**බන්ධනමුත්තො**-යනතන්හි "බන්ධනස්මා මුත්තො" යන වාක්‍ය යෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔවපැමිණ "බන්ධන මුත්තො" යනුවේ.

**රාජපුත්තො**-යනතන්හි "රඤ්ඤො පුත්තො" යන වාක්‍යයෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව පැමිණ "රාජපුත්තො" යනුවේ.

**බ්‍රාහ්මණකණ්හදන්තා**-යනතන්හි පදත්‍රයක් බැවින් පළමු කොට "කණ්හා ච තෙ දන්තා චෙති=කණ්හදන්තා"යි කර්මධාරය සමා සකොට නැවත "බ්‍රාහ්මණ" ශබ්දය හා සමාසකිරීමෙහි "බ්‍රාහ්මණස්ස කණ්හදන්තා"යි වාක්‍යයව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව යොව යොහට ආවපැමිණ "බ්‍රාහ්මණකණ්හදන්තා" යනුවේ.

**රාජස්සපුරිසා**-යනතන්හිද පදත්‍රයක් බැවින්"අස්සා ච පුරිසාච= අස්සපුරිසා"යි ද්වන්ද්වසමාසව නැවත "රඤ්ඤො අස්සපුරිසා"යන වාක්‍ය යෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව යොව යොහට ආව "රාජ ස්සපුරිසා" යනුවේ.

**රාජගරුපුත්තො**-යනතන්හි පදත්‍රය සමාසවන්නෙහි "රඤ්ඤො, ගරුනො පුත්තො" ති වාක්‍යයෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "රාජගරුපුත්තො" යනුවේ.

**රූපසඤ්ඤා**-යනතන්හි "රූපෙ සඤ්ඤා" යන වාක්‍යයෙහි විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව සිහට ලොප්ව "රූපසඤ්ඤා" යනුවේ.

**කූපමණ්ඩූකො**-යනතන්හි "කූපෙ මණ්ඩූකො විය" යන වාක්‍යයෙහි "විය" යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "කූපමණ්ඩූකො" යනුවේ.

**නගරකාකො**-යනතන්හි "නගරෙ කාකො විය" යන වාක්‍යයෙහි "විය" යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "නගරකාකො" යනුවේ.

**අන්තෙවාසිකො**-යනතන්හි "තෙසං විභත්තියො ලොපාච" යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් පූර්වපදයෙහි විබත්ට ලොප්නොව සිඩයි-**තත්පුරුෂ සමාසයි.**

---

**ආගතසමණො**-යනතන්හි "ආගතා සමණා යං සො" යන වාක්‍යයෙහි ප්‍රථමාන්ත නොවන්නාවූ අන්‍යපදයන්ගේ අර්ථයෙහි නාමයෝ දෙදෙනෙක් හෝ බොහෝ දෙනෙක් හෝ යම් කලෙක්හි සමාස කරණු ලැබෙත්ද එකල්හි ඒසමාසය "නාමානං සමාසො යුත්තත්ථො" යනු වැටෙන්නෙහි "අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි" යන සූත්‍රයෙන් සමාසකරණු ලැබේනුයි ඕහට එම සූත්‍රයෙන් බහුව්‍රීහි සංඥව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "ආගත සමණො" යනුවේ.

**ජිතින්ද්‍රියො**-යනතන්හි "ජිතානි ඉන්ද්‍රියානි යෙන සො" යන වාක්‍යයෙහි "යෙනසො" යනදෙකට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව ඔව "ජිතින්ද්‍රියො" යනුවේ.

**ආහිතග්ගි**-යනතන්හි "ආහිතො අග්ගි යෙන සො" යන වාක්‍යයෙහි "යෙනසො" යන මොවුන්ට අප්‍රයොගව විභක්තිලොප්ව ප්‍රකෘතිව නම්වූත්ව සිහට ලොප්ව "ආහිතග්ගි" යනුවේ,

"ජින්නා රුක්ඛා යෙන සො" යන වාක්‍යයෙහි **"ජින්නරුක්ඛො"** යනුද, "දින්නො සුංකො යස්ස සො" යන වාක්‍යයෙහි **"දින්නසුංකො"** යනුද "නිග්ගතා ජනා යස්මා සො" යන වාක්‍යයෙහි **"නිග්ගතජනො"** යනුද "දස බලානි යස්ස සො" යන වාක්‍යයෙහි **"දසබලො"** යනුදවේ.

**අසමො**-යනතන්හි **න** නිපාතයාකෙරෙන් සිහට ලොප්ව "අත්ථි" යන වාක්‍යව "සම" ශබ්දයාකෙරෙන් පර සිහට බව "යස්ස සො" යනුද වාක්‍යව. "නත්ථි සමො යස්ස සො" යනමෙහි "අත්ථියස්සසො" යන මොවුන්ට අප්‍රයොගව "න" හට "අත්ත නනස්ස"යි යොගවිභාග බලයෙන් අකාරව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වූත්ව සිව බව "අස මො" යනුවේ.

**පහූතජිව්හො**-යනතන්හි "පහූත" ශබ්දයාකෙරෙන්ද "ජිව්හා" ශබ්දයාකෙරෙන්ද "ඉත්ථියමතො ආපප්පච්චයො"යි ආප්‍රත්‍යයව නම්වත් ව සිහට ලොප්වේ. "පහූතාජිව්හා යස්ස සො" යන වාක්‍යයෙහි "යස්ස සො" යන මොවුන්ට අප්‍රයොගව පූර්වපදයෙහි "ඉත්ථියං භාසිතපුම්ත්ථි පුම්වාචෙ"යි පුංවත්කිරීමෙන් හා උතුරුපෙදෙහි අන්‍යපදයෙහි ලිඟු ලැබීමෙන් ආප්‍රත්‍යය වැලක "පහූතජිව්හ"යි ව නම්වත්ව ඔහුකෙරෙන් සිව බව "පහූතජිව්හො" යනුවේ.

**මහාපඤ්ඤො**-යනතන්හි "ණවණිකණෙය්‍යණන්තුහි"යි "මහන්ත" ශබ්දයාකෙරෙන් ඊප්‍රත්‍යය හා "පඤ්ඤා" ශබ්දයාකෙරෙන් "ඉත්ථියමතො ආපප්පච්චයො"යි ආප්‍රත්‍යයව ඔවුන්කෙරෙන් සිව ලොප්ව "මහන්තී පඤ්ඤා යස්ස සො" යන වාක්‍යයෙහි "යස්සසො" යන මොවුන්ට අප්‍රයොගව පෙරමෙන් පුංවත්වූ මහන්ත ශබ්දයට "මහා"යනාදෙශව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව සිව බව "මහාපඤ්ඤො" යනුවේ.

**විසාලක්ඛො**-යනතන්හි "විසාලං අක්ඛි යස්ස සො" යන වාක්‍යයෙහි "යස්සසො"යන දෙකට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව අන්තයට "ක්වචිසමාසන්තගතානමකාරන්තො"යි අකාරව නම්වත්ව සිව බව "විසාලක්ඛො" යනුවේ.

**සුගන්ධි**-යනතන්හි **සු** යන උපසර්ගයකෙරෙන් සිව ලොප්ව "ගන්ධ" ශබ්දයාකෙරෙන් සිව බව "සොභනො"යි අන්‍යපදයක් සමග "සොභනො ගන්ධො යස්ස සො"යි වාක්‍යයව "සොභනො යස්සසො" යන මොවුන්ට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව "ක්වචිසමාසන්තගතානමකාරන්තො"යි කාරග්‍රහණයෙන් අන්තයට ඉකාරව නම්වත්ව සිවූ ලොප්ව "සුගන්ධි"යනුවේ.

"බහූ කන්තියො යස්සසො" යන වාක්‍යයෙහි "යස්සසො" යන මොවුන්ට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව ස්ත්‍රීලිඟුයෙහි ඉවණ්ණන්තනාමයං කෙරෙන් "ක්වචා"දියෙහි කාරග්‍රහණයෙන් කප්‍රත්‍යයව නම්වත්ව සිව බව **"බහුකන්තිකො"**යනුද- "බහූ නදියො යස්සසො යන වාක්‍යයෙහි" **"බහුනදිකො"** යනුදවේ-"බහවො කත්තාරො යස්ස සො" යනවාක්‍යයෙහි **"බහුකත්තුකො"** යනුවේ- මෙහි තුප්‍රත්‍යයාන්තබැවින් ක ප්‍රත්‍යයයි.

**මත්තබහුමාතඞ්ගං**-යනතන්හි "මත්තා බහවො මාතඞ්ගා යස්මිං තං" යන වාක්‍යයෙහි "යස්මිං තං" යන මොවුන්ට අප්‍රයොගව තුන් තන්හිම විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව ඕව අංව පැමිණ "මත්තබහුමාතඞ්ගං" යනුවේ. **පදතුණෙන්වූ සමාසයයි.**

"සුවණ්ණස්ස විය වණ්ණො යස්ස සො" යන වාක්‍යයෙහි "විය යස්සසො" යන මොවුන්ට අප්‍රයොගව විභක්ති ලොපාදියව **"සුවණ්ණවණ්ණො"** යනුද, "වජිරං පාණිම්හි යස්සසො" යන වාක්‍යයෙහි **"වජිරපාණි"** යනුද, "උරසි ලොමානි යස්ස සො" යන වාක්‍යයෙහි මූල පෙදෙහි විභක්ති ලොප් නොව **"උරසිලොමො"** යනුද-"සහ හෙතුනා යො වත්තතෙ" යන වාක්‍යයෙහි **සහ** ශබ්දයට "සද"දීන් සකාරව අන්තයෙහි කප්‍රත්‍යයව **"සහෙතුකො"** යනුද වේ.

**සත්තඨ**-යනතන්හි "සත්ත වා අඨ වා යෙ තෙ" යන වාක්‍යයෙහි "වා යෙ තෙ" යන මොවුන්ට අප්‍රයොගව විභක්ති ලොප්ව නම්වත්ව **යො**ව **යො**හට ලොප්ව "සත්තඨ" යනුවේ.

**දක්ඛිණපුබ්බා**-යනතන්හි "දක්ඛිණස්සා ච පුබ්බස්සා ච දිසාය යං අන්තරාලං" යන වාක්‍යයෙහි "ච දිසාය යං අන්තරාලං" යන වාක්‍යයට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව පූර්වපදයට හ්‍රස්වව නම්වත්ව ඕව ලොප්ව "දක්ඛිණපුබ්බා" යනුවේ-**බහුව්‍රීහිසමාසයි.**

---

**චන්දසූරියා**-යනතන්හි "චන්ද" ශබ්දයාකෙරෙන් හා "සූරිය" ශබ්දයාකෙරෙන් **ඕ**ව ඔව "ච" යන්නගු කෙරෙන් **ඕ**හට ලොප්ව "චන්දො ච සූරියො ච" යන වාක්‍යයෙහි සමාන විභක්තික නාමයන්ගේ යම් පිඬුකිරීමෙක් ඇද්ද එකල්හි ඒ සමාසය "නාමානං සමුච්චයො ද්වන්දො" යන සූත්‍රයෙන් සමාසව "ද්වන්ද" සංඥාවේ, වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව **යො** විභක්තිව **යො**හට ආකාරව "චන්දසූරියා" යනුවේ.

"නරො ච නාරී ච" යන වාක්‍යයෙහි **"නරනාරියො"** යනුද-"අක්ඛරානි ච පදානි ච" යන වාක්‍යයෙහි **"අක්ඛරපදානි"** යනුදවේ.

**චක්ඛුසොතං**-යන තන්හි "චක්ඛු ච සොතං ච" යන වාක්‍යයෙහි "ච" යන්නට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව නම්වත්ව දිගු සමාසයෙහි මෙන් ද්වන්ද සමාසයෙහිත් "තථා ද්වන්දෙ" යනාදිසූත්‍රයෙන් ප්‍රාණ්‍යඞ්ගාදීන්ගේ එකත්වය හා නපුංසකත්වයව ඕව අංව "චක්ඛුසොතං" යනුවේ. **"ජිනවාදිතං"** යනාදියද මෙසේමැයි-රුක්ඛාදීන්ට "විභාසා" යනාදීන් විකල්පයෙන් එකත්ව නපුංසකත්වව **"ධවඛදිරං ධවඛදිරා"** යනාදියවේ-**ද්වන්දසමාසයි.**

අධිඉත්ථි-යනතන්හි "අධි" ශබ්දයාකෙරෙන් සිං ව ඕහට "සබ්බා සමාවුසො"යනාදීන් ලොප්ව "ඉත්ථි" ශබ්දයා තමා "අධි" ශබ්දයා හා සමානාධිකරණ හෙයින් ඔහුකෙරෙන්ද සිං ව ඕහට සං යනාදෙශව "ආධාරභූතායමිත්ථියං"යි අන්‍යපදයකින් වාක්‍යයවේ, "අධිඉත්ථියං" යනතන්හි උපසර්ගනිපාතයන් පූර්වකොට ඇති ශබ්දයනෙව ගර්භ ලෙක්හි විභක්ත්‍යර්ථාදියෙහි සමාසකරණු ලැබේද එකල්හි එය "උප සග්ගනිපාතපුබ්බකො අබ්‍යයීභාවො"යන සූත්‍රයෙන් ස්මාස"අබ්‍යයී භාවසමාස" සංඥවේ, නැවත විභක්ති ලොප්ව ප්‍රකෘතිව "සො නපුං සකලිඞ්ගො"යි අව්‍යයීභාවය නපුංසක ලිඟුව යදදින් එකවචනව "සරෝ රස්සො නපුංසකෙ" යන සූත්‍රයෙන් ස්වරයට හ්‍රස්වව නාම් වත්ව අකාරාන්තනොවන්නාවූ අව්‍යයීභාවයාකෙරෙන් පර විභ ක්තීන්ට "අඤ්ඤසමා ලොපො ච"යි ලොප්ව සඬ්ව "අධි ඉත්ථියං"යන වාක්‍යයෙහි "අධිත්ථි" යනුවේ.

උපනගරං-යන තන්හි "උප" යන්නහුකෙරෙන් සිහට ලොප්ව "නගර" ශබ්දයාකෙරෙන් ස විභක්තිහට විඞ්ව "නගරස්ස සමීපං"යි අන්‍යපදයකින් වාක්‍යව අප්‍රයොගාදියව අකාරාන්ත අව්‍යයීභාව සමා සයාකෙරෙන් පර විභක්තිහට "අංවිභත්තීනමකාරන්තබ්‍යයීභාවා"යි අංව "උපනගරං" යනුවේ.

නිම්මක්ඛිකං-යන තන්හි නි පූර්ව මක්ඛිකා ශබ්දයාකෙරෙන් නං ව "අභාවො මක්ඛිකානං"යි අන්‍යපදවාක්‍යයෙහි අප්‍රයොගව විභ ක්ති ලොප්ව නපුංසක ලිඟුව ස්වරයට හ්‍රස්වව නාම්වත්ව විබ්තට අංව * "අනුපදිඪානං වුත්තයොගතො"යි මකාරවිඝවට "නිම්මක්ඛිකං" යනුවේ.

අනුථෙරං-යනතන්හි අනු පූර්ව ථෙර ශබ්දයාකෙරෙන් නං ව දීඝිව"අනුපුබ්බා ථෙරානං"යි අන්‍යපදවාක්‍යයෙහි අප්‍රයොග විභක්ති ලොපාදියව විබ්තට අංව "අනුථෙරං" යනුවේ.

යථාසත්ති-යනතන්හි යථා යනු පූර්වකොට ඇති සත්ති ශබ්ද යාකෙරෙන් අං ව අං හට නිග්ගහිතව "අනතික්කම්ම සත්තිං" යන අන්‍යපදවාක්‍යයෙහි අප්‍රයොගාදියව නාම්වත්ව විබ්තට ලොප්ව "යථා සත්ති" යනුවේ.

යථා යනු පූර්වකොට ඇති බුඩ්ඪ ශබ්දයාගේ සමාසයෙහි "යෙ යෙ බුඩ්ඪා" යන වාක්‍යයෙහි "යථාබුඩ්ඪං" යනුද-යාව යනු පූර්ව කොට ඇති ජීව ශබ්දසමාසයෙහි "යත්තකො පරිච්ඡෙදො ජීවස්ස"

*"පරවෙභාෂවා ඨානෙ"යන සූත්‍රයෙන්ද මෙහි සිද්ධිය යොග්‍යවේ.

යන වාක්‍යයෙහි "**යාවජ්ජීවං**" යනුද–**ආ** යනු පූර්වකොට ඇති **පබ්බත** ශබ්දසමාසයෙහි "ආපබ්බතා" යන වාක්‍යයෙහි "**ආපබ්බතං**"යනුද–**ආ** පූර්ව **ජලගහණ**ශබ්ද සමාසයෙහි "ආජලගහණා" යන වාක්‍යයෙහි **ආජලගහණං**" යනුද වේ.

**පචිරං**–යන තන්හි **ප** පූර්ව **චිර** ශබ්දයාකෙරෙන් ඕව බව "උත්තමො" යන වාක්‍යයවේ. මෙහි **ප** යන පූර්වපදයාගේ ප්‍රධානතාව යක් නැතිබැවින් අව්‍යයීභාව සමාසනෝව "නිපදෙ" යනාදීන් කර්ම ධාරයව "පචිරෙ" යනුවේ.

"විසිඪො ධම්මො" යන වාක්‍යයෙහි "**අභිධම්මො**"යනුද–"කුච්ඡි තං අන්නං" යන වාක්‍යයෙහි **කු** යන්නට "කදං කුස්ස"යි **කද** යනා දෙශව "**කදන්නං**" යනුද–"අප්පකං ලවණං" යන වාක්‍යයෙහි **කු** යන්නට "කාප්පත්ථෙසුච" යි **කා** යනාදෙශව "**කාලවණං**" යනුද–"කුච්ඡිතො පුරිසො" යන වාක්‍යයෙහි **කු** යන්නට "කාප්පත්ථෙසුච"යි බහුවචන ග්‍රහණයෙන් විකල්පයෙන් **කා** යනාදෙශව "**කාපුරිසො කුපුරිසො**" යනුද මෙසේයි. මේ හැම අන්‍යපදවාක්‍යයෝයි.

**සමාස පදසිද්ධි නිමි.**

---

ණන්තා සද්දා, ෂෂ්ඨ්‍යන්ත ශබ්දයාකෙරෙන් පරව; තස්ස අපච්චං ඉති, ඔහුගේ පුත්‍රය යන; අස්මිං අත්ථෙ, මේ අර්ථයෙහි; වා, විකල්පයෙන්; ණො හොති, ණ ප්‍රත්‍යය වේ–තස්ස අපි, ඒ වෘඩිහුගේද; අනිය මෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි–චසද්දෙන, **ච** ශබ්දග්‍රහණයෙන්; කච්චි, කිසිතැනෙක්හි; න, වෘඩි නොවේ.

තද්ධිතා, තද්ධිතප්‍රත්‍යයෝ; අභිධෙය්‍ය, අර්ථයටබඳුවූ; ලිඞ්ගවිභත්ති වචනා, ලිඞ්ග විභක්තිවචන ඇත්තාහු; සියුං, **වන්නාහ**; සමූහ භාවජා, සමූහාර්ථ භාවාර්ථ දෙක්හිවූ තද්ධිත ප්‍රත්‍යයෝද; සකත්ථෙ, ස්වාර්ථ යෙහි; ණෙය්‍යා, ණෙය්‍ය ප්‍රත්‍යයද (යනමොවුහු); භීයො, බොහෝසෙයින්; නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි වන්නාහ; තාතු, **තා** ප්‍රත්‍යයවනාහි; ඉත්ථියං, ස්ත්‍රීලිඞ්ගයෙහි වන්නේය; ධාදි, **ධා** ප්‍රත්‍යය ආදිකොටඇති; එංපච්චයන්තකා, එං ප්‍රත්‍යය කෙළවරකොට ඇති; තෙ, ඒ ප්‍රත්‍යයෝ; නිපාතා, නිපාතයෝයි.

විකප්පවිධානතො, තද්ධිත ප්‍රත්‍යයා විකල්පයෙන් කළහෙයින්; තද්ධිතෙන, තද්ධිතයෙන්; සමාසස්ස, සමාසයට; අවචනත්තං, අකීශයින්; බාධාභාවා, බාධාවක් නැතිබැවින්; වසිඨාපච්චං ඉච්චපි, "වසිඨාපච්චං" කියාද; හොති, වේ.

සාමඤ්ඤං, සමානභාවක්, හෙවත් සාමාන්‍යභූතධර්මයක්; අභිමතෙ, කැමතිවන ලදකල්හි; සද්දෙ, ශබ්දයෙහිම; පුමෙව වා, පුල්ලිඞ්ගයෙන් හෝ; අපි, නැවත; නපුංසකෙනවා, නපුංසකලිඞ්ගයෙන් හෝ; නිද්දිස්සන්ති, දක්වනුලැබෙයයි; සද්දසත්ථවිදූ, ශබ්දශාස්ත්‍රඥයෝ; විදූං, දනිත්.

අපච්චං, අපත්‍යනම්; පපුත්තපපනාති, මුනුබුරු ආදිකොටඇති; ගොත්තං, ගොත්‍රයයි–මගධෙසු වසති, "මගධෙසු වසති" යන වාක්‍යයෙහි හෝ; තෙසංඉස්සරොවා, "මගධානං ඉස්සරො"යන වාක්‍යයෙහි හෝ; මාගධො, "මාගධො" යනුවේ–තජ්ජාතියා, ඒ ජාතියෙන්; විසේසතො, වෙසෙසනලද අර්ථයෙහි–අනුවත්තනීත, අනුවර්තී නයකරණලද්දූ වූ; ආදි සද්දෙන, ආදිශබ්දයෙන්–අත්‍ර, මෙහි, වීණාඉති, "වීණා" නම්; වීණාවාදනං, වෙණවැයීම්යයි–මගධෙහි ආගතො, "මගධෙහි ආගතො" යන වාක්‍යයෙහිද; තත්‍රජාතො, "මගධෙසු ජාතො" යන වාක්‍යයෙහිද; තෙසං ඉස්සරො, "මගධානං ඉස්සරො" යන වාක්‍යයෙහිද; තෙ අස්ස නිවාසො තිවා "මගධා අස්ස නිවාසො" යන වාක්‍යයෙහිද; මාගධො, මාගධො යනුවේ–සඞ්ඛ්‍යාර්න, සඞ්ඛ්‍යාවාචී ශබ්දයා; උත්තර පදෙ, පරපදකල්හි.

අසමා, මොහුකෙරෙන්; සද්දඤ්ඤාණාති, ශබ්ද බුද්ධි දෙදෙන; හොන්ති, වෙද්ද; සො, හෙතෙම; භාවො, භාවනම්වේ; (හේ කවරේද?) සද්දවුත්තියා, ශබ්දප්‍රවෘත්තියට; නිමිත්තභූතං, කාරණවූ; නාමඤ්ච, නාමයද; ජාතිච, ජාතියද; දබ්බංච, ද්‍රව්‍යයද; ක්‍රියාච, ක්‍රියාවද; ගුණොච, ගුණයද යනමේයි. ("භාවො" යිතැන "තං කථ්ත්ති"යි අධ්‍යාහාර කටයුතුයි) "නාමංච" යන තන්හි චකාරය "ජාතිච දබ්බංච ක්‍රියාච ගුණොච"යි යොදනු.

නිමිත්තාසරූපානුගතං, නිමිත්තස්වරූපය අනුවයයාවූ; ලක්ඛණංච, ලක්ෂණයද; (එනම් ද්‍රව්‍යයෙහි වැටේ)–අභූතතබ්භාවෙ ඉති, අභූතතද්භාව යෙහි යනු; කිං, කිම?; ඝටං කරොති ඝටො භවති, "ඝටං=පෙ=භවති" යන තන්හි (ථිප්‍රත්‍යය නොවන පිණිසයි.) කරභූයොගෙ ඉති, කරභූ යොගයෙහි යනු; කිං, කිම?; අමලිනො මලිනො ජායතෙ, "අමලි නො=පෙ=ජායතෙ" යනතන්හි (ථිප්‍රත්‍යය නොවන පිණිසයි.)

අවත්ථාවතො, අවස්ථාවත්වූ; අඤ්ඤාය අවත්ථාය, අන්‍යාවස්ථාවකින්; අභූතස්ස වත්ථුනො, පෙර නුවූ වස්තුහුගේ; තාය අවත්ථාය, ඒ නුවූ අවස්ථාවෙන් යුක්තව; භවනං, වීම; අභූතතබ්භාවං, අභූතතද් භාව නමැයි; විදූං, (වෙය්‍යාකරණයෝ) දනිත්.

තද්ධිත ගණ්ඨිපදවිකාශ නිමවනලදී.

**වාසෙට්ඨො**–යන තන්හි "වසිට්ඨ" ශබ්දයාකෙරෙන් ස විභක්ති පරකල්හි "සාගමො සෙ" යි සකාරාගමවූ "අපච්චං" යී වාක්‍යව "වසිට්ඨස්ස අපච්චං" යන වාක්‍යයෙහි ෂෂ්ඨ්‍යන්ත නාමයා කෙරෙන් පරව ඔහුගේ පුත්‍රය යන අර්ථයෙහි "වාණපච්චෙ" යන සූත්‍රයෙන් විකල්පයෙන් ණ ප්‍රත්‍යය වේ. ණප්‍රත්‍යයා විසින්ම අපත්‍යාර්ථයා තමා කියනලද හෙයින් "අපච්ච" ශබ්දයහට "වුත්තත්ථානමප්පයොගො" යනු න්‍යාය හෙයින් අප්‍රයොග වෙයි, විභක්තිහට "තෙසං විභත්තියො ලොපාච" යන සූත්‍රයෙහි "තෙසං" ශබ්දග්‍රහණයෙන් ලොප්වේ. විභක්තිහට ලොප්කරණලද කල්හි ස්වරාන්ත ප්‍රකෘතිහට "පකතිචස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘති වේ, ප්‍රත්‍යය සම්බන්ධිවූ ණ හට "තෙසං ණො ලොපං" යන සූත්‍රයෙන් ලොප්වේ, අකාර ශෙෂවේ, සණකාර ප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ ආදිස්වරයහට "වුඩ්ඪාදිසරස්ස වාසංයොගන්තස්ස සණෙච" යන සූත්‍රයෙන් වෘද්ධිවේ, එත්තෙහිදු "අයුවණ්ණානං චායො වුඩ්ඪි" යි නියම්කළහෙයින් අකාරයහට ආකාරයෙක්වේ, යට සිටි ස්වර රහිත ව්‍යඤ්ජනතෙම "නයෙ පරං යුත්තෙ" යන පිරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයාකරා පැමිණ තද්ධිතයා තමා අලිඟු හෙයින් "තද්ධිතාදි" සූත්‍රයෙන් නම්වත්ව ඔහුකෙරෙන් පරව සිව ඛව "වාසෙට්ඨො" යනුවේ.

**කච්චායනො, කච්චානො**–යන තන්හි "කච්චස්ස අපච්චං" යන වාක්‍යයෙහි "ණායන ණාන වච්ඡාදිතො" යි **ණායන ණාන** ප්‍රත්‍යයෝව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණහට ලොප්ව "ආයන ආන" යි ශෙෂව පැමිණ සිව ඛව "කච්චායනො කච්චානො" යනුවේ. මෙතන්හි සංයොගාන්ත බැවින් වෘද්ධි නොවේ.

**වෙනතෙය්‍යො, විනතෙය්‍යො**–යන තන්හි "විනතා" ශබ්දයා කෙරෙන් පර ස විභක්තිහට **ආය** ආදෙශව පැමිණ "විනතාය අපච්චං" යන වාක්‍යයෙහි "ණෙය්‍යො කත්තිකාදීහි" යන සූත්‍රයෙන් ණෙය්‍ය ප්‍රත්‍යයව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව ප්‍රත්‍යයා සම්බන්ධිවූ ණහට ලොප්ව "එය්‍ය" යි ශෙෂව සණකාර ප්‍රත්‍යයා පරකල්හි අසංයොගාන්තවූ ආදිස්වරයට "වුඩ්ඪාදි" සූත්‍රයෙන් විකල්පයෙන් වෘද්ධිව පැමිණ "වෙනතෙය්‍යො විනතෙය්‍යො" යනුවේ.

**දක්ඛිණෙය්‍යො**–යන තන්හි "දක්ඛිණා දීයතෙ යස්ස සො" යන වාක්‍යයෙහි "ණෙය්‍යො" යි යොගවිභාගයෙන් ඕහට දෙනුලැබෙයි යන අර්ථයෙහිද ණෙය්‍ය ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව "දක්ඛිණෙය්‍යො" යනුවේ.

**දක්ඛි**-යන තන්හි "දක්ඛස්ස අපච්චං" යන වාක්‍යයෙහි "අතො ණි වා"යි ණි ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව "දක්ඛි" යනුවේ.

**සක්‍යපුත්තිකො**-යන තන්හි "සක්‍යපුත්තස්ස අපච්චං" යන වාක්‍යයෙහි "අතොණි වා" යන සූත්‍රයෙහි **පුන** වාග්‍රහණයෙන් **ණික** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "සක්‍යපුත්තිකො" යනුවේ, මෙම වාග්‍රහණයෙන් බ ප්‍රත්‍යයව බකාරද්විත්වව "මණ්ඩස්ස අපච්චං" යන වාක්‍යයෙහි "**මණ්ඩබ්බො**"යනුද, "භාතුනො අපච්චං" යන වාක්‍යයෙහි "**භාතුබ්බො**" යනුදවේ.

**මානවො**-යන තන්හි "මනුනො අපච්චං" යන වාක්‍යයෙහි "**ණ**වොපගවාදීහි" යන සූත්‍රයෙන් **ණව** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "මානවො" යනුවේ.

**සාමණෙරො**-යන තන්හි "සමණස්ස අපච්චං" යන වාක්‍යයෙහි "ණෙර විධවාදිතො"පි **ණෙර** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "සාමණෙරො" යනුවේ.

---

**සාතිකො**-යන තන්හි "සත" ශබ්දයාකෙරෙන් **තා** හට **එක**ව "සතෙන සංසඨො" යන වාක්‍යයෙහි "යෙන වා සංසඨං තරති චරති වහති ණිකො"යි **ණික** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "සාතිකො" යනුවේ-"උළුම්පෙන තරති" යන වාක්‍යයෙහි "**ඔළුම්පිකො**"යනුද වෘද්ධි නොව "**උළුම්පිකො**" යනුද—"සකටෙන චරති" යන වාක්‍යයෙහි "**සාකටිකො**" යනුද-"සීසෙන වහති" යන වාක්‍යයෙහි වෘද්ධි නොව "**සීසිකො**" යනුදවේ.

**චම්පෙය්‍යකො**-යන තන්හි "චම්පා" ශබ්දයාකෙරෙන් **සි**ංහට **යං** ආදෙශව "චම්පායං ජාතො" යන වාක්‍යයෙහි "යෙනවා=පෙ=ණිකො" යන සූත්‍රයෙහි වාග්‍රහණයෙන් ස්ත්‍රීලිඞ්ග ශබ්දයාකෙරෙන් පර්ව **එය්‍යක** ප්‍රත්‍යයව "චම්පෙය්‍යකො" යනුවේ- "බාරාණසියං ජාතො" යන වාක්‍යයෙහි **එය්‍යක**ව "**බාරාණසෙය්‍යකො**" යනුද-"කුසිනාරායං වසති"යන වාක්‍යයෙහි මෙම වාග්‍රහණයෙන් **ණික** ප්‍රත්‍යයව "**කොසිනාරකො**" යනුද-"මගධෙසු වසති තෙසං ඉස්සරොවා" යන වාක්‍යයන්හි **ණික** ප්‍රත්‍යයව "**මාගධකො**" යනුදවේ.

**අස්සාජානීයො**-යන තන්හි "අස්සජානීයා විසිට්ඨා"යන වාක්‍යයෙහි එම ජාතියෙන් වෙසෙසතලද යන අර්ථයෙහි වාග්‍රහණයෙන් **ආජානීය** ප්‍රත්‍යයව "අස්සාජානීයො" යනුවේ.

**අග්ගඤ්ඤං**-යන තන්හි "අග්ග" ශබ්දයාකෙරෙන් සිට අංව පැමිණ "අග්ගං" යනුවේ, "ඉති ජානිතබ්බං" යන වාක්‍යයවේ "අග්ගං ඉති ජානිතබ්බං" යන වාක්‍යයෙහි "යෙන"යනාදි සූත්‍රයෙහි වාග්‍රහණ

යෙන් ණ ප්‍රත්‍යයව වාක්‍යයට අප්‍රයොගව "පරවෙභාවො ඨානෙ" යන සූත්‍රයෙන් විභවව නම්වත්ව සිව අංව පැමිණ "අඞ්ගාඩ්ඩං" යනුවේ.

**ආභිධම්මිකො, අභිධම්මිකො**–යන තන්හි "අභිධම්මමධීතෙ" යන වාක්‍යයෙහි "තමධීතෙ" යනාදි සූත්‍රයෙන් **ණික** ප්‍රත්‍යයව උසෙස්හි වෘද්ධිව "ආභිධම්මිකො අභිධම්මිකො" යනුවේ.

**වාචසිකං**–යන තන්හි "වච" ශබ්දයාගේ අකාරෙන් **නා**හට "මනොගණාදී"න් ආකාරව සවරයා පරකල්හි "වච" ශබ්දයාගේ අගෙරෙන් "සස්සරෙ වාගමො"යි සකාරාගමව "වචසා කතං කම්මං" යන වාක්‍යයෙහි "තමධීතෙ" යනාදීන් **ණික** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "වාචසිකං" යනුවේ.

**සාරීරිකා**–යන තන්හි "සරීරෙ සන්නිධානා වෙදනා" යන වාක්‍යයෙහි "තමධීතෙ" යනාදීන් **ණික** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව, "ඉත්ථියමතො" යනාදීන් ආප්‍රත්‍යයව සිව ලොප්ව "සාරීරිකා" යනුවේ.

**දෙවාරිකො**–යන තන්හි "ද්වාරෙ නියුත්තො" යන වාක්‍යයෙහි "තමධීතෙ" යනාදීන් **ණික**ව වාක්‍යයහට අප්‍රයොගව "දුආර" යනතන්හි දකාරයේ උකාරයට "වමොදුදන්තානං"යි වකාරව වකාරයෙහි පෙර "මායූනමාගමො ඨානෙ" යි එකාරාගමව පැමිණ නම්වත්ව සිව ඔව "දෙවාරිකො" යනුවේ.

**වෙණිකො**–යන තන්හි "වීණා අස්ස සිප්පං" යන වාක්‍යයෙහි "තමධීතෙ" යනාදීන් **ණික**ව අප්‍රයොගාදියව සිව ඔව "වෙණිකො" යනුවේ.

**ගන්ධිකො**–යන තන්හි "ගන්ධො අස්ස භණ්ඩං" යන වාක්‍යයෙහි **ණික**ව "ගන්ධිකො" යනුවේ.

**මාගවිකො**–යන තන්හි "මගෙ හන්ත්වා ජීවති" යන වාක්‍යයෙහි **ණික**ව "උවමදනා" දීන් වකාරාගමව වෘද්ධි ආදියව සිව ඔව "මාගවිකො" යනුවේ.

"ජාලෙන හනති" යන වාක්‍යයෙහි **"ජාලිකො"** යනුද–"සුත්තෙන බද්ධො" යන වාක්‍යයෙහි **"සුත්තිකො"** යනුද–"චාපො අස්ස ආයුධො" යන වාක්‍යයෙහි **"චාපිකො"** යනුද–"වාතො අස්ස ආබාධො" යන වාක්‍යයෙහි **"වාතිකො"** යනුද–"බුද්ධෙ පසන්නො" යන වාක්‍යයෙහි **"බුද්ධිකො"** යනුද–"වත්ථෙන කීතං භණ්ඩං" යන වාක්‍යයෙහි **"වත්ථිකං"** යනුද–"කුම්භො අස්ස පරිමාණං තාමරහති තෙසං රාසිවා" යන වාක්‍යයන්හි **"කුම්භිකො"** යනුද–"අක්ඛෙහි දිබ්බති" යන වාක්‍යයෙහි **"අක්ඛිකො"** යනුද–"මගධෙසු වසති ජාතො තිවා" යන වාක්‍යයන්හි **"මාගධිකො"** යනුද මෙසේයි.

**කාෂාවං**-යන තන්හි "කසාව" ශබ්දයාකෙරෙන් පර නාහම එනව "කසාවෙන රත්තං" යන වාක්‍යයෙහි "ණරාගා" යනාදීන් ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව අංව "කාසාවං" යනුවේ.

"නීලෙන රත්තං" යන වාක්‍යයෙහි **"නීලං"** යනුද-පීතෙන රත්තං" යන වාක්‍යයෙහි **"පීතං"** යනුදවේ. මෙහි "වුඩ්ඩාදි" සූත්‍රයෙහි වාග්‍රහණයෙන් වෘද්ධි ප්‍රතිෂෙධයි.

**මාහිසං**-යන තන්හි "මහිස" ශබ්දයාකෙරෙන් සව සකාරාගමව "මහිසස්ස ඉදං" යන වාක්‍යයෙහි "ණරාගා" යනාදීන් ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "මාහිසං" යනුවේ.

**රාජපොරිසං**-යන තන්හි "රාජපුරිසස්ස ඉදං" යන වාක්‍යයෙහි ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "අයුවණ්ණානඤ්චායො වුද්ධි" යන සූත්‍රයෙහි පුනවෘද්ධිග්‍රහණයෙන් උත්තරපදයෙහිවූ පකාරයාඵ උකාරයට ඔකාරයෙක් වෘද්ධිව සිව අංව "රාජපොරිසං" යනුවේ.

"මගධෙහි ආගතො" යන වාක්‍යයෙහිද, "මගධෙසු ජාතො" යන වාක්‍යයෙහිද, "මගධානං ඉස්සරො", යන වාක්‍යයෙහිද, "මගධා අස්ස නිවාසො"යන වාක්‍යයෙහිද ණ ප්‍රත්‍යව අප්‍රයොගාදියව **"මාගධො"** යනුවේ.

"කත්තිකාදීහි යුත්තො" යන වාක්‍යයෙහි **"කත්තිකො"** යනුද-"බුද්ධො අස්ස දෙවතා" යන වාක්‍යයෙහි **"බුද්ධො"** යනුදවේ.

**වෙය්‍යාකරණො**-යන තන්හි "ව්‍යාකරණං අවෙච්ච අධීතෙ" යන වාක්‍යයෙහි ණ ප්‍රත්‍යයව "වි ආකරණ" යි සිටිතන්හි වකාරයාඵ ඉකාරයට "ඉවණ්ණො යං නවා"යි යකාරව "මාදූත" යනාදි සූත්‍රයෙන් යකාරයෙන් පෙර එකාරයෙක් වෘද්ධ්‍යාගමව "පරවෙහාච්චා ඨානෙ"යි යකාරවිත්වව පැමිණ සිව ඔව "වෙය්‍යාකරණො" යනුවේ.

**සාගරො**-යනතන්හි "සගරෙහි නිබ්බත්තො" යන වාක්‍යයෙහි ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "සාගරො" යනුවේ.

**පච්ඡිමො**-යන තන්හි "පච්ඡාජාතො"යන වාක්‍යයෙහි "ජාතාදීනම්මියාව"යි ඉම ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව සිව ඔව "පච්ඡිමො" යනුවේ.

**මනුස්සජාතියො**-යන තන්හි "මනුස්සජාතියා ජාතො" යන වාක්‍යයෙහි "ජාතාදීනම්මියාව" යි ඉය ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "මනුස්සජාතියො" යනුවේ.

**අන්තිමො අන්තියො**-යන තන්හි "අන්තොනියුත්තො" යන වාක්‍යයෙහි "ජාතාදී" සූත්‍රයෙන් ඉම ඉය ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව "අන්තිමො අන්තියො" යනුවේ.

**අඬකියො**-යන තත්හි "අඬෙ නියුත්තො" යන වාක්‍යයෙහි "ජාතාදි" සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් **කිය** ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව "අඬකියො" යනුවේ.

**පුත්තිමො, පුත්තියො**-යන තත්හි "පුත්තො අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "ජාතාදී"න් **ඉම ඉය** ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව "පුත්තිමො පුත්තියො" යනුවේ.

**කප්පියො**-යන තත්හි "කප්පො අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "ජාතාදී"න් **ඉය** ප්‍රත්‍යයව "කප්පියො" යනුවේ.

**බන්ධනියං**-යන තත්හි "බන්ධනස්ස ඨානං" යන වාක්‍යයෙහි "තදස්සඨානමීයො ච"යි **ඊය** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සිව අං**ව "බන්ධනියං" යනුවේ.

**මදනීයං**-යන තත්හි "මදනස්ස හිතං" යන වාක්‍යයෙහි "තදස්සඨාන" යනාදී සූත්‍රයෙහි ච ග්‍රහණයෙන් **ඊය** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "මදනීයං" යනුවේ.

**අභිජ්ඣාලු**-යන තත්හි "අභිජ්ඣා බහුලො" යන වාක්‍යයෙහි "ආලුතබ්බහුලෙ"යි **ආලු** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සිව** ලොප්ව "අභිජ්ඣාලු" යනුවේ.

**පාපතරො, පාපතමො, පාපිස්සිකො, පාපියො, පාපිට්ඨො**-යන තත්හි "අයමෙතෙසං අතිසයෙන පාපො" යන වාක්‍යයෙහි "විසෙසෙ තරතමිස්සිකියිට්ඨා" යන සූත්‍රයෙන් **තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ,** යන ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව "පාපතරො, පාපතමො, පාපිස්සිකො, පාපියො, පාපිට්ඨො" යනුවේ.

**ජෙය්‍යො ජෙට්ඨො**-යන තත්හි "අයමෙතෙසං අතිසයෙන වුඩ්ඪො" යන වාක්‍යයෙහි "විසෙසෙ" යනාදීන් **ඉය ඉට්ඨ** ප්‍රත්‍යයෝ වෙත් ප්‍රත්‍යයන් පරකල්හි "වුඩ්ඪස්ස ජො ඉයිට්ඨෙසු" යන සූත්‍රයෙන් **ජකාරව** "සරලොපාදි" සූත්‍රයෙහි ප්‍රකෘති ග්‍රහණයෙන් ප්‍රකෘති ප්‍රතිෂෙධව "සරා සරෙ ලොපං"යි පූර්වස්වර ලොප්ව "ක්වචාසවණ්ණං ලුත්තෙ"යි පරස්වරයට අසවර්ණාදෙශව පැමිණ අප්‍රයොගාදියව් "ජෙය්‍යො ජෙට්ඨො" යනුවේ.

**සෙය්‍යො සෙට්ඨො**-යන තත්හි "අයමෙතෙසං අතිසයෙන පසත්ථො" යන වාක්‍යයෙහි **ඉය ඉට්ඨ** ප්‍රත්‍යයෝව "පසත්ථස්ස සො ච"යි "පසත්ථ" ශබ්දයට සකාරව අප්‍රයොගාදියව පැමිණ "සෙය්‍යො සෙට්ඨො" යනුවේ.

**මෙධාවී**-යන තන්හි "මෙධා අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "තදස්සත්ථීති වී ච" යි වී ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව ලොප්ව "මෙධාවී" යනුවේ.

**තපස්සී**-යන තන්හි "තපො අස්ස අත්ථි"යන වාක්‍යයෙහි "තපාදිතො සී"යි සී ප්‍රත්‍යයව සකාරද්විත්වව අප්‍රයොගාදියව සිව ලොප්ව "තපස්සී" යනුවේ.

**දණ්ඩිකො දණ්ඩී**-යන තන්හි "දණ්ඩො අස්ස අත්ථි"යන වාක්‍යයෙහි "දණ්ඩාද්දීතො ඉකඊ" යන සූත්‍රයෙන් ඉක ඊ ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව "දණ්ඩිකො දණ්ඩී" යනුවේ.

**ගුණවා**-යන තන්හි "ගුණො අස්ස අත්ථි"යන වාක්‍යයෙහි "ගුණාදිතො වන්තු" යන සූත්‍රයෙන් වන්තු ප්‍රත්‍යයව අප්‍රයොගාදියව න්තු භාගය සහිත සි හට "ආ සිම්හි"යි ආව "ගුණවා"යනුද-"පඤ්ඤා අස්ස අත්ථි" යන වාක්‍යයෙහි වන්තු ප්‍රත්‍යයව "යදදී"න් ආකාරහ්‍රස්වව "පඤ්ඤවා" යනුද වේ.

**සතිමා**-යන තන්හි "සති අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "සත්‍යාදීහි මන්තු" යන සූත්‍රයෙන් මන්තු ප්‍රත්‍යයව අප්‍රයොගාදියව මන්තු සහිත සි හට ආව "සතිමා" යනුවේ. "භානු අස්ස අත්ථි" යන වාක්‍යයෙහි "භානුමා" යනුද මෙසේයි.

**ආයස්මා**-යන තන්හි "ආයු අස්ස අත්ථි" යන වාක්‍යයෙහි මන්තු ප්‍රත්‍යයවේ, මන්තු ප්‍රත්‍යය පරකල්හි "ආයුස්සුකාරස්ස මන්තුම්හි" යන සූත්‍රයෙන් ආයු ශබ්දයාගේ උකාරයට අස් යනාදෙශව මකාරයෙහි බඩව අප්‍රයොගාදියව "ආයස්මා" යනුවේ.

**සද්ධො**-යන තන්හි "සද්ධා අස්ස අත්ථි" යන, වාක්‍යයෙහි "සද්ධාදිතො ණ" යන සූත්‍රයෙන් ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව ඔව "සද්ධො" යනුවේ.

**සොවණ්ණමයං සුවණ්ණමයං**-යන තන්හි "සුවණ්ණෙන පකතං" යන වාක්‍යයෙහි "තප්පකති වචනෙ මයො"යි මය ප්‍රත්‍යයව අප්‍රයොගාදියව පූර්වපක්‍ෂයෙහි වෘද්ධිව "සොවණ්ණමයං සුවණ්ණමයං" යනුවේ.

**මනොමයං**-යන තන්හි "මනසා පකතං" යන වාක්‍යයෙහි මය ප්‍රත්‍යයව විභක්ති ලොප්වේ, විභක්ති ලොප්කළකල්හි "එතෙසමො ලොපෙ"යි මන ශබ්දයාගේ අන්ත්‍යයෙහි ඔකාරව අප්‍රයොගාදියව සිව අංව "මනොමයං" යනුවේ.

**දුතියො**-යන තන්හි "ද්විනනං පූරණො" යන වාක්‍යයෙහි "ද්විතීහි තියො"යි සඞ්ඛ්‍යාපූරණයෙහි **තිය** ප්‍රත්‍යයව ප්‍රත්‍යයා පරකල්හි වාක්‍යයහට අප්‍රයොගව **ද්වි** ශබ්දයට "තියෙ දුතාපිච"යි **දු** ආදෙශව සිව බව "දුතියො" යනුවේ.

**තතියො**-යන තන්හි "තිණ්ණං පූරණො" යන වාක්‍යයෙහි "ද්විතීහි තියො"යි **තිය** ප්‍රත්‍යයව විභක්ති ලොප්ව වාක්‍යයහට අප්‍රයොගව **තිය** ප්‍රත්‍යය පරකල්හි "තියෙ දුතාපි ච"යි **ත** යනාදෙශව නාම් වත්ව සිව බව "තතියො" යනුවේ.

**චතුත්ථො, ඡට්ඨො**-යන තන්හි "චතුන්නං පූරණො" යන වාක්‍යයෙහි හා "ඡන්නං පූරණො" යන වාක්‍යයෙහි "චතුච්ඡෙහි ථඨා" යි **චතු** ශබ්දයාකෙරෙන් **ථ** ප්‍රත්‍යය හා ඡ ශබ්දයාකෙරෙන් **ඨ** ප්‍රත්‍යයව වාක්‍යයන්ට අප්‍රයොගව විභක්තිලොප්ව ද්විත්වව නාම්වත්ව සිව බව "චතුත්ථො, ඡට්ඨො" යනුවේ.

**අඩ්ඪුඩ්ඪො**-යන තන්හි "අඩ්ඪෙන චතුත්ථො" යන වාක්‍යයෙහි **අඩ්ඪ** යන උපපදයා සමග **චතුත්ථ** ශබ්දයට "තෙසමඩ්ඪූපපදෙනඩ්ඪුඩ්ඪ දිවඩ්ඪ දියඩ්ඪාඩ්ඪතියා" යන සූත්‍රයෙන් **අඩ්ඪුඩ්ඪ** යනාදෙශව සිව බව "අඩ්ඪුඩ්ඪො" යනුවේ.

**දිවඩ්ඪො, දියඩ්ඪො**-යන තන්හි "අඩ්ඪෙන දුතියො" යන වාක්‍යයෙහි **දිවඩ්ඪ** යනාදෙශ හා **දියඩ්ඪ** යනාදෙශව සිව බව "දිවඩ්ඪො, දියඩ්ඪො" යනුවේ.

**අඩ්ඪතියො**-යන තන්හි "අඩ්ඪෙන තතියො" යන වාක්‍යයෙහි **අඩ්ඪතිය** යනාදෙශව සිව බව "අඩ්ඪතියො" යනුවේ.

**පඤ්චමො**-යන තන්හි "පඤ්චන්නං පූරණො" යන වාක්‍යයෙහි "සඞ්ඛ්‍යාපූරණෙ මො"යි ම ප්‍රත්‍යයව සිව බව "පඤ්චමො" යනුවේ.

**ඒකාදස**-යන තන්හි "එකො ච දස ච"යි ද්වන්ද්ව සමාසව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිව **එක** ශබ්දයාගේ අන්තයට "ඒකට්ඨාන මාකාරො වා"යි ආකාරව "ඒකාදස" යනුවේ.

**ද්වාදස**-යන තන්හි "ද්වෙ ච දසච"යි ද්වන්ද්වසමාසව වාක්‍යයහට අප්‍රයොගව විභක්තිලොප්ව **ද්වි** ශබ්දයාගේ අන්තයට ආකාරව "ද්වාදස" යනුවේ.

**තෙරස**-යන තන්හි "තයො ච දස ච"යි ද්වන්ද්වසමාසව වාක්‍යයහට අප්‍රයොගව විභක්තිලොප්ව **ති** ශබ්දයට "යද" දීන් **තෙ** යනාදෙශව **දස** ශබ්දයාගේ දකාරයට "එකාදිතො දසර සඞ්ඛ්‍යානෙ"යි රකාරව "තෙරස" යනුවේ.

**චුද්දස**–යන තන්හි "චතතාරො ච දස ච" යන වාක්‍යයෙහි වාක්‍ය අප්‍රයොගාදියව "චතුප්පදස්ස ලොපො තුත්තර පදාදිචස්ස චුචොපි නවා" යි **චතු** ශබ්දයාගේ තුකාරයට ලොප් හා චකාරයට චු ආදෙශව දකාර බිඳුව "චුද්දස" යනුවේ.

**සොළස**–යන තන්හි "ඡච දසච" යන වාක්‍යයෙහි අප්‍රයොගාදියව "දසෙ සො නිච්චච" යි ඡ හට **සො** යනාදෙශව **දස** ශබ්දයාගේ දකාරයට "ළදරානං" යි ළකාරව "සොළස" යනුවේ.

**අට්ඨාරස**–යන තන්හි "අට්ඨ ච දසච" යන වාක්‍යයෙහි අප්‍රයොගාදියව **දස** ශබ්දයාගේ දකාරයට රකාරව අට්ඨ ශබ්දාන්තයට ආකාරව "අට්ඨාරස" යනුවේ.

**බාවීසති**–යන තන්හි "ද්වෙ ච වීසති ච" යන වාක්‍යයෙහි අප්‍රයොගාදියව ද්වි ශබ්දයට "වීසතිදසෙසු බා ද්විස්ස තු" යි **බා** යනාදෙශව "බාවීසති" යනුවේ.

**එකාදසමො**–යන තන්හි "එකාදසන්නං පූරණො" යන වාක්‍යයෙහි "සඞ්ඛ්‍යාපූරණෙ මො" යි ම ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව බව "එකාදසමො" යනුවේ.

**එකාදසී**–යන තන්හි "එකාදසන්නං පූරණී" යන වාක්‍යයෙහි "එකාදිතො දසස්සී" යන සූත්‍රයෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි **ඊ** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව් ලොප්ව "එකාදසී" යනුවේ.

**ද්විකං, තිකං**–යන තන්හි "ද්වෙපරිමාණානි අස්ස, තීණි පරිමාණානි අස්ස" යන වාක්‍යයන්හි "ද්වාදිතො කොනෙකත්ථෙ ච" යන සූත්‍රයෙන් **ක** ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව සිව් අංව "ද්විකං, තිකං" යනුවේ.

**මානුස්සකො, මානුස්සො**–යන තන්හි "මනුස්සානං සමූහො" යන වාක්‍යයෙහි "සමූහත්ථෙ කණ්ණා ච" යන සූත්‍රයෙන් **කණ්ණ** යන ප්‍රත්‍යයෝව අප්‍රයොගාදියව වෘද්ධිව සිව බව "මානුස්සකො, මානුස්සො" යනුවේ.

**ද්වයං, තයං**–යන තන්හි "ද්වින්නං සමූහො, තිණ්ණං සමූහො" යන වාක්‍යයන්හි "සමූහත්ථෙ කණ්ණාච" යන සූත්‍රයෙන් **ණ** ප්‍රත්‍යයව **ද්වි ති** ශබ්ද දෙදෙනාගේ ඉකාරයට "ඞලානමියුවාසරෙ වා" යන සූත්‍රයෙහි වාග්‍රහණයෙන් **අය** යනාදෙශව වාක්‍ය අප්‍රයොගාදියව සිව අංව "ද්වයං, තයං" යනුවේ.

**ගාමතා, නාගරතා**–යන තන්හි "ගාමානං සමූහො, නාගරානං සමූහො" යන වාක්‍යයන්හි "ගාමජනබන්‍ධු සහායාදීහි තා" යන සූත්‍රයෙන් **තා** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සිව** ලොප්ව "ගාමතා, නාගරතා" යනුවේ.

---

**චන්‍දත්තං**–යන තන්හි "චන්‍දස්ස භාවො"යන වාක්‍යයෙහි "**ණ්‍ය** ත්තතා භාවෙ තු" යන සූත්‍රයෙන් භාවාර්‍ථයෙහි **ත්ත** ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව **සිව** අංව "චන්‍දත්තං" යනුවේ.

"මනුස්සස්ස භාවො" යන වාක්‍යයෙහි "**මනුස්සත්තං**"යනුද–"දණ්ඩිනො භාවො" යන වාක්‍යයෙහි "**දණ්ඩිත්තං**" යනුද–"පාවකස්ස භාවො" යන වාක්‍යයෙහි "**පාවකත්තං**" යනුද–"නීලස්ස භාවො" යන වාක්‍යයෙහි "**නීලත්තං**" යනුද මෙසේයි. "දණ්ඩිත්තං' යන තන්හි "යද"දීන් ඊකාරයට හ්‍රස්ව වේ.

**පණ්ඩිච්චං**–යන තන්හි "පණ්ඩිතස්ස භාවො" යන වාක්‍යයෙහි "**ණ්‍ය**ත්තතා භාවෙ තු"යන සූත්‍රයෙන් **ණ්‍ය** ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව"තෙසං ණො ලොපං ච"යි **ණ**හට ලොප්ව අකාරශේෂව "අවණ්ණා යෙ ලොපං ච"යි අකාර ලොප්ව යකාර තකාරයෙහි සංහිතව යවත්වූ තකාරයට "යවතං තලණදකාරානං බ්‍යඤ්ජනානි චලඤජකාරත්තං" යන සූත්‍රයෙන් චකාරව "පරවෙභාවො ඨානෙ"යි චකාර ද්විත්වව නම්වත්ව **සිව** අංව "පණ්ඩිච්චං" යනුවේ.

"කුසලස්ස භාවො=**කොසල්ලං**, සමණස්ස භාවො=**සාමඤ්ඤං**, සුහදස්ස භාවො=**සොහජ්ජං**" යන තන්හිද මෙසේම පිළිවෙළින් යවත්වූ **ල**කාර **ණ**කාර **ද**කාරයන්ට **ල**කාර **ඤ**කාර **ජ**කාරව ද්විත්වව සිඩවේ, "පුරිසස්ස භාවො=**පොරිස්සං**' නිපකස්ස භාවො=**නෙපක්කං**, සරූපස්ස භාවො=**සාරූප්පං**, උසභස්සභාවො=**ඔසබ්භං**, උපමාය භාවො=**ඔපම්මං**" යන තන්හි "යවතං" යනාදී සූත්‍රයෙහි කාර ග්‍රහණයෙන් යවත්වූ **ස**කාර **ක**කාර **ප**කාර **භ**කාර මකාරයන්ට ඒ **ස**කාරාදිහුම ද්විත්වීමෙන් සිඩයි.

**ආරිස්සං**–යන තන්හි "ඉසිනො භාවො" යන වාක්‍යයෙහි **ණ** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව පූර්‍වඉකාරයට "ආත්තඤ්ච" යන සූත්‍රයෙන් ආකාරව යුක්තස්ථානයෙහි රිකාරයෙක්ද ආගමව යවත්වූ සකාරයට සකාරව ද්විත්වව **සිව** අංව "ආරිස්සං" යනුවේ.

**මුදුතා**–යන තන්හි"මුදුනො භාවො"යන වාක්‍යයෙහි "**ණ්‍ය**ත්තතා භවෙ තු" යි **තා** ප්‍රත්‍යව අප්‍රයොගාදියව "මුදුතා" යනුවේ.

**අරහතා**-යන තන්හි "අරහන්තස්ස භාවො" යන වාක්‍යයෙහි **තා** ප්‍රත්‍යයව අරහන්ත ශබ්දයාගේ **න්ත්** යන්නට "යදා"දීන් ලොප්ව "අරහතා" යනුවේ.

**පුථුජ්ජනත්තනං**-යනතන්හි "පුථුජ්ජනස්ස භාවො" යන වාක්‍යයෙහි "ණ්‍යත්තතා"දියෙහි තුග්‍රහණයෙන් **ත්තන** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව "පුථුජ්ජනත්තනං" යනුවේ.

**ආකිඤ්චඤ්ඤං**-යනතන්හි "අකිඤ්චනං එව" යන වාක්‍යයෙහි "ණ්‍යත්තතා"දියෙහි තුග්‍රහණයෙන් සවාර්ථයෙහි ණ්‍යප්‍රත්‍යයව "යව, තා"දීන් **න**කාරයාට ඤකාරව විත්වව "ආකිඤ්චඤ්ඤං" යනුවේ. කිසිවක් නැත්තේනුයි "අකිඤ්චන" නම, "නසමො=අසමො" යනාතන්හි මෙනි.

**කොණ්ඩඤ්ඤ**-යන තන්හි "කුණ්ඩනියා අපච්චං" යන වාක්‍යයෙහි ණ්‍ය ප්‍රත්‍යයව "යවතං"යනාදීන් **න** හට ඤකාරව "වුඩ්ඪාදී" සූත්‍රයෙහි වාග්‍රහණයෙන් සංයොගාන්තයට වෘද්ධිව සිව බව "කොණ්ඩඤ්ඤ" යනුවේ.

**පජ්ජං**-යන තන්හි "පදය හිතං"යන වාක්‍යයෙහි ණ්‍යප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව යවත්වූ දකාරයාට "යවතං" යනාදීන් ජකාරව සිව අංව "පජ්ජං" යනුවේ.

ධඤ්ඤං-යන තන්හි "ධනාය සංවත්තනිකං" යන වාක්‍යයෙහි ණ්‍යප්‍රත්‍යයව අප්‍රයොගාදියව යවත්වූ **න** හට ඤකාරව ද්විත්වව සිව අංව "ධඤ්ඤං" යනුවේ.

**සච්චං**-යන තන්හි "සතිතො සමහුතං" යන වාක්‍යයෙහි ණ්‍ය ප්‍රත්‍යයව අප්‍රයොගාදියව යවත්වූ **ත** හට **ච**කාරව විත්වව සි ව අං ව "සච්චං" යනුවේ.

**දෙවතා**-යන තන්හි "දෙවො එව" යන වාක්‍යයෙහි "ණ්‍යත්තතා"දියෙහි තුග්‍රහණයෙන් සවාර්ථයෙහි **තා** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව ලොප්ව "දෙවතා" යනුවේ.

**වෙසමං**-යන තන්හි "විසමස්ස භාවො" යන වාක්‍යයෙහි "ණ විසමාදීහි" යන සූත්‍රයෙන් ණප්‍රත්‍යයව අප්‍රයොගාදියව සිව අංව "වෙසමං" යනුවේ.

**අජ්ජවං**-යන තන්හි "උජුනො භාවො" යන වාක්‍යයෙහි "ණ විසමාදීහි" යන සූත්‍රයෙන් ණ ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **උජු** ශබ්දයාගේ උකාරයට "ආත්තව"යි ආකාරව ආකාර හ්‍රස්වව ජකාරයාට උකාරයට "යදා"දීන් අව ආදෙශව සිව අංව "අජ්ජවං" යනුවේ.

**මානුඤ්ඤකං**-යන තන්හි "මනුඤ්ඤස්ස භාවො" යන වාක්‍යයෙහි "රමණීයාදිතො කණ්"යන සූත්‍රයෙන් **කණ්** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව වෘද්ධිව **සිව අං**ව "මානුඤ්ඤකං" යනුවේ.

**එකධා**-යන තන්හි "එකෙන විභාගෙන" යන වාක්‍යයෙහි "විභාගෙ ධා ච"යි විභාගාර්ථයෙහි **ධා** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව ධා ප්‍රත්‍යයාන්තාදීහු නිපාත බැවින් "සබ්බාසමාවුපසග්ග" යනාදීන් **සි** හට ලොප්ව "එකධා" යනුවේ.

**පදසො**-යන තන්හි "පදවිභාගෙන"යන වාක්‍යයෙහි "විභාගෙ ධා ච"යි චග්‍රහණයෙන් **සො** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සි**ව ලොප්ව "පදසො" යනුවේ.

**සබ්බථා**—යනතන්හි "සබ්බො පකාරො යන වාක්‍යයෙහි හා "සබ්බෙන පකාරෙන" යන වාක්‍යයෙහි "සබ්බනාමෙහි පකාරවචනෙ තු ථා"යන සූත්‍රයෙන් ප්‍රකාර වචනාර්ථයෙහි **ථා** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සි**ව ලොප්ව "සබ්බථා" යනුවේ.

**අඤ්ඤථතා**-යන තන්හි "අඤ්ඤො පකාරො, අඤ්ඤෙන පකාරෙන වා" යන වාක්‍යයන්හි "සබ්බනාමෙහි" යනාදියෙහි තුග්‍රහණයෙන් **ථතා** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **සි**ව ලොප්ව "අඤ්ඤථතා" යනුවේ.

**කථං**-යන තන්හි "කෙන පකාරෙන" යන වාක්‍යයෙහි "කිම්මෙහි ථං" යන සූත්‍රයෙන් ථංප්‍රත්‍යයව අප්‍රයොගාදියව "සෙසෙසුච"යි **කිං** ශබ්දයට කකාරව **සි**ව ලොප්ව "කථං" යනුවේ.

**ඉත්ථං**-යන තන්හි "ඉමිනා පකාරෙන" යන වාක්‍යයෙහි "කිම්මෙහි ථං" යන සූත්‍රයෙන් **ථං** ප්‍රත්‍යයව **ථං** පරකල්හි **ඉම** ශබ්දයට "ඉමස්සිත්ථංදානිහතොධෙසු ච"යි ඉකාරව **ථං** හට ද්විත්වව "ඉත්ථං" යනුවේ.

බහු**ත්ථං**-යන තන්හි "බහුහි පකාරෙහි" යන වාක්‍යයෙහි "කිම්මෙහි ථං" යන සූත්‍රයෙහි "ථං"යි යොගවිභාගයෙන් **ථං** ප්‍රත්‍යයව අප්‍රයොගාදියව **ථං** හට ද්විත්වව විභක්තිට ලොප්ව "බහුත්ථං" යනුවේ.

**මලිනීකරොති**-යන තන්හි "අමලිනං මලිනං කරොති"යන වාක්‍යයෙහි **කර**ධාතුයොගයෙහි අභූතතද්භාවාර්ථයක් ගම්‍යමානකල්හි "යදාදී" සූත්‍රයෙන් නාමයා කෙරෙන් ඊ ප්‍රත්‍යයව "මලිනී කරොති" යනුවේ.

**භස්මීකරණං**-යන තන්හි "අභස්මනො භස්මනො කරණං"යන වාක්‍යයෙහි **කර** ධාතුයොගයෙහි නාමයා කෙරෙන් ඊප්‍රත්‍යයව "භස්මී කරණං" යනුවේ.

**මලිනීභවති**-යන තන්හි "අමලිනො මලිනො භවති" යන වාක්‍යයෙහි භූ ධාතුයොගයෙහි ඊ ප්‍රත්‍යයව "මලිනී භවති" යනුවේ.

**සමාසො පදසඞ්ඛෙපො පදප්පච්චය සංහිතං,**
**තද්ධිතං නාමමිච්චෙවං විඤ්ඤෙය්‍යං තෙසමන්තරං.**

සමාසනම් නොයෙක් පදයන්ගේ අන්‍යොන්‍යසම්බන්ධයෙන් සංක්‍ෂෙප බවයි, තද්ධිතනම් පදි ප්‍රත්‍යයන්ගේ සම්බන්ධ බවයි. "තස්ස අත්ථාය හිතො=තද්ධිතො" යන වාක්‍යයෙහි ෂෂ්ඨී තත්පුරුෂ සමාසව විභක්ති ලොපව "ත්‍ථාහිතො" යන තන්හි හකාරයට "දෙධස්සච"යි චග්ගහණයෙන් ධකාරව ද්විත්වව "තද්ධිතො" යනුවේ.

**සාමඤ්ඤවිසෙසො ච නිපාතො භාවජො තථා,**
**ඉති විඤ්ඤූහි විඤ්ඤෙය්‍යො තද්ධිතො තු චතුබ්බිධො.**

අපත්‍යාර්ථ සංසෘෂ්ටාර්ථාදියෙහි ලිඞ්ගත්‍රයට සාමාන්‍යවූ "වාසිට්ඨො, සාකිකො" යනාදිය සමාන්‍යය, සමූහාර්ථයෙහි එකිඑකි ලිඟුඇති "ගාමතා ආකිඤ්චඤ්ඤං" යනාදිය විශෙෂනාම, "එකධා පදසො" යනාදිය නිපාත නාම, "පණ්ඩිච්චං අරහතා" යිනාදිය භාවජ නාම්.

**තද්ධිතය නිමි.**

නෙකප්පච්චයප්පසඞ්ගෙ, නොයෙක් ප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි-කාලෙ, කාලයතෙම; අතීත, අතීතක්‍රියාවය; වත්තමාන, වර්තමාන ක්‍රියාවද; අනාගත, අනාගත ක්‍රියාවය (යන මොවුන්;) ලක්ඛණෙ, ලක්‍ෂණකොට ඇත්තේය; ආරද්ධෙ, පටන්ගත්තාලද; ක්‍රියෙ, ක්‍රියාව; අනිට්ඨිතෙ, නොනිමිකල්හි; * පච්චුප්පන්නො කාලො, වර්තමානකාලයයි; මතො, දත්තාලදී-ක්‍රියාසන්තාන, පටන්ගත්තාලද ක්‍රියා ප්‍රබන්ධයාගේ; විච්ඡෙදෙ, විසඳීමක් ඇතිකල්හි; කාලො, කාලයතෙම; අතීතො ඉති, ඉකුත්කලායයි; ගම්‍යතෙ, දත්තාලැබේ. ක්‍රියායතු, ක්‍රියාවගේ වනාහි; අනාරම්භෙ, පටන්නොගැණිමක් ඇතිකල්හි; අනාගතො, අනාගතකාලයයි; පතීයතෙ, දත්තාලැබේ-අද්ධබ්භූතං, ද්‍රව්‍යනොවූ; කත්තාදි, කර්තෘකරණාදිවූ; කාරකගණාව, කාරක සමූහයාවිසින්; සාධියං, සාධ්‍යවූ; (හෙවත් කාලසූකතාදිවූ); කත්තුකම්මට්ඨං, කර්තෘකර්මදෙක්හි පිහිටියාවූ; පදත්ථං, ගමනපචනාදිවූ පදාර්ථය; ක්‍රියං ඉති, ක්‍රියාවයයි; තඤ්ඤූ, ඒ ක්‍රියාලක්‍ෂණදන්නෝ; ඉච්ඡන්ති, කැමතිවෙත්.

තස්සාපි, ඒවර්තමානාදි ක්‍රියාහුගේද; අනියමෙ, අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි—අට්ඨවිභත්තීනං, අෂ්ටවිභක්තීන්ගේ; පුබ්බානි, පූර්වවූ; යානියානිපදානි, යම්යම් සපදකොතෙක්ඇත්ද; තානි තානි,

---

* ක්‍රියෙ, ක්‍රියාව; ආරද්ධ, පටන්ගන්නා ලදින්; අනිට්ඨිතෙ, නොනිමිකල්හි.

ඒ ඒ පදයෝ, පරස්සපදනිනාම, පරස්සෙපදයෝ නම් වෙත්-එකම්හි වත්තබ්බෙ, වක්තාහු එකාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණු කැමතිකල්හි,

පුබ්බාපරභාගට්ඨානා, පූර්වභාග අපරභාගදෙක්හි සිටීමෙන්; භින්නා, වෙන්වෙන්වූ; ධාතුවිභත්තියො නිස්සාය, ධාතුවිභක්තීන් නිසා; යෙපච්චයාහොන්ති, යම්ප්‍රත්‍යය කෙනෙක් වෙද්ද; තෙ, ඔහු; විකරණාසිය්‍යුං, විකරණ ප්‍රත්‍යයෝ නම් වෙත්.

පයුජ්ජමානෙ අපි, ප්‍රයොගකරණුලබන කල්හිද-ඉධ මෙතැන්හි; ධාත්වන්තස්ස, ධාත්වන්තයාතමා; චවග්ගාදිත්තා, චවර්ගයෙහි ලා ආදිබැවින්; තාදිසෙ කතෙ, එබන්දක් කළකල්හි; විහානං, විහාවයවේ-ඉධ, මෙතැන්හි; භාවො, භාවයනම්; කාරකාමිස්සො, කාරක හා අමිශ්‍රවූ; සුද්ධො, ශුද්ධවූ, ධාත්වත්ථො, ධාතුහුගේ අර්ථයහි; තස්ස, ඒ භාවකාරකයා තමා, එකත්තා, එකක්බැවින්; එකවචන මෙව, එකවචනමවෙයි- සම්පති, දැන්; භවතංඉති, වීමයයත; අයෙත්ථො, අර්ථයි.

සබ්බෙ ආඛ්‍යාතප්පච්චයා, සියලු ආඛ්‍යාත ප්‍රත්‍යයෝ; සාධනත්තයෙ, කාරකත්‍රයෙහි; භවෙය්‍යුං, වන්නාහ; ඉධ, මේ ආඛ්‍යාත යෙහි; කත්තා, කර්තෘකාරකයද; කම්මංච, කර්මකාරකයද; භාවොච, භාවකාරකයද යන මොහු; සාධනානි, කාරකයහයි; වුච්චරෙ, කියනුලැබෙත්-තෙ, ඒ අඛ්‍යාතප්‍රත්‍යයෝ; සකම්මකම්හා ධාතුම්හා, සකර්මකධාතු කෙරෙන් පරව; කත්තුකම්මෙසු, කර්තෘකර්ම දෙක්හි; හොන්ති, වෙති; භාවෙ, භාවකාරකයෙහි; න, නොවෙත්; කම්මරහිතම්හා, අකර්මකධාතුහු කෙරෙන් පරව; කත්තුභාවෙසු, කර්තෘකාරක භාවකාරක දෙක්හි වෙත්; අපරෙ, මෙයින් අන්‍යවූ කර්මකාරකයෙහි; න, නොවෙත්,

කම්ම, විද්‍යමානවූ කර්මයක්; අවචනිච්ඡායං, නොකීමෙහිලා ඊප්සාවක් ඇතිකල්හි; භාවෙපි, භාවකාරකයෙහිද; සකම්මකා, සකර්මක ධාතුහු කෙරෙන්; න විරුජ්ඣති, විරුද්ධනොවේ; තං යථා, (ඊට උදාහරණ) මෙසේයි; දෙවදත්තෙන, දෙව්දත්හු විසින්; ගෙහෙ, ගෘහ යෙහි; පච්චතෙ, පිස්වයි-සන්තං අපි, විද්‍යමානවූද වස්තුව; වත්තුං, කියන්ට; ඉච්ඡා, ඊප්සාතොමෝ; න, නොවන්නිය; අපි, නැවත; කච්චි, කිසිතැනෙක්හි; අසන්තං අපි, අවිද්‍යමානවූ වස්තුව; වත්තුං, කියන්ට; සා, ඒ ඊප්සාතොමෝ; භවෙ, වන්නිය, තං යථා, (ඊට උදාහරණ) මෙසේයි; කඤ්ඤා, කන්‍යාස්ත්‍රීතොමෝ; අනුදරා, බඩනැත්තීය; සමුද්දො, සමුද්‍රයතෙම; කුණ්ඩිකානිව, කෙණ්ඩියකැයි කියාදවේ-උපසග්ග වසා, උපසර්ගයන්ගේ වශයෙන්; කොචි, කිසි; අකම්මොපි, අකර්මකධාතුද; සකම්මකො, සකර්මකවේ; යථා, ඒ මෙසේයි; මහිද්ධිනා, මහත් සෘද්ධි ඇත්තාවූ; තාපසෙන, තපස්වීහු විසින්, රාගො, රාගය

තෙම; අභිභූයතෙ, මැඩපවත්වනු ලැබේ–යස්මිං ධාතුම්හි, යම් ධාතු
වක්; කත්තුවාචිනි, කර්තෘවාච්‍යකල්හි; කම්මං, කර්මය; ගවෙස්සතෙ,සො
යනුලැබේද; සො, ඒ ධාතුව; සකම්මකොඉති, සකර්මක ධාතුයයි,
ඤෙය්‍යො, දතයුත්තේය; තබ්බිරුද්ධො, ඊට විරුද්ධවූයේ; අකම්මකො,
අකර්මකධාතුයයි දතයුත්තේය,

සොභවතීති,"සො භවති"යයි; වුත්තෙතු,කීකල්හි·වනාහි; භවන
ක්‍රියාය, භවනක්‍රියාව හා; සම්බන්ධියමානං, සම්බන්ධකරණු ලබන්නේ;
කිං තං ඉති, ඒ කිමෙක්දැයි; කිංචිකම්මං, කිසි කර්මයක්; න ගවෙස්ස
තෙ, නොසොයනු·ලැබේ. (කවර හෙයින්ද) තාදිස, එබඳුවූ; සද්දස
ත්තිස්සභාවාභාවා, ශබ්ද ශක්ති ස්වභාවයක්හුගේ නොවීමෙනි,–ආණ
ත්‍යත්ථෙ ච, ආණත්‍යර්ථයක්ද; ආසිඨත්ථෙ ච, ආශංසනාර්ථයක්ද; ග
ම්‍යමානෙ, හැඟෙනකල්හි; පච්චුප්පන්නෙ, වර්තමානයෙහි හෝ; කාල
භෙදං, කාලභෙදයක්; අනාමසිත්වා වා, නොගෙණ හෝ; පඤ්චමීහො
ති, පඤ්චමිවිභක්තිය වේ.

නියොගං, නියොගකිරීම; ආණත්තිං ජඤ්ඤා, ආණත්තියයි දත්
තේය; ඉට්ඨප්පත්ථනං, කැමතිදෙයක් ප්‍රාර්ථනාකිරීම; ආසිඨං, ආසිංස
නයයි දත්තේය; අනුත්තකාලො, අනුත්තකාලය නම්; සාමීපෙ,
ආසන්නයෙහි; වුත්තො කාලො, කියනලද කාලයයි; ඉධ,මෙතන්හි;
ඉච්ඡිතො, කැමතිවනලදී; පච්චුප්පන්නාදි භෙදතො, වර්තමානාදී භෙද
යෙන්; අවුත්තො වා,නොකියනලද කාලය හෝ; ගහෙතබ්බො, ගත
යුතුයි.

යංකිඤ්චි, යම් කිසිවක්; කාතුං, කරන්ට; ඉච්ඡන්තානං, කැමැත්ත
හු; යො අඤ්ඤො, යම් අනිකෙක්; අනුමඤ්ඤති, අනුදනීද; සා,ඕතො
මෝ; අනුමති, අනුමතිනම්වේ; කාතබ්බානිච්ඡයො, කටයුත්ත නිශ්ච
යනොකිරීම; පරිකප්පොමතො, පරිකල්පයයි දන්නාලදී.

බ්‍යඤ්ජනාදෙ, ව්‍යඤ්ජනයක් ආදිකොට ඇති; අසබ්බධාතුකම්හි,
අසාර්වධාතුකයා පරකල්හි; ඉ ආගමො, ඉකාරාගමවේ–හිය්‍යොප්පභූති,
ඊයේපටන් කොටඇති; පච්චක්ඛෙවා, ප්‍රත්‍යක්ෂයෙහි හෝ–අජ්ජප්ප
භූති, අද ආදිකොට ඇති.

අතීතරත්තියා, ඉකුත් රාත්‍රියගේ; පච්ඡිමො යාමොවා, පශ්චිම යා
මය හෝ; අමුස්ස, මේ යාමයාගේ; අඩ්ඪංවා, අර්ධයක් හෝ; අජ්ජතනී
කාලොසියා ඉති, අජ්ජතනී කාලයනම් වන්නේයයි; වෙය්‍යාකරණ
දස්සනං, වෛයාකරණයන්ගේ දර්ශනයයි.

අනාගතෙ කාලෙ, භවිෂ්‍යත් කාලයෙහි-ක්‍රියාතිපන්නමත්තෙ, ක්‍රියාවගේ අතිපතන මාත්‍රයෙක්හි-විරුඬසන්නිධානාවා, විරුඬවස්තු වක්හුගේ ලංවීමෙන් හෝ; හෙතුවෙකල්ලතොපි වා, කාරණවෙ කල්‍යයකින් හෝ; ක්‍රියාය, ක්‍රියාහුගේ; යං අභවනං, යම් නොවීමෙක් වේද; තං, ඒ; ක්‍රියාතිපතනං, කාලාතිපත්ති නමැති; ඉච්ඡිතං, කැම තිවනලදී.

සචෙ, ඉදින්; තබ්බිරුඬං තහවෙය්‍ය, ඊට විරුඬයෙක් නුවූයේවී නම්; තදුපකරණංවා, ඊට උපකරණයක් හෝ; ලභෙථ, ලද්දේනම්; අපවිසසා, පිසී-අඪවිභත්තිසු, වත්තමානාදි අෂ්ටවිභක්තීයෙහි; සෙද ය්‍යං, විභක්තිරූප දතයුතුයි.

හෙතුඵල්පපච්චයන්තකා, හෙතුවී ප්‍රත්‍යයන් අන්තකොට ඇත් තාවූ; අකම්මකා අපි, අකර්මකධාතුද; සකම්මකා, සකර්මකවෙත්; තං යථා, ඊට උදාහරණ මෙසේයි; භික්ඛු, මහණතෙම; රාගාදිදූසකං, රාගාදීන් දූෂ්‍යකොට; මග්ගං, ආය්‍යීමාගීය; භාවෙති, වඩා.

කී, කි යන ධාතු; දබ්බවිනිමයෙ, ද්‍රව්‍ය ගණුදෙනු කිරීමෙහි වැටේ-භුජනම්ච්ඡති, "භුජන මිච්ඡති" යන තන්හි තුං ප්‍රත්‍යය සහිත ඊ්පසාපී නැති බැවින් ඡ ප්‍රත්‍යය නොවන පිණිසයි.

යං, යමක්; තිකාලං, (අතීතානාගත වර්තමාන සඞ්ඛ්‍යාත) කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං, (ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ උත්තම පුරුෂ සඞ්ඛ්‍යාත) පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචි, ගමන පචනාදි ක්‍රියාවාචකද; තිකාරකං, (කර්ම කර්තෘ භාව යන) කාරකත්‍රයක් ඇත් තේද; අතිලිඞ්ගං, (පුංලිඞ්ගාදි) ලිඞ්ගත්‍රයක් නැත්තේද; විවචනං, (ඒකවචන බහුවචන සඞ්ඛ්‍යාත) වචන වයක් ඇත්තේද; තං, ඒ; ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාත නමැයි; වුච්චති, කියනුලැබේ.

ආඛ්‍යාත ගණයිපදුම් කියා නිමවනලදී.

---

පචති, පචන්ති-යන තන්හි පචපාකෙ යන්නෙහි පච ධාතු පචති වේ, ඕහට "භූවාදයො ධාතවො" යන සූත්‍රයෙන් ධාතු සංඥා වේ, අනෙක ස්වරවූ ධාතුහුගේ අන්තයහට "ධාතුස්සන්තො ලොපො නෙකසරස්ස" යන සූත්‍රයෙන් කිසිතැනෙක්හි ලොප්වේ, ධාතු කෙරෙන් පරව "ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා" යන සූත්‍රයෙන් අනෙක ප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි වක්තෘහුගේ විවක්ෂාවශයෙන් "වත්තමානා ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ ව්හෙ එ ම්හෙ"යන සූත්‍රයෙන් වර්තමාන සංඥකරණලද ති ආදි විභක්තීහු "වත්තමානා

පච්චුප්පන්නෙ" යන සූත්‍රයෙන් වර්තමාන කාලයෙහි වෙති. ඔවුන් ගේනුදු පූර්වච්ඡක අපර ච්ඡක වශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇති කල්හි "අථ පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි" යන සූත්‍රයෙන් පරස්මෛපද සංඥකරණලද ති ආදි සදෙන "කත්තරි පරස්සපදං" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වෙති, ඔවුන්ගේද ප්‍රථම පුරුෂාදි වශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "ද්වෙ ද්වෙ පඨම මජ්ඣිමුත්තම පුරිසා" යන සූත්‍රයෙන් ප්‍රථම පුරුෂ සංඥකරණලද ති අන්ති යන දෙදෙන, තුල්‍යාධිකරණ නාමයක් කරණුලබතුදු නොලබතුදු "නාමම්හි පයුජ්ජමානෙපි තුල්‍යාධිකරණෙ පඨමො" යන සූත්‍රයෙන් ප්‍රථම පුරුෂයෙහි වෙති, ඔවුන්ගේ නුදු එකවචන බහුවචන වශයෙන් අනියමින් ප්‍රාප්තියක් ඇතිකල්හි "එකම්හි වත්තබ්බෙ එකවචනං" යනු න්‍යායහෙයින් වක්තෘහු එකාර්ථමාත්‍රයක් ප්‍රකාශකරණු කැමතිකල්හි එකවචන සංඥකරණලද ති විභක්ති එක්තැනක වේ. බහුවචන සංඥකරණලද අන්ති විභක්ති එක්තැනකවේ, භූවාදින් කෙරෙන් පරව කර්තෘකාරකයෙහි "භූවාදිතො අ" යන සූත්‍රයෙන් අ ප්‍රත්‍යයවේ, අපර පක්ෂයෙහි "සරලොපො" යනාදීන් පූර්වස්වර ලොප්ව පරස්වරයට ප්‍රකෘතිවේ, යටසිටි ස්වර රහිතවූ ව්‍යඤ්ජන තෙම "නයෙ පරං යුත්තෙ" යන් පරිභාෂා සූත්‍රයෙන් පරාක්ෂරයා කරාපැමිණ ආඛ්‍යාත ප්‍රත්‍යයහට "පරසමඤ්ඤා පයොගෙ" යන සූත්‍රයෙන් පදසංඥව "පචති පචන්ති" යනුවේ–"පචති" යනු පච ධාතුවෙන් කර්තෘකාරකයෙහි සිඩවූ වර්තමාන පරස්මෛපද ප්‍රථම පුරුෂෛක වචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, "පචන්ති" යනු පච ධාතුකෙරෙන් කර්තෘකාරකයෙහි සිඩවූ වර්තමාන පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයි, මධ්‍යම පුරුෂයෙහි සි විභක්ති ථ විභක්තිව "පචසි පචථ" යනුවේ.

පචාමි පචාම–යනතන්හි ධාතුසංඥ අනන්තිලොපාදියව "භූවාදිතො අ" යි අප්‍රත්‍යයව "අකාරො දීඝං හිමිමෙසු" යි අකාර දීර්ඝව පැමිණ "පචාමි පචාම" යනුවේ–ආත්මනෙ පදයෙහි පිළිවෙළින් තෙ ආදී විභක්තිව "පචතෙ පචන්තෙ, පචසෙ පචව්හෙ, පචෙ පචාමහෙ" යනුවේ.

පච්චති–යනතන්හි ධාත්වන්තයට ලොප්ව ති විභක්ත්‍යාදී පූර්වයෙහි "භාවකම්මෙසු යො" යි ය ප්‍රත්‍යයව ධාත්වන්තයා සමග යකාරය හට "තස්ස චවග්ග යකාර වකාරත්තං සධාත්වන්තස්ස" යි චකාරාදේශව චකාර ද්විත්වව "පච්චති" යනුවේ–"පච්චන්ති" යනාදියද මෙසේයි භාවකාරකයෙහි භූ ධාතුකෙරෙන් ය ප්‍රත්‍යයව "භූයතෙ" යි සිඩවේ. "පචතු" යනාදියද "පචති" යනාදිය මෙනි.

**පච පචාහි**-යනතන්හි "හිලොපංවා"යි හි විභත්තියට විකල්පයෙන් ලොප්ව ලොප්නුවූ පක්ෂයෙහි "අකාරෙ දීඝං හිම්මෙසු" යන සූත්‍රයෙන් අකාර දීඝීව "පච පචාහි" යනුවේ-"පචතං" යනාදියද මෙසේයි.

**පචෙ පචෙය්‍ය**-යනතන්හි **එය්‍ය** විභත්තිහට "යදාදී"න් විකල්පයෙන් එකාරාදෙශව පැමිණ "පචෙ පචෙය්‍ය" යනුවේ-"පචෙථ" යනාදියද මෙසේයි.

**පපච**-යනතන්හි පරොක්ෂාවෙහි අ ප්‍රත්‍යයව ධාත්වන්තලොපාදියව "ඛවාදි වණ්ණාන මෙකස්සරානං වෙභාවො" යන සූත්‍රයෙන් ධාත්වාදි වර්ණවූ චකාරයට ද්විත්වව පැමිණ "පපච" යනුවේ-"පපචු" යනාදියද මෙසේයි-"ඉකාරාගමො අසබ්බධාතුකම්හි" යන සූත්‍රයෙන් ඉකාරාගමව "පපචිත්ථ" යනාදිය වේ.

**අපචා**-යනතන්හි "ධාත්වන්ත ලොපාදියව "අකාරාගමො හීය ත්තනාජ්ජතනි කාලාතිපත්තිසු" යන සූත්‍රයෙන් ධාතුවෙන් පූර්වභාගයෙහි අකාරාගමව "අපචා" යනුවෙ. "අපචු" යනාදියද මෙසේයි.

**අපචි අපචී පචි**-යනතන්හි ධාත්වන්ත ලොපාදියව දෙතැනක අකාරාගමව විකල්පයෙන් ඊකාරයට හ්‍රස්වව සිඩවේ. **"අපචිංසු"** යනතන්හි "සබ්බතො උං ඉංසු" යන සූත්‍රයෙන් **උං** විභක්තිහට **ඉංසු** යනාදෙශව සිඩවේ.

**පාචෙති පාචෙන්ති**-යනතන්හි ධාත්වන්ත ලොප්ව "ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙතවත්ථෙ" යන සූත්‍රයෙන් ණෙ ප්‍රත්‍යයව කාරිත සංඥව "කාරිතානං ණො ලොපං"යි ණ හට ලොප්ව අකාර ශෙෂව "අසංයොගන්තස්ස වුඩ්ඪි කාරිතෙ"යි පූර්වයට වෘඩිව "පාචෙ"යි ව ඔහු සොරෙන් "ධාතුප්පච්චයෙහි විභත්තියො"යි ති ආදිවිභක්තිව "පාචෙති පාචෙන්ති" යනුවේ. සෙස්සද මෙසේයි.

---

රුන්ධති-යන තන්හි ධාත්වන්ත ලොපාදියව "රුධාදිතො නිග්ගහිත පුබ්බඤ්ච"යි අ ප්‍රත්‍යය හා ධාත්වන්තයට පූර්වයෙහි නිග්ගහීතයෙක්ද ආගමව "වග්ගන්තං වා වග්ගෙ" යන සූත්‍රයෙන් තද්වර්ගාන්තාදෙශව ,'රුන්ධති'' යනුවේ. "රුන්ධන්ති" යනාදියද මේසේයි.

දිබ්බති-යන තන්හි ධාත්වන්ත ලොපාදියව "දිවාදිතොයො"යි **ය** විකරණ ප්‍රත්‍යයව යකාර වකාර සංහිතව යවත්වූ වකාරයහට "යථාකත්තරිච"යි පූර්වරූපව ද්විත්වව "දෙධස්සච"යි චග්‍රහණයෙන් වකාරයන්ට බකාරව "දිබ්බති" යනුවේ. "දිබ්බන්ති" යනාදියද මෙසේයි.

**සුණොති**-යන තන්හි සු ධාතුකෙරෙන් "ස්වාදිතො ණුණාඋණා ච" යි ණු විකරණ ප්‍රත්‍යයව "අඤ්ඤෙසු ච"යි චග්‍රහණයෙන් ණුප්‍රත්‍යයාගේ උකාරයට ඔකාරයෙක් වෘද්ධිව "සුණොති" යනුවේ. උකාර ලොප්ව "සුණන්ති" යනුවේ.

**කිණාති**-යන තන්හි කී ධාතු කෙරෙන් "කියාදිතො නා"යි නා විකරණ ප්‍රත්‍යයව ධාතුහුගේ ඊකාරයට "යදදී"න් හ්‍රස්වව ප්‍රත්‍යය සම්බන්ධ නා හට "ඤවාදී"න් ණකාරව "කිණාති" යනුවේ.

**ඝෙප්පති**-යන තන්හි ගහ ධාතුහු කෙරෙන් "ගහාදිතොප්පණ්හා"යන සූත්‍රයෙන් ප්ප යන විකරණ ප්‍රත්‍යයව "ගහස්සඝෙප්පෙ"යි ගහ ධාතුහට ඝෙ යනාදෙශව "ඝෙප්පති" යනුවේ. ණ්හා ප්‍රත්‍යය පරකල්හි "හලොපො ණ්හාම්හි"යි ගහ ධාතුහුගේ හකාරයට ලොප්ව "ගණ්හාති" යනාදියවේ.

**කරොති**-යන තන්හි කර ධාතුකෙරෙන් "තනාදිතොඔයිරා"යි ඔ විකරණ ප්‍රත්‍යයව "කරොති" යනුවේ-යිර ප්‍රත්‍යයවූ තන්හි "යදදී"න් ධාතුහුගේ රකාරයට ලොප්ව "කයිරති" යනුවේ-බහුවචනයෙහි අන්ති විභක්තිව "උත්තමොකාරො ච"යි ඔ කාරයට විකල්පයෙන් උකාරව "කරස්සකාරො ච"යි කර ධාතුහුගේ කකාරයේ අකාරයටද විකල්පයෙන් උකාරව රකාරයහට ලොප්ව "වමොදුදන්තානං"යි උකාරයට වකාරව සිද්ධව "දෙ ධස්ස ච"යි චග්‍රහණයෙන් වකාරවයට බකාරවයක්ව "කුබ්බන්ති කරොන්ති" යනුවේ. "කුරුතෙ කුබ්බතෙ" යනාදියද මෙසේයි-කම්මකාරකයෙහි "භාවකම්මෙසු යො"යි ය ප්‍රත්‍යයව "ඉවණ්ණාගමො වා"යි විකල්පයෙන් ඉකාරාගමව යකාරයහට සිද්ධව "කරීයතෙ කරීයන්ති" යනාදියවේ-ඉකාරාගම නුවූ තන්හි "යදදී"න් රකාර ලොප්ව "කය්‍යතෙ" යනාදියවේ-අජ්ජතනියෙහි "කරස්ස කාසත්තමජ්ජතනිම්හි" යන සූත්‍රයෙන් විකල්පයෙන් කාස යනාදෙශව පූර්වයෙහි අකාරාගමව ඊශන්තට හ්‍රස්වව "අකාසි අකරි අකාසුං අකරුං"යනාදියවේ.-භවිස්සන්ති විභක්තියෙහි "කරස්ස සප්පච්චයස්ස කාහො" යන සූත්‍රයෙන් ප්‍රත්‍යය සහිත කරධාතුහට විකල්පයෙන් කාහ යනාදෙශව කාහ යනාදෙශ නුවූ පක්ෂයෙහි ඉකාරාගමව "කාහති කරිස්සති" යනාදියවේ.

**චොරෙති**-යන තන්හි චුර ධාතු කෙරෙන් "චුරාදිතො ණෙණයා"යි ණෙ යන විකරණ ප්‍රත්‍යයව කාරිතසංඥව ණකාර ලොප්ව වෘද්ධිව "චොරෙති" යනුවේ.-සෙස්සද මෙසේයි.

---

**බුභුක්ඛති**-යන තන්හි **භුජ** ධාතුහුගේ අන්තයට ලොප්ව "භුජ ඝසහරසුපාදීහිතුම්ඉච්ඡත්ථෙසුච"යි "තුං" ප්‍රත්‍යයෙන් යුත් ඊප්සාර්ථයෙහි **ඛ** ප්‍රත්‍යයව "ඛචාදිවණ්ණානමෙකස්සරානං ද්වෙභාවො" යන සූත්‍රයෙන් ආදිවර්ණයට ද්විත්වව ද්විත්වයේ පූර්වභාගයට "පුබ්බොබ්භාසො"යි **අබ්භාස** සංඥවේ, කරණලද **අබ්භාස** සංඥ ඇති භකාරයට "දුතිය චතුත්ථානං පඨමා තතියා"යි බකාරව ධාතුහුගේ අන්ත ජකාරයට "කොබෙව"යි කකාරව කකාර ඛකාර සංහිතව "බුභුක්ඛ"යි වේ; ඔහුකෙරෙන් "ධාතුප්පච්චයෙහි විභත්තියො"යි තිවිභක්තිව "බුභුක්ඛති" යනුවේ. "බුභුක්ඛන්ති" යනාදියද මෙසේයි.

**ජිඝච්ඡති**-යන තන්හි **ඝස** ධාතුහුගේ අන්ත ලොපාදියව "භුජාදී" සූත්‍රයෙන් **ඡ** ප්‍රත්‍යයව "ඛචාදී" සූත්‍රයෙන් පූර්වයට ද්විත්වව **අබ්භාස** සංඥව පූර්ව ඝකාරයට "කවග්ගස්ස චවග්ගො"යි ඣ කාරව "දුතියාදී" සූත්‍රයෙන් ඣකාරයට ජකාරව අබ්භාසසංඥකරණලද ජකාරය සම්බන්ධ අකාරයට "අන්තස්සිවණ්ණාකාරොවා"යි ඉකාරව ධාත්වන්තය හට "බ්‍යඤ්ජනන්තස්ස චො ඡප්පච්චයෙසුච"යි චකාරව "ජිඝච්ඡ"යි වේ. ඔහුකෙරෙන් **ති** විභක්තිව "ජිඝච්ඡති" යනුවේ-"ජිඝච්ඡන්ති" යනාදි යද මෙසේයි.

**ජිගිංසති**-යන තන්හි **හර** ධාතුවසම්බන්ධ අන්තලොපාදියව "භුජාදී"න් **ස** ප්‍රත්‍යයව **ස** පරකල්හි "හරස්ස ගිංසෙ"යි **හර** ධාතුවට ගිං යනාදෙශව හකාරයහට "හස්සජො"යි ජකාරව අබ්භාසාන්තයට ඉකාරව "ජිගිංස"යි වේ. නැවත ඔහුකෙරෙන් ති ආදි විභක්තිව "ජිගිංසති" යනාදියවේ.*

**පබ්බතායති**-යනතන්හි **පබ්බත** ශබ්දයාකෙරෙන් අං විභක්තිව පැමිණ "පබ්බතමිව අත්තානමාචරති" යන වාක්‍යයෙහි කර්තෘහට **උප** මානවූ විතීයාන්ත නාමයාකෙරෙන් ආචාරාර්ථයෙහි "ආය නාමතො කත්තුපමානාදාචාරෙ" යන සූත්‍රයෙන් **ආය** ප්‍රත්‍යයව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව පැමිණ "පබ්බතාය"යිවේ. ඔහුකෙරෙන් "ධාතුප්පච්චයෙහි විභත්තියො"යි **ති** ආදි විභක්තිව "පබ්බතායති" යනාදිය වේ.

**පුත්තීයති**-යන තන්හි "පුත්තමිවාචරති" යන වාක්‍යයෙහි කර්තෘයට උපමානවූ විතීයාන්ත නාමයා කෙරෙන් "ඊයූපමානාච"යි **ඊය** ප්‍රත්‍යයව **ති** ආදියව "පුත්තීයති" යනාදිය වේ.

---

* මෙහි **ස** ප්‍රත්‍යය පරනිමිත්තෙන් **හර** ධාතුවහට **ගිං** ආදෙශ කොට ස්ථානොපචාර වශයෙන් ආදෙශයටත් ධාතු ව්‍යවහාරය ලැබෙන බැවින් ගි යන්නට ද්විත්වව "ගස්සජො"යි ගකාරයට ජකාරව 'ජිගිංසති'යි සිද්ධවේ. එබැවින් "හස්සජො" යනු "ගස්සජො"යි යොජ්‍යවේ.

**පතතීයති**-යන තත්හි "අනනනොපත්තමිච්ඡති" යන වාක්‍ය යෙහි "නාමම්හා අත්‍තිච්ඡත්ථෙ"යි ඊය ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදි යව ති ආදියව "පතතීයති" යනාදියවේ.

**විසුඩයති**-යන තත්හි "විසුඩා හොති" යන වාක්‍යයෙහි "ධාතු රූපෙ නාමසමා ණයොව"යි ණය ප්‍රත්‍යයව අප්‍රයොගාදියව ති ආදි යව "විසුඩයති" යනාදියවේ.

**දළ්හයති**-යනතත්හි "දළ්හං කරොති" යන වාක්‍යයෙහි වාක්‍ය අප්‍රයොග විභක්ති ලොපාදියව "ධාතුරූපෙ නාමසමා ණයොව"යි ණය ප්‍රත්‍යයව ති ආදි විභක්තිව "දළ්හයති" යනාදියවේ.

**අතිහත්ථයති**-යනතත්හි "හත්ථිනා අතික්කමති" යන වාක්‍ය යෙහි අති පූර්ව හත්ථි ශබ්දයාකෙරෙන් ණය ප්‍රත්‍යයව අප්‍රයොගාදියව ති ආදියව "අතිහත්ථයති" යනාදියවේ.

**ආඛ්‍යාත පදසිද්ධි නිමි.**

---

ණාදි, ණප්‍රත්‍යය ආදිකොට ඇති; දුතිය යුපපච්චයන්තකා, දෙවෙනි යු ප්‍රත්‍යය අන්තකොට ඇති ප්‍රත්‍යයෝ; කාලත්තයෙ, (අතීතානාගත වර්තමාන සඞ්ඛ්‍යාත) කාලත්‍රයෙහි; දණ්ඩා, දුක්කයුක්තාග-කිච්චෙහි, කිච්චප්‍රත්‍යයන් කෙරෙත්; අසෙසා, සෙසු; ණාදයො, ණප්‍රත්‍යාදීහුද; යුපපන්නයොච, යුප්‍රත්‍යය ආදිකොට ඇත්තාහුද; කිත්සඤ්ඤාහොන්ති, කිත් සංඥ ඇත්තෝවෙත්; කිත්සඤ්ඤා, කිත් සංඥ ඇත්තෝ; කත්තරි, කර්තෘකාරකයෙහි; දණ්ඩා, දුක්කයුත්තාහ; යථා තත්ති, පෙළඹූපරිද්දෙත්; ඛචි, කිසිතැනෙක්හි; කම්මාදිසුපි, කර්මකාරකාදියෙහිද කිත්සංඥ වෙත්—ආදෙසති, ආදියෙහි ඇහිකල්හි.

**කිතකා**, කිතක ප්‍රත්‍යයෝ; අභිධෙය්‍ය, අර්ථයට බඳුවූ; ලිඞ්ගා, ලිඞ්ග ඇත්තාහ; ඉයුවණ්ණා, ඉවණ්ණ උවණ්ණාන්ත ධාතුකෙරෙත්ද; වරාදිතො, වරාදි ධාතුගණයා කෙරෙත්දවූ; අපච්චයො, අප්‍රත්‍යයද; දුතියො ණො, දෙවන ණප්‍රත්‍යයද; ඉපච්චයො, ඉප්‍රත්‍යයද; පුමෙ, පුංලිඞ්ගයෙහි; සියුං, වත්නාහ; අකත්තරි, කර්තෘකාරකයෙන්පිටත් තත්හි වත්නාහු; යුච, යුප්‍රත්‍යයද; භාවසම්ං, භාවකාරකයෙහිවූ; කිච්චා, කිච්ච ප්‍රත්‍යයෝද; තොඑ, තප්‍රත්‍යයද; (යනමොහු) නපුංසකෙ, නපුංසකලිඞ්ගයෙහි වත්නාහ; තවාදි, තවෙ ප්‍රත්‍යය ආදිකොට ඇති; ඉකඛත්තුං අන්තාතු, ඉකඛත්තුං ප්‍රත්‍යය කෙළවරකොටඇති ප්‍රත්‍යයෝ වත්නාහි; අලිඞ්ගා, ලිඞ්ග නැත්තාහ; අවිභත්‍යාතයොච, විභක්තිද නැත්තාහ.

**කමෙම, කම්යක්;** ආදෙ, ආදියෙහි ඇතිකල්හි හෝ; අනාදෙවා, ආදියෙහි නැතිකල්හි හෝ; සබ්බධාතුහි, සියලු ධාතූන්කෙරෙන්; අකාරො, අකාරයද; ණවුතුආවිච, ණවුතු ආවි යනමොහුද; හොන්ති, වෙත්—සඤ්ඤායං, සංඥවක් ගම්‍යමානකල්හි; විහත්‍යලොපො, විභක්තිහට ලොප්නොවේ—ධතුතො, ධාතුහුකෙරෙන්; පුබ්බභාගාඑව, පූර්වභාගවූවාහුම—ධාතුනං, ධාතූන් තමන්; අනෙකාර්ථතාඑව, අනෙකාර්ථ බැවින්ම; නී ඉති, නී යන; අසම්ඥධාතුමහි, මේ ධාතුවෙහි; සන්තාමෙව, විද්‍යමානවූම; සික්ඛත්ථං, ශික්ෂාර්ථය; විසද්දෙ, වි ශබ්දය ඉත්ව; ජෙතෙති, ප්‍රකාශකෙරේ.

සන්තාංඑවහි, විද්‍යමානවූම; නීලාදිවණ්ණං, නීල්පීතාදිවර්ණය; දීපාදයො විය, ප්‍රදීප සූර්‍ය්‍යාදීහු ප්‍රකාශකරන්නාක්මෙන්; ධාතුසම්ං, ධාතුවෙහි; සන්තාංඑව, විද්‍යමානවූම; අත්ථං, අර්ථය; උපසග්ගා, උපසර්ගයෝ; පකාසකා, ප්‍රකාශකරන්නාහුයි.

වරසරා, **වර වරණෙෂ සරගතිචින්තායං** යන ධාතුද; දරවරා, **දරඅනාදරෙය චරගතියං** යන ධාතුද, ගමුයමු, **ගමුගතියංය යමු උපරමෙය** යන ධාතුද; සනහනා, **සනසද්දෙය හනහිංසායංය්‍යන** ධාතුද; නදමද, **නදඅබ්‍යත්තසද්දෙය මදඋම්මාදෙය** යන ධාතුද; රණගහා, **රණසද්දෙය ගහඋපාදනෙය** යන ධාතුද; ජපාදයො **ජප බ්‍යත්තවචෙ** යනාදීහුද වරාදයො, වරාදී ධාතුහු නම්වෙත්.

අභිහිධම්මා, නොසිටිනා සවභාව ඇත්තාහු; අනුබන්ධා, අනුබන්ධයෝයි-ඉහ, මෙහි; **එ ඔ නං එ ඔ** යන මොවුන්, වුඩ්ඪි, වෘඩියයි කියා ගහිතත්තා, ගත්හෙයින්; ගුණොඉති, ගුණයයි; ඉකාරාදි, ඉකාරාදීය ගත්නාලැබේ—දහනභවජ්ජිතෙහි, **දහනහ** යනධාතූන් තොරකොටඇති-තදත්ථෙගම්‍යමානෙ, ඒ බුධගමාදි අර්ථයක් ගම්‍යමානකල්හි-පච්චුප්පන්නකාලෙ, වර්තමානකාලයක් ගම්‍යමාන කල්හි-යෙයො ති, සෙසනම්; අපරිසමත්තො, පරිසමාප්ත නුවූයේය යන අර්ථයි-පරාපෙක්ඛායං, අනිකක්හුගේ අපෙක්ෂාවක් ඇතිකල්හි-භිතනකත්තුහොසුපි, වෙන්වෙන්වූ කර්තෘන් ඇති ධාතූන් විෂයෙහිද, (නුනාදීහු වෙත් යයි) වදනනි, කියත්-සයකාරස්ස යකාර සහිතවූ.

බාලප්පබොධත්ථං,අව්‍යුත්පන්න බාලයන්ගේ අවබොධය පිණිස; ලිඞ්ගං, ලිඞ්ගය; යෙභුය්‍යවුත්තියා, බාහුල්‍යවෘත්තියෙන්; වුත්තං, කියනලදී; තත්‍ථ සබ්බත්‍ථ, ඒ සැමතන්හිම්; විසෙසො, වේනස; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්;පාලිතො, පාලියෙන්; ඤෙය්‍යා, දතයුක්තෝයි.

**භ්‍වාදගන ගණයිපදුව නිමි.**

**පුඤ්ඤකාරො**-යනතන්හි පුඤ්ඤං යනු උපපදකොට ඇති "කර කරණෙ" යන්නෙහි "කර" යන ධාතු **කර**යි සිටී, ඊහට "භූවාදයො ධාතවො" යන සූත්‍රයෙන් ධාතු සංඥවේ, අනෙකස්වරවූ ධාතුහුගේ අන්තයහට "ධාතුස්සන්තො ලොපො නෙකස්සරස්ස" යන සූත්‍රයෙන් ලොප්වේ, ධාතුහු කෙරෙන් පරව "ධාතුලිඞ්ගෙහි පරාප්පච්චයා" යන **පරිභාෂා** සූත්‍රයෙන් අනෙක ප්‍රත්‍යයන්ගේ ප්‍රාප්තියක් ඇතිකල්හි වක්තෘහු විවක්ෂාවශයෙන් "පුඤ්ඤං අකාසි කරෙති කරිස්සති" යන වාක්‍යයෙහි කර්මයක් ආදිකොට ඇති ධාතුහු කෙරෙන් පරව "ධාතුයා කම්මාදිම්හි ණො" යන සූත්‍රයෙන් ණ ප්‍රත්‍යයවේ, එන්නෙහි "ණාදයො තෙකාලිකා" යන සූත්‍රයෙන් කාලත්‍රයෙහි වෙයි, හෙද "අඤ්ඤෙසු කිත්" යනු සූත්‍රයෙන් **කිත්** සංඥව "කත්තරි කිත්" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි වේ, ඊහට "කාරිතං විය ණානුබන්ධො" යන සූත්‍රයෙන් **කාරිත** සංඥවේ, කාරිත ප්‍රත්‍යයා සම්බන්ධවූ ණහට "කාරිතානං ණො ලොපං" යන සූත්‍රයෙන් ලොප්ව අකාර ශෙෂවේ, සණකාර ප්‍රත්‍යයා පරකල්හි "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ" යන සූත්‍රයෙන් වෘද්ධි වෙයි, එන්නෙහිදු "අයුවණ්ණානං චායො වුද්ධි"යි නියමකළහෙයින් අකාරයහට ආකාරයෙක්වේ, පූර්වපදයා සම්බන්ධවූ විභක්තිහට "තෙසං විභත්තියො ලොපා ච" යන සූත්‍රයෙහි **තෙසං** ශබ්ද ග්‍රහණයෙන් ලොප්වේ, විභක්තීන්ට ලොප්කළ කල්හි අන්තයහට "පකති චස්ස සරන්තස්ස" යන සූත්‍රයෙන් ප්‍රකෘතිවේ, කිතක ප්‍රත්‍යයන් තමන් අලිංගහෙයින් "තද්ධිත සමාස කිතකා නාමංවාතවෙතුනාදිසුච" යන සූත්‍රයෙන් නාමවත්ව සිව බව "පුඤ්ඤකාරො" යනුවේ.

**තක්කාරො**-යනතන්හි "තං කරොති" යන වාක්‍යයෙහි "සබ්බතො ණ්වුත්වාවීවා"යි අප්‍රත්‍යයව අන්තලොප විභක්ති ලොපාදියව පැමිණ "පරමෙද්වෙභාවො ඨානෙ"යි කකාරද්විත්වව සිව බව "තක්කාරො" යනුවේ. "දීපං" යනු පූර්ව **කර** ධාතු කෙරෙන් අප්‍රත්‍යයව විභත්ති ලොප්නොව "දීපඞ්කරො" යනුවේ.

**විනායො**-යනතන්හි **වි** පූර්ව **නී** ධාතුව කෙරෙන් "සබ්බතො ණ්වුත්වාවීවා"යි අප්‍රත්‍යයවේ, අප්‍රත්‍යය පරකල්හි අසංයොගාන්තවූ ආදි ස්වරයහට "අඤ්ඤෙසු ච"යි එකාරයෙක් වෘද්ධිව ස්වරණ පරකල්හි "එ අය" යන සූත්‍රයෙන් එකාරයට **අය** යනාදෙශව නාමවත්ව සිව බව "විනායො" යනුවේ.

**භවො**-යනතන්හි **භූ** ධාතුහු කෙරෙන් **අ** ප්‍රත්‍යයව "අඤ්ඤෙසු ච"යි ඌකාරයට ඔකාරයෙක් වෘද්ධිව ඔකාරයට "ඔ අව සරෙ"යි අව යනාදෙශව නාමවත්ව සිව බව "භවො" යනුවේ.

**සංවරො**-යනතන්හි **සං** පූර්ව **වර** ධාතු කෙරෙන් **අ** ප්‍රත්‍යයව පැමිණ නාමිවත්ව **සිව** ඔව "සංවරො" යනුවේ.

**අන්නදායකො**-යනතන්හි **අන්නං** යනු උපපදකොට ඇති **දා** ධාතුකෙරෙන් "සබ්බතො ණ්වුත්වාවී"යි **ණ්වු** ප්‍රත්‍යයව **ණ**කාරානුබන්ධ ප්‍රත්‍යයා පරකල්හි ආකාරාන්තධාතුහුගේ අන්තයට "ආකාරන්තානමායො"යි **ආය** යනාදෙශව "අනකායුණ්වූනං"යි **ණ්වු** හට **අක** යනාදෙශව විභක්ති ලොපාදියව පැමිණ **සිව** ඔව "අන්නදායකො" යනුවේ.

**නායකො**-යනතන්හි **නී** ධාතුහුකෙරෙන් **ණ්වුව** "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ"යි වෘද්ධිව "තෙ ආවායා කාරිතෙ"යි එකාරයට **ආය** යනාදෙශව **ණ්වු**හට **අක**ව නාමිවත්ව **සිව** ඔව "නායකො" යනුවේ.

**සාවකො**-යනතන්හි **සු** ධාතුහුකෙරෙන් **ණ්වුව** වෘද්ධිව ඔකාරයට **ආව** ව **ණ්වු**හට **අක**ව "සාවකො" යනුවේ.

**කත්තා**-යනතන්හි **කර** ධාතුකෙරෙන් **තු** ප්‍රත්‍යයව ධාත්වන්ත ලොපාදියව "කරස්ස ච තත්තං තුස්මිං"යි ධාත්වන්තයට තකාරව නාමිවත්ව **සිව** **ආ**ව "කත්තා" යනුවේ.

**භයදස්සාවී**-යනතන්හි **භයං** යනු උපපදකොට ඇති **දිස** යන ධාතුහුකෙරෙන් **ආවී** ප්‍රත්‍යයව **දිස** ධාතුහට **දිස්ස** යනාදෙශව දකාරස්ථ ඉකාරයට "යද"දීන් අකාරව විභක්තිලොපාදියව "භයදස්සාවී" යනුවේ.

**රොගො**-යන්නතන්හි **රුජ** ධාතුහුකෙරෙන් "විසරුජපදාදිතො ණ"යි **ණ** ප්‍රත්‍යයව ණකාරානුබන්ධප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තය හට "කගා චජානං"යි **ග** කාරයෙක්ව පූර්වවෘද්ධිව **ණ**කාරලොප්ව පැමිණ "රොගො" යනුවේ.

**පාකො**-යනතන්හි **පච** ධාතුහුකෙරෙන් "භාවෙච"යි **ණ** ප්‍රත්‍යයව "අසංයොගන්තස්ස වුද්ධි කාරිතෙ"යි වෘද්ධිව "කගා චජානං"යි **ච**කාරයට **ක** කාරව පැමිණ සිව ඔව "පාකො" යනුවේ.

**සබ්බගො**-යනතන්හි **සබ්බං** යනු උපපදකොට ඇති **ගමු** යන ධාතුහුකෙරෙන් "ක්විච"යි **ක්වි**ප්‍රත්‍යයව "ධාත්වන්තස්ස ලොපො ක්විම්හි"යි ධාත්වන්තමකාරයට ලොප්ව "ක්විලොපොච"යි **ක්වි** ප්‍රත්‍යයටද ලොප්ව විභක්තිලොපාදියව "සබ්බගො" යනුවේ.

**අභිභූ**-යනතන්හි **අභි** පූර්වභූධාතුකෙරෙන් **ක්වි** ප්‍රත්‍යයව ක්විහට ලොප්ව **සිව** ලොප්ව "අභිභූ" යනුවේ.

**බ්‍රහ්මචාරී**-යනතන්හි බ්‍රහ්මං යනු උපපදකොට ඇති චර යන ධාතුහුකෙරෙන් "තස්සීලාදිසු ණීත්වාවීච" යි ණී ප්‍රත්‍යයව ධාතුහුගේ ආදියට ආකාරයෙක් වෘඩිව ණ හට ලෝප්ව ඊකාරශෙෂව පැමිණ සිව් ලොප්ව "බ්‍රහ්මචාරී" යනුවේ.

**ඝොසනො**-යන්තන්හි ඝුස ධාතුහුකෙරෙන් "සද්දකුධචලමණ්ඩත්‍ථ රුචාදීහි යු"යි යු ප්‍රත්‍යයව "අනකායුණ්වූනං"යි යු හට අනව ආදියට "අස්සෙසසුව" යි, වෘඩිව සිව බව "ඝොසනො" යනුවේ. "**වඩ්ඪනො**" යනුද මේසේයි.

**පාරගූ**-යන්තන්හි **පාරං** යනු උපපදකොට ඇති **ගමු** ධාතු කෙරෙන් "පාරාදිගමිම්හාරූ"යි **රූ** ප්‍රත්‍යයව ධාත්වන්තය හා සම්ගූ රකාරයට "රම්හි රන්තොරාදිනො"යි ලොප්ව ඌකාර ශෙෂව විභක්ති ලොපාදියව පැමිණ "පාරගූ" යනුවේ.

**භික්ඛු**-යනතන්හි **භික්ඛ** යන ධාතුහුකෙරෙන් "භික්ඛාදිතොච" යි **රූ** ප්‍රත්‍යයව ධාත්වන්තය හා රකාරය ලොප්ව ඌකාරයට "යද" දීන් හ්‍රස්වව සිව ලොප්ව "භික්ඛු" යනුවේ.

**විඤ්ඤූ**-යනතන්හි **වි** පූර්ව **ඤා** ධාතුහුකෙරෙන් **රූ** ප්‍රත්‍යයව ඤකාරද්විත්වව "විඤ්ඤූ" යනුවේ.

---

**භවිතබ්බං, භවනීයං**-යනතන්හි **භූ** ධාතුහුකෙරෙන් "භාවකම්මෙසු තබ්බානීයා"යි **තබ්බ අනීය** ප්‍රත්‍යයෝව ධාතුහුගේ ඌකාරයට ඔකාරයෙක් වෘඩිව ඔකාරයහට **අව** යනාදෙශව "යථාගමමිකාරෝ"යි ඉකාරයෙක් ආගමව පැමිණ නම්වත්ව සිව අංව "භවිතබ්බං භවනීයං" යනුවේ.

**කත්තබ්බො, කරණීයො**-යනතන්හි **කර** ධාතුකෙරෙන් **තබ්බ අනීය** යන ප්‍රත්‍යයෝව **තබ්බ** ප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්ත රකාරයට "තුංතුන තබ්බෙසුවා"යි තකාරව **අනීය** ප්‍රත්‍යයාගේ නහට "රහාදිතො ණො"යි ණකාරව නම්වත්ව සිව ඔව "කත්තබ්බො කරණීයො" යනුවේ.

**දඨබ්බං**-යනතන්හි **දිස** යන ධාතුහුකෙරෙන් **තබ්බ** ප්‍රත්‍යයව "සාසදිසතො තස්ස රිට්ඨොච"යි චග්‍රහණයෙන් ප්‍රත්‍යයාසම්බන්ධිවූ **ත** හට **රිට්ඨ** යනාදෙශව එහි රකාරයත් සමග ධාත්වන්තයට ලොප්ව දකාරයෙහි ඉකාරයටද ලොප්ව සිව අංව "පස්සිතබ්බං" යන අර්ථයෙහි "දට්ඨබ්බං"යනුවේ.

**කාරියං**-යනතන්හි **කර** ධාතුහුකෙරෙන් "ණ්‍යාච"යි ණ්‍ය ප්‍රත්‍යයව ණකාරලොප්ව ය ශෙෂව පූර්වයට වෘද්ධිව ඉකාරාගමව සිව අංව "කරණං කත්තබ්බං" යන අර්ථයෙහි "කාරියං" යනුවේ.

**ඤෙය්‍යං**-යනතන්හි ඤා ධාතුකෙරෙන් "ණ්‍යාච"යි චග්‍රහණයෙන් ණෙය්‍ය ප්‍රත්‍යයව සිව අංව "ඤාතබ්බං" යන අර්ථයෙහි "ඤෙය්‍යං" යනුවේ.

**වජ්ජං**-යනතන්හි **වද** ධාතුකෙරෙන් ණ්‍ය ප්‍රත්‍යයව ණකාර ලොප්ව යකාරසහිත ධාත්වන්තයට "වදමද"යනාදීන් ජ්ජ යනාදෙශව් සිව අංව "අවජ්ජිත් වජ්ජති වජ්ජිස්සති" යන අර්ථයෙහි "වජ්ජං" යනුවේ.

**ගාරය්හං**-යනතන්හි **ගරහ** ධාතුකෙරෙන් ණ්‍ය ප්‍රත්‍යයව ණකාරලොප්ව ධාත්වන්තයසහිත ය හට "වදමද" යනාදීන් ය්හ යනාදෙශව එම සූත්‍රයෙන් **ගරහ** ධාතුහට **ගාර** යනාදෙශව සිව අංව "ගරහිතබ්බං" යන අර්ථයෙහි "ගාරය්හං" යනුවේ.

**පෙය්‍යං**-යනතන්හි **පා** ධාතුකෙරෙන් ණ්‍ය ප්‍රත්‍යයව ණ්‍යහට එය්‍ය යනාදෙශව සිව අංව "පාතබ්බං" යන අර්ථයෙහි "පෙය්‍යං" යනුවේ.

**කිච්චං**-යනතන්හි **කර** ධාතුහුකෙරෙන් "කරම්හා රිච්චො"යි රිච්ච ප්‍රත්‍යයව එහි රකාරයට හා ධාත්වන්ත රකාරයටද ලොප්ව සිව අංව "කරණීයං" යන අර්ථයෙහි "කිච්චං" යනුවේ.

---

**ගහණං**-යනතන්හි **ගහ** ධාතුකෙරෙන් "නන්දාදීහියු"යි යු ප්‍රත්‍යයව යුහට අන ව නහට "රහා" දීන් ණකාරව සිව අංව "ගය්හතෙ ගහණීයං" යන අර්ථයෙහි "ගහණං" යනුවේ- "ඤායතෙ ඤාතබ්බං" යන අර්ථයෙහි "ඤාණං" යනුද මෙසේයි.

**රජෝහරණං**-යනතන්හි **රජං** යනු උපපදකොටඇති **හර** ධාතුකෙරෙන් "කත්තුකරණප්පදෙසෙසුච"යි යු ප්‍රත්‍යයව යු හට අන ව න හට ණව විභක්ති ලොප්ව "එතෙසමොලොපෙ"යි රජ යන්නේ අන්තයට ඔකාරව පැමිණ සිව අංව "රජෝහරණං" යනුවේ.

**පහරණං**-යනතන්හි ප පූර්ව **හර** ධාතුකෙරෙන් "කත්තු" ආදීන් යුව යුහට අනව නහට ණව සිව අංව "පහරණං" යනුවේ.

**ආසනං**-යනතන්හි **ආස** ධාතුකෙරෙන් "කත්තු" ආදීන් යුව යුහට අනව සිව අංව "ආසනං" යනුවේ- සං පූර්ව ද ධාතුකෙරෙන් යු ප්‍රත්‍යයව "සම්පදානං" යනුද අප ආ පූර්ව ද ධාතුකෙරෙන් යු ප්‍රත්‍යයව "අපාදානං" යනුද මෙසේයි.

**ආදි**-යනතන්හි **ආ පූර්ව ද** ධාතුහෙරෙන් **"සඤ්ඤායං දධාතො ඉ"** යන සූත්‍රයෙන් **ඉ** ප්‍රත්‍යයව, පැමිණ සිව ලොප්ව **"ආදි"** යනුවේ.

**උදධි**-යනතන්හි **උදකං** යනු පූර්වකොට ඇති **ධා** ධාතුකෙරෙන් **ඉ** ප්‍රත්‍යයව විභක්තිලොප්ව **උදක** යන්නේ කකාරයටද "යද" දීන් ලොප්ව සිව ලොප්ව "උදධි" යනුවේ.

**ජරා**-යනතන්හි **ජර** ධාතුකෙරෙන් "ඉත්ථියමතියුවොවා" සි **අ** ප්‍රත්‍යයව පැමිණ නැවත "ඉත්ථියමතො ආපපච්චයො"සි **ආ** ප්‍රත්‍යයවපූර්වස්වරලොප්ව පැමිණ සිව ලොප්ව "ජරා" යනුවේ.

**මති**-යනතන්හි **මන** ධාතුකෙරෙන් "ඉත්ථිය මතියවොවා"සි **ති** ප්‍රත්‍යයව "ගමඛනහනරමාදීනමන්තො"සි ධාත්වන්ත **න** හට ලොප්ව සිව ලොප්ව "මඤ්ඤතං මන්තබ්බං" යන අර්ථයෙහි "මති" යනුවේ.

**චෙතනා**-යනතන්හි **චිති** යන ධාතුහුකෙරෙන් "ඉත්ථියමතිය වොවා"සි **යු** ප්‍රත්‍යයව ධාත්වන්තයට ලොප්ව **යු** හට **අන** ව පූර්වයට "අසෙඤ්ඤසුව"සි එකාරයෙක් වෘද්ධිව පැමිණ නැවත "ඉත්ථියමතො" යනාදීන් ආ ප්‍රත්‍යයව සිව ලොප්ව "චෙතනා" යනුවේ.

**ඊසක්කරං**-යනතන්හි **ඊසං** යනු උපපදකොට ඇති **කර** ධාතුකෙරෙන් "ඊසද්දුස්සුහිඛ"සි **ඛ** ප්‍රත්‍යයව **ඛ** හට "යද" දීන් ලොප්ව **ඊසං** යන්නේ නිග්ගහීතයටද "තෙසු" යනාදීන් ලොප්ව කකාර ද්විත්වව සිව අංව "ඊසක්කරං" යනුවේ. "දුක්කරං සුකරං" යනුද මෙසේයි.

**සමථො**-යනතන්හි **සමු** ධාතුකෙරෙන් "සමාදිහි ථමා"සි **ථ** ප්‍රත්‍යයව ධාත්වන්ත උකාරයට "යද" දීන් අකාරව **සිව** ඔව "සමථො" යනුවේ.

**ගිම්හො**-යනතන්හි **ගි** ධාතුකෙරෙන්"සමා"දීන් ම ප්‍රත්‍යයව සිව ඔව "ගිම්හො"යනුවේ.

**ඊදිසො**-යනතන්හි **ඉම** සද්දපද **දුස** යන ධාතුකෙරෙන් **ක්වි** ප්‍රත්‍යයව **ඉම** ශබ්දයාට නිපාතනයෙන් ඉකාරයෙක්වේ, ක්විප්‍රත්‍යයා පර නිමිත්තෙන් ධාත්වන්තයට ලොප් පැමිණිකල්හි "ඉය=පෙ=සක්කිව"සි ඉකාරයට ඊකාරව ධාතුසම්බන්ධ උකාරයට ඉකාරයෙක් ගුණව ධාත්වන්තයට සකාරව සිව ඔව"ඊදිසො" යනුවේ. **ය ත** ශබ්දයන්කෙරෙන් **දුස** ධාතුව දීර්ඝාදියව **"යාදිසො තාදිසො"** යනුවේ.

**මාදිසො, කිදිසො, එදිසො, සාදිසො**-යනාදීන්හිද පෙරසේම නිපාතනයෙන් "අම්හ කිං එත සමාන" යනමොවුන්ට **මකිඑස** යන මේ ආදෙශයෝව "ඉයත" යනාදීන් දීඝී ගුණාදියව සිඩයි. දීඝීනොවීමෙන් **"සදිසො"** යනුදවේ. ධාතුහුගේ දකාරයට මේසූත්‍රයෙන්ව රකාර කළතන්හි **"ඊරිසො"** යනාදියවේ. ධාත්වන්තයට මේ සූත්‍රයෙන් **ඉක්ඛ** යනාදෙශකළ කල්හි **"ඊදික්ඛො"** යනාදියවේ. ධාත්වන්තයට **ඊකාරය කළ** කල්හි **"ඊදී"** යනාදියවේ.

---

**හුතො හුතවා හුතාවී**-යනතන්හි හු ධාතුකෙරෙන් "අතීතෙ තතවන්තුතාවී" යන සූත්‍රයෙන් **ත තවන්තු තාවී** ප්‍රත්‍යයෝව ධාතුසම්බන්ධ ඌකාරයට හ්‍රස්වව නම්වත්ව පසෙක්හි සිව ඔව "හුතො" යනුද, පසෙක්හි විභක්ති සහිත **න්තු**හට "ආසිම්හි" හි ආකාරව "හුතවා" යනුද පසෙක්හි සිහට ලොප්ව "හුතාවී" යනුදවේ.

**භුත්තො භුත්තවා භුත්තාවී**-යන තන්හි **භුජ** ධාතුහු කෙරෙන් **ත**ප්‍රත්‍යයාදීන් පරකල්හි "භුජාදීනමන්තො නොච්ච" යනසූත්‍රයෙන් ධාත්වන්තයට ලොප්හා පරවූ තකාරයට ද්විත්වව "භුත්තො භුත්තවා භුත්තාවී" යනුවේ.

**ජාතො**-යනතන්හි **ජන** ධාතුකෙරෙන් **ත** ප්‍රත්‍යයව "ජනාදීනමා තිම්හිච" යි ධාත්වන්තයට ආකාරව පැමිණ සිව ඔව "ජාතො" යනුවේ.

**ආරුළ්හො**-යනතන්හි **ආ පූර්ව රුහ** ධාතුකෙරෙන් **ත** ප්‍රත්‍යයව "හාතෙත්ථ හො හස්ස ලො වා අදහනහානං" යි තකාරයට **හ** කාරය හා ධාතුහුගේ හකාරයට ළකාරව බඩව සිව ඔව "ආරුළ්හො" යනුවේ.

**ගීතං**-යනතන්හි **ගෙ** යන ධාතුකෙරෙන් "භාවකම්මෙසු ත" යි **ත** ප්‍රත්‍යයව. "සබ්බත්ථ ගෙගී" යි **ගෙ** ධාතුහට **ගී** යනාදෙශව සිව අංව "ගීතං" යනුවේ.

**කතං**-යනතන්හි **කර** ධාතුකෙරෙන් **ත** ප්‍රත්‍යයව "රකාරො ච" යි ධාත්වන්තයට ලොප්ව සිව අංව "කතං" යනුවේ.

**දුක්කටං**-යනතන්හි **දු** පූර්ව **කර** ධාතුකෙරෙන් **ත** ප්‍රත්‍යයව රකාරලොප්ව "දෙ ධස්සච" යි චග්‍රහණයෙන් **ත**කාරයට ටකාරව කකාර ද්විත්වව "දුක්කටං" යනුවේ.

**බද්ධො**-යනතන්හි බධ ධාතුහුකෙරෙන් **ත** ප්‍රත්‍යයව "ධඪභහෙහි ධඪා ච" යි තකාරයට ධකාරව ධකාරයා පරකල්හි ධාත්වන්තයට "හවතුත්ථානමන්තානං දෙධෙ" යි දකාරව බඩව සිව ඔව "බද්ධො" යනුවේ.

ලද්ධං-යනතන්හි ලභ ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව තහට ධව ධාත්වන්තයට දකාරව සිව අංව "ලද්ධං" යනුවේ.

වුඩ්ඪො-යනතන්හි වඩ්ඪ ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව තහට ඪව "ඪො ඪකාරෙ"යි ධාත්වන්තයට ඩකාරව "යදු" දීන් වකාරයත් අකාරයට උකාරව සිව ඔව "වුඩ්ඪො" යනුවේ.

දඩ්ඪං-යනතන්හි දහ ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව තහට ඪව ධාත්වන්තයට ඩකාරව සිව අංව "දඩ්ඪං" යනුවේ.

දුට්ඨො-යනතන්හි දුස ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව "සාදිසන්ත පුච්ඡභඤ්ජහංසාදීහි ට්ඨො"යි ධාත්වන්තය සමග තහට ට්ඨ යනාදෙශව සිව ඔව "දුට්ඨො" යනුවේ.

භින්නො-යනතන්හි භිද ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව "භිදාදිතො ඉන්නඅන්නඊණා වා"යි ඉන්න යනාදෙශව ධාත්වන්තයට ලොප්ව සිව ඔව "භින්නො" යනුවේ.

බුද්ධො-යනතන්හි බුධ ධාතුකෙරෙන් "බුධගමාදිත්ථෙ කත්තරි"යි ත ප්‍රත්‍යයව තකාරයට ධකාරව ධාතුසම්බන්ධ ධකාරයට දකාරව සිව ඔව "බුද්ධො" යනුවේ.

තිණ්ණො-යනතන්හි තර ධාතුකෙරෙන් ත ප්‍රත්‍යයව "තරාදීහි ඉණ්ණො"යි තහට ඉණ්ණ යනාදෙශව ධාත්වන්තයට ලොප්ව පැමිණ සිව ඔව "තිණ්ණො" යනුවේ.

---

සහමානො-යනතන්හි සහ ධාතුකෙරෙන් "වත්තමානෙ මානන්තා"යි මාන ප්‍රත්‍යයව "භූවාදිතො අ"යි කර්තෘකාරකයෙහි අ විකරණ ප්‍රත්‍යයව සිව ඔව "සහමානො" යනුවේ. සය්හමානො-යනතන්හි සහ ධාතුකෙරෙන් මාන ප්‍රත්‍යයව "භාව කම්මෙසු යො"යි කර්මකාරකයෙහි ය විකරණ ප්‍රත්‍යයව "හවිපරියයො ලො වා"යි හකාරයකාර පෙරළියව සිව ඔව "සය්හමානො" යනුවේ.

භූයමානං-යනතන්හි භූ ධාතුකෙරෙන් මාන ප්‍රත්‍යයව භාවයෙහි ය විකරණව සිව අංව "භූයමානං" යනුවේ

ගච්ඡං-යනතන්හි ගමු ධාතුකෙරෙන් "වත්තමානෙ මානන්තා"යි අන්ත ප්‍රත්‍යයව "ගමිස්සන්තො ච්ඡො වා සබ්බාසු"යි ධාත්වන්ත මකාරයට ච්ඡ යනාදෙශව නම්වත්ව න්ත යන්තාව අංව සිහට ලොප්ව "ගච්ඡං" යනුවේ.

(කම්මං) කරිස්සං කරොන්තො කුරුමානො කරානො-යනතන්හි කම්මං යන කර්ම උපපදකොට ඇතිකල්හි කර ධාතුකෙරෙන් "සෙසෙස්සන්තුමානානා"යි ස්සං න්තු මාන ආන යන ප්‍රත්‍ය

යෝවෙත්, මෙහි පූර්වපක්ෂයෙහි **ස්සං** ප්‍රත්‍යය පරකල්හි "යථානමම් කාරෙ"ති ඉකාරාගමව විකරණ ප්‍රතිෂේධව පැමිණ නිග්ගහීතයා කෙරෙන් සිහට ලොප්ව "කරිස්සං" යනුවේ. ද්විතීය පක්ෂයෙහි **න්තු** ප්‍රත්‍යය පරකල්හි "තනාදිතො ඔයිරා"යි ඔ විකරණ ප්‍රත්‍යයව **සි** ආදියව "කරොන්තො" යනුවේ, තෘතීය පක්ෂයෙහි **මාන** ප්‍රත්‍යය පරකල්හි "උත්තමො කාරෙච"යි ඔකාරයට උකාරව "කරස්ස කාරෙච"යි ධාතුහුගේ **කකාරයේ** අකාරයට උකාරව සිව ඔවු "කුරුමානො" යනුවේ, චතුර්ථපක්ෂයෙහි **ආන** ප්‍රත්‍යයපරකල්හි විකරණ ලොප්ව පැමිණ සිව ඔව "කරානො" යනුවේ.

**අකාරො**–යනතන්හි අක්ෂරවාචී **අ** යන්න කෙරෙන් "අක්ඛරෙහි කාරං"යි ස්වාර්ථයෙහි **කාර** ප්‍රත්‍යයව සිව ඔව "අකාරො" යනුවේ. "කකාරො, රකාරො" යනුද මෙසේයි.

**ගමි**–යනතන්හි **ගමු** ධාතුකෙරෙන් යදාදීන් ස්වාර්ථයෙහි **ඉ** ප්‍රත්‍යයව සිහට ලොප්ව "ගමි" යනුවේ.

**කාරෙති**–යනතන්හි **කර** ධාතුකෙරෙන් "යදා" දීන් ස්වාර්ථයෙහි **ති** ප්‍රත්‍යයව විකරණ **ඔ** ප්‍රත්‍යයව **සි**හට ලොප්ව "කාරෙති" යනුවේ.

———

**කාතවෙ (ඉච්ඡති) කාතුං (ඉච්ඡති)**–යනතන්හි **කර** ධාතු කෙරෙන් "ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙතුංවා"යි **තවෙ තුං** ප්‍රත්‍යයෝව "තවෙතුනාදිසු කා"යි **කර** ධාතුහට **කා** යනාදෙශව **තවෙ** ප්‍රත්‍යයාදිහු නිපාත බැවින් විභක්ති ලොප්ව "කාතවෙ (ඉච්ඡති) කාතුං (ඉච්ඡති)" යනුවේ.

**දට්ඨුං**–යනතන්හි **දිස** ධාතු කෙරෙන් **තුං** ප්‍රත්‍යයව "සාස" යනාදි සූත්‍රයෙහි චකාරයෙන් **තුං** ප්‍රත්‍යයට **රට්ඨුං** යනාදෙශව "රමහි" යනාදීන් ධාත්වන්තය සහිත රකාරයට ලොප්ව පූර්වයටත් ලොප්ව පැමිණ "රට්ඨුං" යනුවේ.

**නිජ්ඣිතුං (අරහති)**–යනතන්හි **නිජ්ඣ** ධාතු කෙරෙන් අරහාද්‍යර්ථයෙහි "අරහසක්කාදිසු ච"යි **තුං** ප්‍රත්‍යයව ඉකාරාගමව "නිජ්ඣිතුං (අරහති") යනුවේ.

**කාතුන (ගච්ඡති) කත්වාන (ගච්ඡති) කත්වා (ගච්ඡති)**—යනතන්හි **කර** ධාතු කෙරෙන් "පුබ්බකාලෙකකත්තුකා තුනත්වානත්වාවා"යි **තුන ත්වාන ත්වා** යන ප්‍රත්‍යයෝව "තවෙතුනාදිසු කා"යි **කර** ධාතුහට **කා** යනාදෙශව සංයොගයට පූර්වයන්හි හ්‍රස්වව නිපාත බැවින් විභක්ති ලොප්ව "කාතුන (ගච්ඡති) කත්වාන (ගච්ඡති) කත්වා (ගච්ඡති)" යනුවේ.

**දිස්වා**–යනතන්හි **දිස** ධාතු කෙරෙන් **තූන** ප්‍රත්‍යයව "දිසා ස්වානස්වාන්ත ලොපො ච"යි **තූන** යන්නට **ස්වා** යනාදෙශ හා ධාත්වන්තයට ලොප්ව "දිස්වා" යනුවේ.

**සජ්ජිත්වා**-යනතන්හි **සද** ධාතුකෙරෙන් **ත්වා** ප්‍රත්‍යයව ධාත්වන්තයට ලොප්ව "දධාන්තතො යො ක්වචි"යි යකාරාගමව යකාර දකාරයෙහි සංහිතව "සව්ජ්ජා", යනාදීන් යකාරසහිත දකාරයට ජකාරව විත්වා ඉකාරාගමව "සජ්ජිත්වා" යනුවේ.

**බුජ්ඣිත්වා**-යනතන්හි **බුධ** ධාතුකෙරෙන් **ත්වා** ප්‍රත්‍යයව ධාත්වන්තයට ලොප්ව යකාරාගමත් ධකාරයකාර සංහිතව "යථා කත්තරි ච"යි යකාරසහිත ධකාරයට ඣකාරව "වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා"යි විත්වා ඉකාරාගමව "බුජ්ඣිත්වා" යනුවේ.

**කරිය**-යනතන්හි **කර** ධාතුකෙරෙන් **තූන** ප්‍රත්‍යයව **තූන** යන්නට "සබ්බෙහි තූනාදීනං යො"යි යකාරව ඉකාරාගමව "කරිය" යනුවේ.

**කාතූන**-යනතන්හි **කර** ධාතුකෙරෙන් **තූන**ව "තුං තූන තබ්බෙසු වා" යි ධාත්වන්තයට තාකාරව "කාතූන"යනුවේ.

**උද්දිස්ස**-යනතන්හි **උපපූර්ව දිස** ධාතුකෙරෙන් **ත්වා** ප්‍රත්‍යයව ධාත්වන්තයට ලොප්ව "සබ්බෙහි තූනාදීනං යො"යි **ත්වා** හට යකාරව යකාරයට පූර්වරූපව දකාර විත්වා "උද්දිස්ස" යනුවේ.

**දළ්හගාහං ගණ්හාති**-යනතන්හි **දළ්හං** යන විභක්ත්‍යන්තයා උප පදකොට ඇති **ගහ** ධාතුකෙරෙන් "යදාදීන්" **ණං** ප්‍රත්‍යයව **ණ**කාර ලොප්ව **අං** ශෙෂව පූර්වයට වෘද්ධිව විභක්තිලොප්ව "දළ්හගාහං"යි වේ, ඔහුකෙරෙන් **ගහ** ධාතු අනුප්‍රයොගව **ති** ආදියව "දළ්හගාහං ගණ්හාති" යනුවේ.

**එකක්ඛත්තුං**-යනතන්හි "එකස්මිං වාරෙ"යන වාක්‍යයෙහි **එක** ශබ්දයාකෙරෙන් "එකාදිතො සකිස්ස ක්ඛත්තුං"යි **ක්ඛත්තුං** ප්‍රත්‍යයව වාක්‍ය අප්‍රයොගාදියව "**එකක්ඛත්තුං**" යනුවේ. "ද්විසු වාරෙසු ද්වෙ වාරෙ වා" යන වාක්‍යයෙහි හා "තිසු වාරෙසු තිණ්ණි වාරානි වා" යන වාක්‍යයෙහි **ද්වි ති** ශබ්දයන්කෙරෙන් පරව **ක්ඛත්තුං** ප්‍රත්‍යයව "**ද්වික්ඛත්තුං තික්ඛත්තුං**" යනුවේ. විභක්ති ලොප්නොකළකල්හි "**තිණ්ණක්ඛත්තුං**" යනුවේ.

**කිතකපදසිද්ධි නිමි.**

---

"තද්ධිත සමාස කිතකා නාමංවාතවෙතූනාදිසු ච" යන සූත්‍රයෙහි "කිතකා" යනු "කිත්එව කිතකො" යි වාක්‍යය ගෙණ **කිත්** ශබ්දයා කෙරෙන් **නිපාතන**යෙන් ස්වාර්ථයෙහි **ක** ප්‍රත්‍යව පැමිණ සිද්ධවූයේ **කිත්** සංඥවම **කිතක** නම්වේ. සෙසු ශබ්ද ඇතිනමුත් ක්‍රියාපදයන් බොහෝ ඇති වනයට කිරිවනය නම් වූවාසේ මෙහිද කිත්සංඥාව බොහෝ සෙයින් **කිතක** ව්‍යවහාරය වි.

---

බාලාවතාරයෙහි සංඥාසන්ධිවිභක්ත්‍යාදිය ප්‍රකාශකොට ඉක්බිති උක්තානුක්ත විභක්තිභේදයන් දක්වන්නාහු "ඡකාරකානි" යනාදිය කීහු, එහිත් විභක්තිභේදයවූ කලී බොහෝගන්හි සවිස්තරබැවින් මෙහි උක්තානුක්ත භේදය සම්බන්ධ ග්‍රන්ථාර්ථාන ස්වල්පයක් පමණක් සැකෙවින් දක්වනුලැබේ.

එහි ප්‍රථමකොට "කාරක" ශබ්දයාගේ නිර්වචන යුක්ති දක්වන්නාහු "කරෝති කිරියං නිප්ඵාදේතීති කාරකං"යි ප්‍රකාශකළෝ, මෙහි "කාරක" යන්න "සබ්බතො ණ්වුත්වාවී වා" යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි ණ්වු ප්‍රත්‍යයව නිෂ්පන්න කෘදන්ත නාමයක් නමුත් මෙහිදී ඉන් කරන්නෙක යනාදි අර්ථ මාත්‍රයක් නොව ක්‍රියා නිෂ්පත්ති නිමිත්තාර්ථයක් ප්‍රකාශ බැව් දක්වනු සඳහා "ක්‍රියානිප්ඵත්ති නිමිත්තත්තාය තේනා" යනු කීහු, ක්‍රියාවක් ඇතිවීමට යමක් නිමිති වේනම් ඒ කාරක වේ, හේද–

"කත්තා කම්මඤ්ච කරණං සම්පදානං තථේවච
අපාදානං ච ඔකාසං කාරකං ඡබ්බිධං මතං" යි

කර්තෘකාරකාදිවශයෙන් සවැදෑරුම්යයි කියනලදී. "සො ඔදනං පචති" යන මෙහි "පචති" යන ක්‍රියාහුගේ ඇතිවීමට නිමිතිවූයේ "ඔදනං" යන කර්මය හා "සො" යන කර්තෘයි, යටත්වන ඔදනාදි යමක් හෝ පිසන කෙනෙක් නැත්නම් "පචති" යනාදී ක්‍රියා පරම්පරාවක්ද ඇතිවියනොහැකිවේ. කර්තෘකාරකය වනාහි උක්තව හෝ අනුක්තව සියලුක්‍රියාවන්ගේම නිෂ්පත්තියට නිමිතිවේ. "ඵරසුනා රුක්ඛං ඡින්දති, සමණස්ස චීවරං දදාති, රුක්ඛස්මා පතති වානරො, භික්ඛු නිසීදති ආසනෙ" යන මේතන්හිද "ඵරසුනා" යනාදි කරණ කාරකාදියද "ඡින්දති" යනාදි ක්‍රියාවන්ගේ සිද්ධියට නිමිතිවූබැවින් කාරකවේ. මෙහි "කාරක" ශබ්දය නිමිත්තශබ්දාපේක්ෂාවෙන් නපුංසක ලිඟු වී, එවූකලී කර්තෘකාරකයෙහි නිපත්බැවින් ප්‍රධානවශයෙන් කර්තෘද තදුපචාරවශයෙන් කර්මාදියද ක්‍රියා නිෂ්පත්තියට හෙතු භාවයෙන් "කාරක" යන්නට ඇතුළත්බැව් දක්වනු පිණිස "කාරකසද්දො මුඛ්‍යතො" යනාදියද "කාරක" ශබ්දය පමණක්නොව සකල ශබ්ද ව්‍යවහාරයම ප්‍රධානාප්‍රධානත්වයෙන් පවත්නාබැව් දක්වනු පිණිස "සබ්බා" යනාදියද කීහු.

ඉක්බිති කර්මකාරකාදිය හා සාමාන්‍යාර්ථයද උක්තානුක්ත යන විභෙදයෙන් යෙදෙන පරිදි දක්වන්නාහු "තත්‍ථ උත්තකම්මං" යනාදිය කීහු, කර්මාදි යම් අර්ථයක යම් සමාසයක් හෝ ප්‍රත්‍යයක් කළ කල්හි ඒ සමාසයෙන් හෝ ප්‍රත්‍යයෙන් යමක් කියනුලැබේනම් ඒ උක්ත නම, ඒ උක්තවූ නාමයාගේ අර්ථය ප්‍රකාශ කරණු පිණිස එහි ප්‍රථමා විභක්තියවේ, සමාසයක් හෝ ප්‍රත්‍යයක් වීමෙන් පෙර ඒ සමා

සාදියෙන් ප්‍රකාශවන අර්ථයට නිසි ඒ ඒ වාක්‍යයන්හි සිටි විතීයා තෘතීයාදී විභක්ති අනුක්තාර්ථ-උක්තාර්ථවූතන්හි ප්‍රථමාවම විනා අන්‍ය විභක්තියක් නොවන බැව් දක්වනුපිණිස මෙතැන් පටන් නානා විධ උපමා ප්‍රශ්න විසර්ජන ගෙණහැරදක්වා විස්තරකරන්නාහු "යථා" යනාදීන් ප්‍රකාශකළෝ, එහි-යම්සේ "ඔදනං පචති" යනාදියෙහි "ඔදනං" යි විතීයාව "කම්මත්ථේ දුතියා" යන සූත්‍රයෙන් කර්මාර්ථයෙහිම විහිතබැවින් නැවතු විතීයාව කොට තමන් විසින් ප්‍රකාශකට යුතු අර්ථවිශෙෂයක් නොමැත්තෙන් විතියාව නොවන්නේද, එසේම මෙහිදු "ආගතසමණො" යනාදි සමාසතද්ධිතාඛ්‍යාත කිතකයන් කර්මාර්ථයෙහි කළහෙයින් එයින්ම කර්මයක් හැඟේ, එ බැවින් නැවත කර්මයක් ප්‍රකාශකරණුපිණිස විතියාව උවමනා නොවන්නේයයි දක්වන්නාහු "යථා=පෙ=දුතියාපියා" යනු කීහු.(විතීයාව උවමනානොවේනම් ප්‍රථමාව් කෙසේ උවමනාවේදයත්) විභක්තියක් නොමැතිව ශබ්දයන් ගේ අර්ථය ප්‍රකටකොට දක්විය නොහැක්කේය, එබැවින් විශෙෂාර්ථයක් නොව අප්‍රකටවූ කර්මාර්ථමාත්‍රයම ප්‍රකටකොට දක්වනු පිණිස ප්‍රථමාව වේයයි දක්වන්නාහු "විභත්තිං=පෙ=හොතෙව" යනු කීහු, පූර්වෝක්ත "ඔදනං පචති" යනාදියෙහි "ඔදනං" යන කර්මය විතියාවෙන් කී පසු මෙපරිද්දෙන්ම ලිඞ්ගාර්ථමාත්‍රය අපෙක්ෂාකොට ප්‍රථමාව කුමක්හෙයින් නොවේදැයි පෘච්ඡා වශයෙන් "කථං=පෙ=නහොතීති චෙ" යනුද, එහි කර්මමාත්‍රය ඒ විතියාවෙන් ප්‍රකටකොට කීකල්හි ඇත්තාවූ ලිඞ්ගාර්ථය ඊට මුවහවූ බැවින් ප්‍රථමාව නොවේයයි ඒ විසඳීම් වශයෙන් "කම්මත්තෙන=පෙ=තිරොභූතත්තා" යනුද ප්‍රකාශකළෝ, (යම්සේ ස්ත්‍රී පුරුෂ කුමාර යනාදී නාම එකම මනුෂ්‍යත්වයට ඇතුළත් නුමුත් ඒස්ත්‍රී පුරුෂාදීන්ට සාමාන්‍යයෙන් මනුෂ්‍යයයි කරණලද ව්‍යවහාරයට වඩා "ස්ත්‍රීපුරුෂ" යනාදීන් ව්‍යවහාර කලකල්හි "මනුෂ්‍ය" යන්නේ විශෙෂාර්ථයප්‍රකටවන්නේද, එමෙන් මූල් අවයවාර්ථය ලිඞ්ගාර්ථය වුවත් එය සියල්ලට සාමාන්‍ය බැවින් යම්කලෙක්හි යමකින් කර්මාදි විශෙෂාර්ථයක් ප්‍රකාශවේද එකල්හි එය ඊටවඩා ප්‍රකටවීමෙන් ලිඞ්ගාර්ථය අප්‍රකටවේ, එබැවින් මෙහිද කර්මාර්ථ විතීයාදිය ප්‍රකටවීමෙන් ලිඞ්ගාර්ථ ප්‍රථමාව අප්‍රකටවේ)–ආඛ්‍යාතයෙන් දක්වනලද්ද සියල්ලට සාධාරණව තිබියදීත් පූර්වෝක්ත "ඔදනො පච්චතෙ" යනතන්හි "පච්චතෙ" යි එක වචනවූයේ "ඔදනො" යන විශෙෂ්‍යයෙහි සිටි එකවචනය ඇසුරු කොටයයි දක්වනු පිණිස "ඔදනොපච්චතෙ" යනාදිය කීහු, (මෙයින් උක්තවචනය බලා ක්‍රියාව යෙදේයයි කියත්)– "ඔදනො පච්චතෙ" යනතන්හි විශෙෂ ගතවූ කර්මාර්ථය ඇසුරුකොට "ඔදනං" යි විතියානු වූයේ කුමක්හෙයින්දයත් ශබ්දාර්ථප්‍රවෘත්තිහුගේ ශක්තිස්වභාවහෙයින්

(යප්‍රත්‍යයසහිත)යො යන විභක්ත්‍යන්තයෙන්ම ඒකකර්මජය හැඟෙන බැවින් යයි දක්වනු පිණිස "යථෙජවං=පෙ=ගම්‍යතෙ" යනු කීහු. (යො විභක්තිය කර්මකාරකයෙහි කළබැවින් ඒ ප්‍රත්‍යයාර්ථ ශක්තියෙන්ම කර්මය හැඟේයයි සේයි)හොදයි,මෙතන්හි මෙසේ විනිශ්චය වීය නොහැකිනම් "ආනන්‍දසවණ්ණං විහාරං පස්ස" යනතන්හි කෙසේ විනිශ්චය විදයත් "ආගමන ක්‍රියාවට කර්මවූ අවස්ථාව සමාසයෙන් උක්තවිය, පසුව "පස්ස" යන කර්තෘකාරක දර්ශනක්‍රියායොගයෙහි අනුක්ත කර්මාවස්ථාව ප්‍රකාශකරන්නුවස් විනිශ්චය වියයි දක්වනුලණිස "කථමාගත=පෙ=දුතියායි යා" යනු කීහු. අන්‍යවූ කර්තෘකාරකාදියෙහිද උක්තාර්ථ ගා විභක්තිවච නයෙදීමද මේ ක්‍රමයෙන්ම දතයුතු.

ද්විකර්මකධාතූන්ගේ යොගයෙහි උක්තකර්මය යෙදෙන පරිදි දක්වනු සඳහා "අප්පධානං"යනාදි ගය හා ද්විකර්මකධාතු මේ මේයයි දක්වනුපිණිස"දුහ"යනාදි ගාථද ප්‍රකාශකළෝ. එහි-"දුහ"යනාදි ධාතූන්ගේ කර්මකාරකක්‍රියා යොගයෙහි යෙදෙන කර්මදෙකෙන් අප්‍රධාන කර්මය හා "නී"ආදි * ධාතූන්ගේ කර්මකාරකක්‍රියා යොගයෙහි ප්‍රධාන කර්මයද උක්තකර්මයයි කියනුලැබේ. මෙහි ප්‍රයොජනාධිකයෙන් අභිමතවූයේ (කැමතිවනලද්දේ) ප්‍රධානයි, එයින් අන්‍යවූයේ අප්‍රධානයි, එහි පිළිවෙළින් උදාහරණ දක්වනුලැබේ.

**දුහ** – ගොපාලෙන **ගො** ඛීරං දුය්හතෙ, දුද්ධා වා.
**යාච** – යාචකෙන **ධනි** ධනං යාචීයතෙ, යාචිතො වා.
**රුධි** – ගොපාලෙන **වජො** ගාවං රුජ්ඣතෙ, රුද්ධො වා.

---

* මෙහි දුහාදී ධාතුගණයෙහි ආදි ශබ්දයෙන් "දණ්ඩ" ආදී ධාතු හා "නී" ආදී ධාතුගණයෙහි ආදි ශබ්දයෙන් "කඩ්ඪ" යනාදි ධාතුද ගතයුතුයි, මුඛමත්තදීපනියෙහි ද්විකර්මකධාතු දක්වීම පිණිස

"යාචාදූපි දුහ චි ප්‍රච්ඡ රුධි බ්‍රූ ශාස ජි නී වහඃ
හෘ දණ්ඩි ග්‍රහ කෘෂ් මන්‍ථ් මුෂ් පචාද්‍යා ධවෙ, වනිධාඃ' සී

ප්‍රකාශකළෝ-මෙහි ටීකාවෙහි "යාච අපි නාථ මිශි වා" යනාදි යාචාදූපි ධාතුද "දුහ" ධාතුවෙහි පටන් "පච"ඊන් කෙළවරකොට ඇති ධාතුද ද්විකර්මක ධාතුයයි දක්වා "බ්‍රූ"යන්නෙන් "ගද කථ ශන්ස" යනාදි බැවීම් ධාතුද පචාදියට "පච වච වප වද වල පත නද හස චර ගහ දෙව මද සප සෙව මෙථ" යනාදියද ඇතුළත් කළෝ, මෙහි "අපි මෘශි වා ප්‍රච්ඡ රුධි ශාස හෘ ග්‍රහ කෘෂ් මුෂ් ශන්ස හස ඍණු"යනමේ ධාතු වෙනුවට පාලියෙහි "අහි මගි වර පුච්ඡ රුධි සාසු හර ගහ කඩ්ඪ මුස සංස හස ඛිප" යනාමේ ධාතු පිළිවෙළින් ගතයුතුයි, ඉතිරිවා පාලිසංස්කෘත දෙකෙහි සමබැව් සැලකියයුතුයි.

පුච්ඡ – සිස්සෙන   ගරු ධම්මං පුච්ඡීයතෙ, පුට්ඨො වා.
භික්ඛ – විප්පෙන   ජනො තණ්ඩුලං භික්ඛීයතෙ, භික්ඛිතො වා.
සාසු – ආචරියෙන   සිස්සො ධම්මං අනුසාසීයතෙ, අනුසිට්ඨො වා.
වච – පණ්ඩිතෙන   ජනො කථානකං උච්චතෙ, වුත්තො වා.
දණ්ඩ – රඤ්ඤා   ගාමො සහස්සං දණ්ඩීයතෙ, දණ්ඩිතො වා.
නී – දාසෙන   භාරො ගාමං නීයතෙ, නීතො වා.
වහ – දාසෙන   භාරො ගාමං වුය්හතෙ, වුළ්හො වා.
හර – දාසෙන   භාරො ගාමං හරීයතෙ, හටො වා.
කඩ්ඪ – ව්‍යාධෙන   මිගො ගාමං ආකඩ්ඪීයතෙ, ආකඩ්ඪිතො වා.

සලිදු ගමනාර්ථ ධාත්වාදීන්ගේ යොගයෙහි කාරිතප්‍රත්‍යය විෂයවූ තන්හි උක්තකර්ම්ය සෙද්දෙන පරිදි දක්වනුපිණිස "ගතිබොධාහාර" යනාදි ගය කීහු. එහි-ගමනාර්ථධාතු බොධාර්ථධාතු භොජනාර්ථධාතු ශබ්දාර්ථධාතු හරධාතු කරධාතු අකර්මකධාතු යන මොවුන්ගේ යොගයෙහි කාරිතප්‍රත්‍යය නැතිකල්හි යමක් කර්තෘ නම් කාරිත ප්‍රත්‍යයවූ කල්හි ඒ උක්ත කර්ම්ය වේයයි කියනු ලැබේ. එහි උදාහරණ පිළිවෙළින් දක්වනු ලැබේ.

### අකාරිත විෂය

ගමනාර්ථ ධාතු – දාසො ගාමං ගච්ඡති
බොධාර්ථ ,, – සිස්සො ධම්මං බුජ්ඣති
අශනාර්ථ ,, – භික්ඛු භත්තං භුඤ්ජති
ශබ්දාර්ථ ,, – සිස්සො පාළිං පඨති
හර ,, – දාසො භාරං හරති
කර ,, – ජනො පුඤ්ඤං කරොති
අකර්මක ,, – හත්ථි සයති

### කාරිත විෂය

සාමිනා **දාසො** ගාමං ගච්ඡාපීයතෙ, ගච්ඡාපිතො වා.
ගරුනා **සිස්සො** ධම්මං බොධාපීයතෙ, බොධාපිතො වා.
උපාසකෙන **භික්ඛු** භත්තං භොජාපීයතෙ, භොජාපිතො වා.
උපජ්ඣායෙන **සිස්සො** පාළිං පාඨාපීයතෙ, පාඨාපිතො වා.
සාමිනා **දාසො** භාරං හරාපීයතෙ, හරාපිතො වා.
මුනිනා **ජනො** පුඤ්ඤං කාරාපීයතෙ, කාරාපිතො වා.
හත්ථාරොහෙන **හත්ථි** සයාපීයතෙ, සයාපිතො වා.

ඉක්බිති ප්‍රධානාප්‍රධාන ක්‍රියාවූයෙත් ප්‍රධාන ක්‍රියාහුගේ අපෙක්ෂා වෙන්ම කර්ම්ය යෙදෙනාවැයි දක්වනුපිණිස "යස්ස" යනාදි ගය කීහු. එහි-ප්‍රධාන ක්‍රියාසම්බන්ධයෙන් (ප්‍රධාන ක්‍රියාහුගේ අපෙක්ෂාවෙන්)

කර්මයාගේ උක්තභාවයද, අප්‍රධාන ක්‍රියාහුගේ අපෙක්ෂාවෙන් ඒ කර්මයා ගේම අනුක්තභාවයද යන දෙකම වියහැකිනමුත් ප්‍රධානක්‍රියාව බලා උක්තභාවයමුත් අප්‍රධානක්‍රියාව බලා අනුක්තබව නොවේයයි කියනු ලැබේ, ඊටඋදාහරණ දක්වන්නාහු "බ්‍රාහ්මණෙන ඔදනො පචිත්වා භු ඤ්ජතෙ භුතෙතා වා"යනු කීහු, මෙහි කර්මකාරකයෙහි සිද්ධ"භුඤ්ජතෙ" යන ආඛ්‍යාත ක්‍රියාව හා "භුතෙතා"යන කෘදන්ත ක්‍රියාවද ප්‍රධානවේ, "පචිත්වා" යන කෘදන්ත කර්තෘකාරක පූර්වක්‍රියාම වනාහි අප්‍රධානවේ, එහි "පධානප්පධානානං පධානෙ එව කාරියප්පසිද්ධි" යනු න්‍යාය හේයින් ප්‍රධාන ක්‍රියාපෙක්ෂාවෙන් "ඔදනො"යි උක්තකර්මය වේ, අප්‍රධාන ක්‍රියාපෙක්ෂාවෙන් "ඔදනං"යි අනුක්ත නොවේ, ("පචිත්වා"යන්නු කුමක්හෙයින් අප්‍රධානදයත් "භුඤ්ජතෙ" යන්නට විශෙෂණ වන බැවිනි). ඒ විශෙෂණ වන පරිදි දක්වනු පිණිස "භික්ඛිත්වා=පෙ=විසෙසණං" යනුකීහු, එහි–"භුඤ්ජතෙ" යන භොජන ක්‍රියාව වූකලී සිඟාගෙණ හෝ මිලදීගෙණ හෝ තවත් අන් නොයෙක් ආකාරවලින් හෝ කළහැකි බැවින් "භික්ඛිත්වා" යනාදි බොහෝ ක්‍රියාවන්ට සාධාරණ වේ, එසේ බොහෝ ක්‍රියාවන්ට සාධාරණවූ "භුඤ්ජතෙ" යන්නා පචිත්වා"යන්න විසින් "භික්ඛිත්වා කිණිත්වා" යනාදීන් කෙරෙන් වෙන් කරගත් බැවින් "පචිත්වා" යනු විශෙෂණයයි කියනුලැබේ. තවත් "පචිත්වාදනං" යනාදින් පචනයකොට දීම හෝ ගැණීම හෝ තවත් අන් යමක් හෝ කළහැකි බැවින් "පචිත්වා" යනුද ඒ "දානගහණ" (දීමගැණීම) යනාදි බොහෝ ක්‍රියාවන්ට සාධාරණවේ, එසේ බොහෝ ක්‍රියාවන්ට සාධාරණවූ "පචිත්වා"යන ක්‍රියාව"භුඤ්ජතෙ"යන භොජන ක්‍රියාවවිසින් "දානගහණ"යනාදී ක්‍රියාවලින් වෙන්කොටගත් බැවින් "පචිත්වා"යන ක්‍රියාවත් විශෙෂ්‍යනොවේදැයි පෘච්ඡාවශයෙන් "තනු=පෙ=විසෙසසං"යනු කීහු, ඊට පිළිතුරුවශයෙන් "සච්චං" යනාදියද කීහු.

ඉක්බිති විශෙෂණ විශෙෂ්‍යන්ගේ ස්වරූප දක්වන්නාහු "යාව පදමයං" යනාදිය කීහු, එහි–යම්බඳුවූ කිසි පදදෙකක් එකිනෙකා සම්බන්ධවූයේ නම් ඒ දෙදෙනාකෙරෙහි විශෙෂණ විශෙෂ්‍යභාවය කැමතිපරිද්දෙන් හැගේ, ඒදෙක අතුරෙහිද යමක් හෙතුකොට ගෙණ අනිකේ වෙනසක් ඇතැයියන බුද්ධියක්ඇතිවේනම් ඒ හෙතුවූ වස්තුව විශෙෂණවේ, ඒ විශෙෂණයද ජාතිවාචක විශෙෂණය ගුණවාචක විශෙෂණය ක්‍රියාවාචක විශෙෂණය ද්‍රව්‍යවාචක විශෙෂණය නාමවාචක විශෙෂණයයි නොයෙක් ප්‍රභෙදවේ, මේ ජාත්‍යාදි පචකයෙහිද උදාහරණ දක්වනු පිණිස "යථා ගොධවලො" යනාදිය කීහු, එහි පිළිවෙළින් "ගො(ජාති,)ගො ධවලො, ගො ගච්ඡති, ගො විසාණී, ගොදෙව

දත්තකො"යි යොග්‍යවේ, මෙහි "ගොජාති" යයි කීකල අන්‍ය ගො පදාර්ථයක් නොව ජාතිවාචකවූ ගොපදාර්ථයයි "ජාති" ශබ්දයෙන් "ගො" ශබ්දයාගේ වෙනසෙහි බුද්ධිය හඟවනලද බැවින් "ජාති" යනු "ගො" යන්නට විශෙෂණවේ, "ගොධවලො" කීකල රක්තාදි අන්‍ය ගොපදාර්ථ යක්නොව ධවලවර්ණවූ ගොපදාර්ථයයි "ධවල" යන ගුණයෙන් "ගො" යන්නේ වෙනසෙහි බුද්ධිය හඟවනලද බැවින් "ධවලො" යන ගුණය "ගො" යන්නට විශෙෂණවේ, මෙසේම "ගච්ඡති" යන ක්‍රියාවෙන්ද "විසාණී" යන ද්‍රව්‍යයෙන්ද "දෙවදත්තකො" යන නාමයෙන්ද "ගො" යන්න වෙන්කරගන්නාලද බැවින් "ගච්ඡති" යනාදිය "ගො" යන් නට විශෙෂණවේ, මේ තුල්‍යාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයි. මේ "ජාති" ශබ්දාදිය විශෙෂණවා පමණක්නොව විශෙෂ්‍යදවේ, එනම්-සියල් ලටම සාමාන්‍යවූ ජාතිගුණාදිය තම තමන් පිළිබඳ ආශ්‍රයන් කරණ කොටගෙණ "ගො" පදාර්ථයෙන් වෙන්කරනන්නාලද බැවින් "ගො" ශබ්දය විශෙෂණ හා ජාත්‍යාදිය විශෙෂ්‍යද වේ, "ගාවස්ස ජාති, ගාවස්ස ගමනං" යනාදිය ඊට උදාහරණයි: මෙහි "ජාති" යන්න බොහෝ දෙනෙකුට සාධාරණ නුමූත් මෙතන්හි ගවයාගේ ජාතියයි "ගො" ශබ්දයෙන් "ජාති" යන්න වෙන්කරගත් බැවින් "ගාවස්ස" යනු විශෙෂ්‍ය හා "ජාති" යනු විශෙෂණද වේ, සෙස්සද මෙසේයි, මේ භින්නාධිකරණ විශෙෂණ විශෙෂ්‍යයි—පර්‍ය්‍යාය ශබ්දයාගේ විශෙෂ ණභාවය දක්වනු පිණිස "අථො විසෙසයති" යනාදිය කීහු, කෙසේ දයත්-"ඉෂෞ භූමෞ" යනාදීන් "ගො" ශබ්දය දස අර්ථයෙක්හි වැටෙන බැව් ප්‍රකාශිත හෙයින් "ගො"යි කීකල මෙහි කිනම් අර්ථ යක්දැයි නොහැඟේ, නැවත යම්කලෙක්හි "ගො වාචා"යි පර්‍ය්‍යායවූ "වාචා" ශබ්දය යොජිතවූයේ නම් එකල "ගො" යන්නෙන් අන්‍ය අර්ථයක්නොව වචනාර්ථයම ප්‍රකාශබැව් හැඟේ, එබැවින් අර්ථදශ යකට සාධාරණවූ "ගො" ශබ්දය "වාචා" යන්නෙන් වෙනස් කර ගත්බැවින් ඒ "වාචා" යන පර්‍ය්‍යාය ශබ්දය විශෙෂණවේ-විශෙ ෂණ විශෙෂ්‍ය භෙද දක්වා ඉක්බිති ජාත්‍යාදීන්ගේ ලක්ෂණ දක්වනු සඳහා "තත්‍රසංක ලඛණ්ඩ මුණ්ඩාදි" යනාදිය කීහු. එහි-සියලුම ඛණ්ඩ ය මුණ්ඩය යනාදීවූ විශෙෂයන් අනුවගිය ගොබැව්ආදි සමානාභාවය ජාතියයි කියනුලැබේ, ඛණ්ඩ මුණ්ඩ යනාදිය ගොමහිෂාදීන්ගෙන් භෙ දවූ විශෙෂ කොටස්වේ, ඒ විශෙෂයන්ට සාධාරණ ගොබැව්ආදිය ජාති නම්-ගුණාදීන්ගේලක්ෂණ සුබාවබොධබැවින් නොදක්වමු. තුල්‍යාධික රණ විශෙෂණ විශෙෂ්‍ය භාවයෙහිදී විශෙෂ්‍යයෙහි සිටි ලිඞ්ගවිභක්ති වචන බොහෝසෙයින්ම විශෙෂණයෙහිත් යොජ්‍යබැව් දක්වනු පිණිස "විසෙස්සා"යනාදිය කීහු, එහි "භියො" යනු කීබැවින් විශෙෂ්‍යයෙහි

සිටි ලිඞ්ගවිභක්ති වචනවලින් එකක් හෝ දෙකක් හෝ විශෙෂණයෙහි නෙදීමෙන්ද තුල්‍යාධිකරණ වනබැව් දක්වනුසඳහා "ගුණා පමාණං" යනාදියකීහු. මෙහි "ගුණා"යනු විශෙෂ්‍යයි,"පමාණං"යනු විශෙෂණයි."ගුණා"යනු පුංලිඞ්ග ප්‍රථමා බහුවචනයි, "පමාණං"යනු නපුංසක ලිඞ්ග ප්‍රථමා එකවචනයි, මෙහි විභක්තියෙන් පමණක් සමානාධිකරණවේ. සෙස්සද මෙසේයි.

---

උක්තකර්මභෙදය දක්වා යළිදු අනුක්තකර්මය දක්වන්නාහු "අනුත්ත කම්මං යථා" යනාදිය කීහු.එහි සමාසතද්ධිතයන්ට ස්වකීය සවකීය වාක්‍යයම උදාහරණ කටයුත්තේය(කුමක්හෙයින්දයත් ඒඒ වාක්‍යයන්හි සමාසාදියෙන් කථිත යමක් නැතිබැවිනි) කර්තෘකරණාදියෙහිද එසේයි."සුදෙ ඔදනං පචති"යනු ආඛ්‍යාතයෙන් අනුක්තකර්මයට උදාහරණයි, මෙහි "පචති" යනක්‍රියාව කර්තෘකාරකයෙහි සිඬවූවක් බැවින් එයින් උක්තවූයේ (කියනලද්දේ) කර්තෘවක්වේ. කර්මය වනාහි උක්තනොවේ. "බුඬො ධම්මං දෙසිතවා"යනු කිතකයෙන් අනුක්ත කර්මයට උදාහරණයි, මෙහිද "දෙසිතවා"යන කෘදන්තය කර්තෘකාරකයෙහි "තවන්තු"ප්‍රත්‍යයෙන් නිපන්බැවින් එයින්ද කර්තෘවමුත් කර්මය උක්තනොවේ.

පූර්වෝක්ත ගමනාදි ධාත්වාදීන්ගේ යොගයෙහි කාරිත නැතිතන්හි යමක් කර්තෘ නම් කාරිතවූ කල්හි එය අනුක්තකර්මය හෝ අනුක්ත කර්තෘවේයයි දක්වනු පිණිස "ගතිබුඞ්" යනාදි සූත්‍රය හදළෝ, ඊටද පිළිවෙළින් උදාහරණ දක්වනුලැබේ.

**අකාරිත විෂය**

ග: ධා– දාසො ගාමං ගච්ඡති.
බො:ධා– සිස්සො ධම්මං බුජ්ඣති.
භු: ධා– භික්ඛු භත්තං භුඤ්ජති.
ප: ධා– සිස්සො පාලිං පඨති.
හර– දාසො භාරං හරති.
කර– ජනො පුඤ්ඤං කරොති.
සි– හත්ථි සයති.
නි:සී– භික්ඛු නිසීදති.

**කාරිත විෂය**

සාමි දාසං ගාමං ගමයති, දාසෙන වා.
ගරු සිස්සං ධම්මං බොධාපයති, සිස්සෙන වා.
උපාසකො භික්ඛුං භත්තං භොජාපෙති, භික්ඛුනා වා.
උපජ්ඣායො සිස්සං පාලිං පාඨෙති, සිස්සෙන වා.

සාමි දූසං භාරං හරාපෙති, දූසෙන වා
මුනි ජනං පුඤ්ඤං කාරෙති, ජනෙන වා.
භණ්ඩාරිකො භජ්ජං සායති, භජ්ජිනා වා.
උපාසකො භික්ඛුං නිසීදාපෙති, භික්ඛුනා වා.

(පෙරකියනලද "දුහ" යනාදි ද්විකර්මකධාතුන්ගේ යොගයෙහිද කාරිත ප්‍රත්‍යය නැතිකල්හි යමක් කර්තෘනම් කාරිතවිෂයවූකල්හි එය කර්මවීමෙන් ත්‍රිකර්මකව යෙදේ, "ගොපො දූසං ගාවිං ඛීරං දොහාපෙති" යනාදිය ඊට උදාහරණයි, මෙය කාරිත නුවූකල්හි "දූසො ගාවිං ඛීරං දොහති" යනුවේ. මෙහි "දූසො"යි සිටි කර්තෘව කාරිතවීමෙන් "දූසං"යි කර්මයවිය, සෙස්සද මෙපරිද්දෙන් දතයුතුයි.)

---

මෙසේ අනුක්තකර්මභෙදය දක්වා නැවත සමාසාදියෙන් උක්ත කර්තෘ දක්වනුපිණිස "වුත්තකත්තා" යනාදිය කීහු, එහි "ජිතින්ද්‍රියො මුනි"යනු සමාසයෙන් උක්තකර්තෘවට උදාහරණයි, මේකර්තෘ අර්ථයෙහි කරණලද සමාසයක් බැවින් මින් "මුනි" යන කර්තෘව කථිතවේ, "ආභිධම්මිකො භික්ඛු"යනතන්හි තද්ධිත ණික ප්‍රත්‍යය කර්තෘ අර්ථයෙහි කරණලද්දක් බැවින් ඉන් "භික්ඛු" යන කර්තෘව උක්තවේ, සෙස්සද මෙසේයි. පූර්වෝක්තද්විකර්මකධාතු යොගය හා ගමනාර්ථ ධාත්වාදියොගයද හැරසෙසු ධාතුන්ගේ යොගයෙහි අකාරිතතන්හි සිටි උක්තකර්තෘ කාරිත විෂයෙහි අනුක්ත කර්තෘවේ, "සූදජෙට්ඨො සූදෙනඔදනං පාචෙති" යනු ඊට නිදසුන්වේ. මෙහි අකාරිතකල "සූදො ඔදනං පචති" යි යොජිත වාක්‍යයෙහි "සූදො"යි සිටි උක්තකර්තෘ, කාරිතවූකල්හි "සූදෙන"යි අනුක්තවේ. "සූදජෙට්ඨො" යි උක්තව අන්‍ය කර්තෘවක් යෙදේ, ඊටහෙතු කර්තෘයයි කියනුලැබේ, සමහරතන්හි කාරිතප්‍රත්‍යය දෙකක් යෙදී හෙතුකර්තෘද දෙකක්යෙදේ, ඉන් එක,හෙතු කර්තෘවක් අනුක්තද එකක් උක්තද වේ, "අමච්චො සූදජෙට්ඨෙන සූදෙන ඔදනං පාචෙති" යනු ඊටඋදාහරණයි.

"කුසූලො සයමෙව භිජ්ජතෙ"යන්නෙන් කර්මකර්තෘ දක්වනලදී, අන්‍ය ප්‍රයොගයක් නොමැතිව යමක් ඉබේ සිඬවේනම් කර්මවූයේද කර්තෘවූයේද එකම බැවින් ඊට කර්මකර්තෘයයි කියනුලැබේ. මෙහි "භිජ්ජතෙ" යන ක්‍රියාවට කර්මවූයේද කර්තෘවූයේද "කුසූලො" යනුයි. එබැවින් ඒ කර්මකර්තෘ වේ, කර්මකර්තෘ ක්‍රියාව වනාහි කර්මකාරකයෙන්ම යෙදේ.

---

අනතුරුව අනුක්තකර්තෘභෙදය" දක්වනු පිණිස "අවුත්ත කත්තා" යනාදිය කීහු, එහි උදාහරණ පිළිවෙළ පෙර පරිද්දෙන් දතයුතුයි. ප්‍රධාන අප්‍රධාන ක්‍රියා සම්බන්ධයෙක්හි කර්තෘහුගේ උක්ත බව හා අනුක්තබව යන දෙකම වියහැකිවීනම් එහි ප්‍රධාන ක්‍රියාව බලා අනුක්ත බවමුත් අප්‍රධානක්‍රියාවබලා උක්තබව නොවේයයි කියනු ලැබේ. "බ්‍රාහ්මණෙන භුත්වා සුපීයතෙ" යනු ඊට උදාහරණයි. ඉක්බිතිව කරණ කාරකාදිය දක්වනු පිණිස "වුත්තකරණං යථා" යනාදිය කීහු, එහි පිළිවෙළින් උදාහරණ දක්වන්නාහු "ජිතානරුක්ඛො එරසු" යනාදියකීහු, මෙහි "ජිතනරුක්ඛො"යනු කරණාර්ථයෙහිවූ සමාසය බැවින් "එරසු" යනු එයින් උක්තවූ ප්‍රථමායි, "පහරණං ආයුධං" යනතන්හිද "පහරණං"යනු කරණ කාරකයෙහි යු ප්‍රත්‍යයෙව නිෂ්පන්න කෘදන්තයක් බැවින් "ආයුධං" යනු එයින් උක්තයි. සෙස් සද මෙසේයි.

මෙහි දක්වනලද ෂට්කාරකය හා සාමි්‍යපියද සමාසතද්ධිතාඛ්‍යාත ක්‍රිතකයන්ගෙන් උක්තානුක්තව යෙදෙන පරිදි දූනගණු පිණිස පිළිවෙළින් උදාහරණ දක්වනුලැබේ.

සමාසයෙන්

| උක්ත. | අනුක්ත. |
|---|---|
| කම්-ආගතසමණො විහාරෙ. | ආගතා සමණා යං (විහාරං.) |
| කත්තෘ-ජිතින්ද්‍රියො මුනි. | ජිතානි ඉන්ද්‍රියානි යෙන (මුනිනා.) |
| කරණ-ජිතනරුක්ඛො එරසු. | ජිතෙනා රුක්ඛා යෙන (එරසුනා.) |
| ස:ප-දින්නසුඞ්කො රාජා. | දින්නො සුඞ්කො යස්ස (රඤ්ඤො.) |
| අ:ප-නිග්ගතජනො ගාමො. | නිග්ගතා ජනා යස්මා (ගාමා.) |
| ආ:ස-මත්තමාතඞ්ගං වනං. | මත්තා මාතඞ්ගා යස්මිං (වනෙ). |
| සාමි-දසබලො භගවා. | දසබලානි යස්ස (භගවතො). |

තද්ධිතයෙන්

| | |
|---|---|
| කම්-සාකිකො ආහාරො. | * සාකෙන සංසට්ඨො (ආහාරො). |
| කත්තෘ-ආභිධම්මිකො භික්ඛු. | † අභිධම්මං අවෙච්ච අධීතෙ (භික්ඛු). |

* මේ වාක්‍යය තද්ධිතයෙන් අනුක්තකර්මයට උදාහරණ නමුත් "සංසට්ඨො"යන්න කෘදන්ත කර්මකාරක ක්ත ප්‍රත්‍යයෙන් සිද්ධ බැවින් තදපෙක්ෂාවෙන් කර්මය උක්තව ප්‍රථමාවෙන් යෙදේ, අභිකක්හුගේ අපෙක්ෂාවක් නැතිබැවින් විතියාව නොවේ.

† මේ වාක්‍යය අනුක්ත කර්තෘට උදාහරණවුවද "අධීතෙ"යන ආඛ්‍යාන කර්තෘකාරක ක්‍රියාවට අධ්‍යාහාරවශයෙන් උක්තකර්තෘව යෙදේ. එසේ නමුත් පූර්වෝක්ත වාක්‍යයෙහි හා මේහිද තද්ධිතයෙහි කරණලද යමක් නැති බැවින් තද්ධිතයෙන් අනුක්තයේ.

**සං:න**-දක්ඛිණෙය්‍යො භික්ඛු.   දක්ඛිණා දීයතෙ **යස්ස** (**භික්ඛුනො**)
**ඔ:ස**-රුක්ඛවා **දෙසො**.   රුක්ඛා **යස්මිං** (**දෙසෙ**) සන්ති.
**සාමි**-වෙණිකො ගන්ධබ්බො.   වීණා **අස්ස** (**ගන්ධබ්බස්ස**) සිප්පං.

**ආඛ්‍යාතයෙන්**

**කම්**- සුදෙන **ඔදනො** පච්චතෙ   සුදො **ඔදනං** පචති
**කත්‍රෘ**-**සුදො** ඔදනං පචති   **සුදෙන** ඔදනො පච්චතෙ

**කිතකයෙන්**

**කම්**-බුද්ධෙන දෙසිතො **ධම්මො**.   බුද්ධො **ධම්මං** දෙසිතවා.
**කත්‍රෘ**-පුප්ඵඞ්කාරෙ **පුමා**   **පුමුනා** පුප්ඵං කතං.
**කා:ණ**-පහරණං **ආයුධං**   **යෙන** (**ආයුධෙන**) පහරන්ති.
**සං:න**-සම්පදානං **බුද්ධො**.   **යස්ස**(**බුද්ධස්ස**)සම්මාපදීයතෙ
**අ:න**-භීමො **රක්ඛසො**   **යස්මා**(**රක්ඛසා**) භායන්ති.
**ඔ:ස**- ආසනං **පීඨං**   **යස්මිං** (**පීඨෙ**) ආසන්ති

"සමාසො හොති සබ්බත්" යනාදීන් සමාසය කර්මාදි ෂට් කාරකයෙහි හා සාම්‍යර්ථයෙහිද කිතකය සාම්‍යර්ථය හැර ෂට්කාරකයෙහිද තද්ධිතය කරණ අපාදන දෙක හැර අන්‍යපඤ්චකයෙහිද ආඛ්‍යාතය කර්තෘ කර්ම කාරකයන්හිද උක්තානුක්තව පෙරදක්වනලද පිළිවෙළින් මෙසේ යෙදේයයි කියනලදී. මේ දක්වන ලද්දේ උක්තානුක්තයන් සම්බන්ධ උපායමාත්‍රයෙකි, අනිකුත් සියල්ලද මේනයින් දතයුතු.

**උක්තානුක්ත ග්‍රන්ථ පදවිවරණය**

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු